# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2088/49 - 2018 සැප්තැම්බර් මස 12 වැනි බදාදා - 2018.09.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදනය

### මධ්‍යම පළාතේ පළාත් සභාව

මධ්‍යම පළාත් සභාවේ 2018 අංක 06 දරන සමුපකාර සමිති ප්‍රඥප්තිය

සමුපකාර සමිති සංවර්ධනය කිරීම සඳහා විධි විධාන සැලැස්වීම පිණිස ද, සමුපකාර සමිති පිහිටුවීමට, ලියාපදිංචි කිරීමට සහ පරිපාලනය කිරීමට අදාළ කරුණුද ඊට සම්බන්ධ අනුශාංගික කරුණු සඳහා විධි විධාන සැලැස්වීම පිණිස සහ මධ්‍යම පළාත් සභාවේ 1993 අංක 04 දරන සමුපකාර සමිති (සංශෝධන) ප්‍රඥප්තියෙන් සංශෝධිත 1990 අංක 10 දරන සමුපකාර සමිති ප්‍රඥප්තිය අවලංගු කිරීම සඳහා ද වූ ප්‍රඥප්තියකි. මෙම ප්‍රඥප්තිය 1972 අංක 05 දරන සමුපකාර සමිති පනතට අනනුකූල වේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මධ්‍යම පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

01 මේ ප්‍රඥප්තිය මධ්‍යම පළාතේ පළාත් සභාවේ 2018 අංක 06 දරන සමුපකාර සමිති ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

### I වැනි පරිච්ඡේදය

*රෙජිස්ට්‍රාර්, නියෝජ්‍ය, ජ්‍යෙෂ්ඨ සහකාර හා සහකාර රෙජිස්ට්‍රාර්වරුන් පත්කිරීම හා එම අයට පැවරෙන බලතල*

රෙජිස්ට්‍රාර්, නියෝජ්‍ය, ජ්‍යෙෂ්ඨ සහකාර හා සහකාර රෙජිස්ට්‍රාර්වරුන් පත්කිරීම හා සමුපකාර සංවර්ධන කොමසාරිස්ගේ හා ඒ කොමසාරිස්ට සහයවීම සඳහා පත් කරන ලද තැනැත්තාගේ බලතල.

02 (1) ශ්‍රී ලංකාවේ මධ්‍යම පළාත සඳහා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයෙකු හා අවශ්‍ය විය හැකි යම් නියෝජ්‍ය, ජ්‍යෙෂ්ඨ සහකාර හෝ සහකාර රෙජිස්ට්‍රාර්වරුන් ගණනක් පත් කරනු ලැබිය හැකිය.

(2) මේ ප්‍රඥප්තිය යටතේ හෝ එය යටතේ සාදනු ලැබූ යම් රීති යටතේ රෙජිස්ට්‍රාර්වරයෙකු සතු සියළුම බලතල හෝ ඉන් යමක් යම් නියෝජ්‍ය, ජ්‍යෙෂ්ඨ සහකාර හෝ සහකාර රෙජිස්ට්‍රාර්වරයෙකු වෙත මධ්‍යම පළාතේ පළාත් සභාවේ සමුපකාර විෂයභාර අමාත්‍යවරයා විසින් සාමාන්‍ය හෝ විශේෂ ආඥාවන් මඟින් පැවරිය හැකිය.

(3) මධ්‍යම පළාත් ආණ්ඩුකාරවරයා විසින් පත් කරනු ලබන සමුපකාර සංවර්ධන කොමසාරිස් වශයෙන් හෝ සමුපකාර සංවර්ධන කොමසාරිස් වශයෙන් තත් කාලයෙහි ක්‍රියා කිරීමට පත් කරනු ලබන තැනැත්තාට මේ ප්‍රඥප්තිය යටතේ සාදනු ලැබූ හෝ ලැබූ ඇතැයි සැළකෙන

1A - PG 4214— 87 (2018/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

යම් රීතිවලින් සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් වෙත පවරනු ලැබූ බලතලම තිබිය යුතු අතර ඔහු විසින් ඒ බලතල ක්‍රියාවෙහි යෙදවිය හැකිය.

(4) සමුපකාර සංවර්ධන කොමසාරිස්ට සහය වීම පිණිස පත් කරනු ලබන එක් එක් තැනැත්තාට මේ ප්‍රඥප්තිය යටතේ හා ඒ යටතේ සාදනු ලැබූ හෝ සාදනු ලැබ ඇතැයි සැළකෙන යම් රීති යටතේ රෙජිස්ට්‍රාර් සතු බලතල අතුරින් මධ්‍යම පළාතේ පළාත් සභාවේ සමුපකාර විෂය භාර අමාත්‍යවරයා විසින් මේ වගන්තිය යටතේ කරනු ලබන යම් සාමාන්‍ය හෝ විශේෂ ආඥාවක නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි බලතල තිබිය යුතු අතර ඒ එක් එක් තැනැත්තා විසින් ඒ බලතල ක්‍රියාත්මක කළ හැකිය.

## II වැනි පරිච්ඡේදය

### *ලියාපදිංචි කිරීම*

ලියාපදිංචි කරනු ලැබිය හැකි සමිති

03 (1) මෙහි මින්මතු අඩංගු කරනු ලබන විධිවිධාන වලට යටත්ව

(අ) ස්වකීය සාමාජිකයන්ගේ ආර්ථික, අධ්‍යාපනික, සමාජයීය සහ සංස්කෘතික සුභසාධනයට හේතුවන නිශ්චිත සේවාවන් සමුපකාර ප්‍රතිපත්තිවලට අනුකූලව සැලසීම ස්වකීය අරමුණ වශයෙන් ඇත්තාවූ සමිතියක්;

(ආ) (අ) වන ජේදයේ සඳහන් සමිතිවල - ක්‍රියාකාරිත්වය පහසු කිරීමේ අරමුණ ඇතිව පිහිටුවන ලද ස්වකීය සාමාජිකයන් වශයෙන් ලියාපදිංචි සමිතිවලින් සමන්විත සමිතියක්;

සීමාසහිත වගකීමක් සහිතව හෝ රහිතව ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබිය හැකිය. එසේ වුවද ලියාපදිංචි සමිතියක් සාමාජිකයෙකු වන්නාවූ සමිතියක වගකීම සීමාසහිත වන්නේය.

ලියාපදිංචි කිරීමේ කොන්දේසි

04 (1) (අ) සාමාජිකයන්ගෙන් පමණක් සමන්විත වන අවස්ථාවක, සාමාජිකත්වය වයස අවුරුදු දහඅටට වැඩි වූද, සමිතිය ක්‍රියාත්මක වන ප්‍රදේශය ඇතුළත පදිංචිව සිටින්නාවූ හෝ සේවයෙහි නියුක්තව සිටින්නාවූ හෝ නිශ්චල දේපල අයත්ව සිටින්නා වූද, සමිතිය විසින් ඉටු කරනු ලබන සේවාවන් උපයෝගී කිරීමේ ශක්නුතාවය ඇත්තාවූද, සාමාජිකයන් යටත් පිරිසෙයින් විසි පස් දෙනෙකුගෙන් සමන්විත නොවන්නේ නම් හෝ

(ආ) ලියාපදිංචි සමිති වලින් පමණක් එය සමන්විත වන්නේ නම් සහ යටත් පිරිසෙයින් සාමාජිකයන් පස් දෙනෙකුවත් ඊට නොමැති නම්

(ඇ) (i) සමිතිය විසින් නිරතවීමට යෝජනා කරනු ලබන කටයුතු ආර්ථික වශයෙන් යෝග්‍ය බවට,

(ii) සමිතිය විසින් යෝජිත අතුරු ව්‍යවස්ථාව මේ ප්‍රඥප්තිය හෝ ඒ යටතේ සාදන ලද යම් රීති වල විධිවිධාන වලට අනනුකූල නොවන බවට ,

රීති වලින් නියම කරනු ලබන ආකාරයෙන් වාර්තාවක් හා නිර්දේශයක් සමිතිය විසින් ලබාගෙන නොමැති නම්

(ඈ) යෝජිත අතුරු ව්‍යවස්ථා තත් කාර්ය සඳහා යථා පරිදි කැඳවන ලද මහා සභා රැස්වීමකදී රෙජිස්ට්‍රාර්වරයාගේ හෝ ඔහුගේ නියෝජිතයකුගේ සහභාගිත්වයෙන් සම්මත කරනු ලැබ නොමැති නම්

(ඉ) සමිතියේ කාරක සභාවේ සාමාජිකයන් අතරින් යටත් පිරිසෙයින් දෙදෙනෙකුවත් වයස අවුරුදු දහඅටත් තිස්පහත් අතර විය යුතු තැනැත්තන් වන බවට විධානයක් සමිතියේ යෝජිත අතුරු ව්‍යවස්ථාවල ඇතුළත් නොවන්නේ නම් සහ ඒ අනුව සමිතියේ කාරක සභාවට පත්වූ පසුව අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නිල කාලය තුළදී වයස අවුරුදු තිස්පහ

ඉක්මවූ විට කාරක සභාවේ සාමාජිකත්වයට නුසුදුසු බව යෝජිත අතුරු ව්‍යවස්ථාවේ ඇතුලත් නොවන්නේ නම්

(ඊ) ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය අත්සන් කරන සියළු සාමාජිකයන් විසින්, තම සාමාජිකත්වය සම්බන්ධයෙන් වූ ගෙවීම් සම්පූර්ණ කොට නොමැති නම්

(උ) ලියාපදිංචි කිරීමේ කාර්ය සඳහා රෙජිස්ට්‍රාර්වරයා විසින් නියම කරනු ලබන සියලු තොරතුරු සැපයීමට ඒ සමිතිය විසින් පැහැර හැර ඇත්නම්

(ඌ) රීති වලින් නියම කරනු ලැබිය හැකි ලියාපදිංචි කිරීමේ ගාස්තුව ගෙවා නොමැති නම්

(එ) සමිතියේ අතුරු ව්‍යවස්ථාවේ සඳහන් පරිදි සාමාජිකත්වය සම්පූර්ණ වීමෙන් පසුව සමිතියේ නිලවරණ වලට ඉදිරිපත්වීමට හෝ නිලතල වලට පත්වීමට සාමාජිකයින් විසින් වෙනත් සපුරා ගත යුතු සුදුසුකම් අතුරු ව්‍යවස්ථාව මඟින් නියම කර නැත්නම්

(ඒ) ජාතික සමුපකාර ප්‍රතිපත්ති ප්‍රකාශය සහ යහපාලනය සඳහා වන භාවිත කේත සංග්‍රහ වලට අනුකූලව කාරක සභාව කටයුතු කරන බවට අතුරු ව්‍යවස්ථාවේ ඇතුලත් නොවන්නේ නම්,

කිසිම සමිතියක් මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කරනු නොලැබිය යුතුය.

(2) (අ) මීට පෙර පනතක් හෝ ප්‍රඥප්තියක් යටතේ ලියාපදිංචි අතුරු ව්‍යවස්ථාවක ඉහත 1 වන උප වගන්තියේ ඉ, එ, ඒ උප වගන්ති යටතේ දක්වා ඇති කොන්දේසි හා නියමයන් අන්තර්ගත නොවේ නම් ඒවා සමිති අතුරු ව්‍යවස්ථාවට ඇතුලත් කිරීමට රෙජිස්ට්‍රාර්වරයා විසින් සමිතිවල කාරක සභාව සහ ලේකම්වරුන් වෙත නියෝග කළ යුතු අතර එම නියෝගය අනුව ඔවුන් කටයුතු කළ යුතුය.

(ආ) මේ වගන්තියේ කාර්යයන් සඳහා ඉහතින් වූ විධිවිධානවල සඳහන් කොන්දේසි සෑහීමකට පත්කර ඇති බවට යම් ප්‍රශ්නයක් පැන නඟින අවස්ථාවක රෙජිස්ට්‍රාර් විසින් ඒ ප්‍රශ්නය සම්බන්ධයෙන් තීරණය කළ යුතු අතර ඔහුගේ තීරණය අවසානාත්මක විය යුතුය.

(ඇ) මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබූ සීමාසහිත වගකීම්වලින් යුතු සෑම සමිතියකම නමෙහි "සීමාසහිත" යන වචනය මුල් වචනය විය යුතුය. එහි දෙමළ හෝ ඉංග්‍රීසි සමාන වචනය ඒ නමෙහි කොටසක් විය යුතුය.

05 (1) ලියාපදිංචි කිරීමේ කාර්යය සඳහා නියම කරනු ලබන යම් ආකාරයක් අනුව වූ ඉල්ලුම් පත්‍රයක් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය. ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කිරීම

(2) ඒ ඉල්ලුම් පත්‍රය;

(අ) යම් සමිතියක සාමාජිකයන් ලියාපදිංචි කරනු ලැබූ සමිතිවලින් යුක්ත නොවන විටක 4 (1) (අ) යන වගන්තියේ නියමයන් අනුව සුදුසුකම් ලත් තැනැත්තන් යටත් පිරිසෙයින් විසිපස් දෙනෙකු විසින් අත්සන් කරනු ලැබිය යුතුය ; තවද

(ආ) ලියාපදිංචි කළ සමිතියක් සාමාජිකයකු වන සමිතියක් සම්බන්ධයෙන් වූ විට ලියාපදිංචි කළ එවැනි සෑම සමිතියක් වෙනුවෙන් රීති වලින් නියම කරනු ලැබිය හැකි පරිදි බලය පවරනු ලැබූ තැනැත්තකු විසින් අත්සන් කරනු ලැබිය යුතුය.

(3) ඉල්ලුම් පත්‍රය සමඟ;

(අ) යෝජිත අතුරු ව්‍යවස්ථාවල පිටපත් දෙකක් ;

(ආ) 4 (1) (ඇ) අනුව සමිතියේ නිරතවීමට යෝජනා කරනු ලබන ආර්ථික කටයුතු වලට අදාල යෝග්‍යතා වාර්තාවක් ;

(ඇ) සමිතිය ලියාපදිංචි කිරීම පිණිස යෝජනාව සම්මත කරනු ලැබූ මහා සභා රැස්වීමේ වාර්තාවේ සහ පැමිණීම සම්බන්ධයෙන් විස්තර සහ අතුරු ව්‍යවස්ථාව සම්මත කරගනු ලැබූ වාර්තාවේ සහතික පිටපත් ;

(ඈ) ඉල්ලුම්පත්‍රය අත්සන් කරන සාමාජිකයන් විසින් සාමාජික ගාස්තු ගෙවනු ලැබීම ස්ථිර කෙරෙන සහ ඒ මුදල් එම කාරක සභාවේ භාරකාරීත්වයෙහි පවතින බවට සමිතියේ කාරක සභාව විසින් සහතිකයක් ;

ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

**ලියාපදිංචි කිරීම**

06 (අ) සමිතියක් විසින් මේ ප්‍රඥප්තිය හා රීතිවල විධිවිධාන අනුව ක්‍රියාකර ඇති බවට, ඒ සමිතිය නියුක්ත වීමට අදහස් කරන කටයුතු ආර්ථික වශයෙන් සත්‍ය බවට හා සමිතියේ යෝජිත අතුරු ව්‍යවස්ථා, මේ ප්‍රඥප්තියට හා රීතිවලට පටහැනි නොවන බවට රෙජිස්ට්‍රාර් සෑහීමකට පත්වන්නේ නම්, තමා සුදුසු යයි සලකතොත් ඔහු විසින් ඒ සමිතිය හා එහි අතුරු ව්‍යවස්ථා ලියාපදිංචි කළ හැකිය. යම් සමිතියක් ලියාපදිංචි කිරීම රෙජිස්ට්‍රාර් විසින් ප්‍රතික්ෂේප කිරීමට විරුද්ධව අභියාචනයක්, ඒ සම්බන්ධයෙන් සාදනු ලැබූ රීති අනුව අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ හැකි විය යුතුය.

(ආ) සමුපකාර බැංකු හා මූල්‍ය සේවා හෝ රන් භාණ්ඩ උකස් කටයුතු සිදුකිරීමට ලියාපදිංචි අතුරු ව්‍යවස්ථාව මගින් ප්‍රතිපාදන සැලසී ඇත්නම් සමුපකාර සමිති විසින්, සමුපකාර රීති මගින් හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් නියම කරන පරිදි තත්කාලීනව පවතින නීතිරීතිවලට අනුකූලව මූල්‍ය සේවාවන් හා රන්භාණ්ඩ උකස් කටයුතු සිදුකළ යුතුය.

**ලියාපදිංචි කිරීමේ සාක්ෂි**

07 (1) රෙජිස්ට්‍රාර් විසින් අත්සන් කරනු ලැබූ ලියාපදිංචි කිරීමේ සහතිකයක්, ඒ සහතිකයේ සඳහන් සමිතියෙහි ලියාපදිංචි කිරීම අවලංගු කර ඇති බව ඔප්පු කරතහොත් මිස, ඒ සමිතිය යථා පරිදි ලියාපදිංචි කරනු ලැබූ බවට තීරණාත්මක සාක්ෂිය විය යුතුය.

(2) 6 වැනි වගන්තිය යටතේ සමිතියක් ලියාපදිංචි කරනු ලැබූ විට, රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ සමිතිය වෙත ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතුය.

**ලියාපදිංචි කළ සමිතියක අතුරු ව්‍යවස්ථා සංශෝධනය කිරීම.**

08 (1) යම් ලියාපදිංචි කළ සමිතියක් විසින් මේ ප්‍රඥප්තියට හා ඒ යටතේ සාදනු ලැබූ රීතිවලට යටත්ව සමිතියේ නම ප්‍රකාශ කරන අතුරු ව්‍යවස්ථාව ඇතුළු සමිතියේ අතුරු ව්‍යවස්ථා සංශෝධනය කළ හැකිය.

(2) (අ) ලියාපදිංචි කළ සමිතියක කිසිම අතුරු ව්‍යවස්ථා සංශෝධනයක් ඒ සංශෝධනය මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කරනු ලබන තෙක් වලංගු නොවිය යුතුය. ඒ කාර්යය සඳහා ඒ සංශෝධනයේ පිටපත් දෙකක් රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කළ යුතුය.

(ආ) ලියාපදිංචි සමිතියක අතුරු ව්‍යවස්ථාවක් සම්බන්ධයෙන් වූ කිසිම සංශෝධනයක් 4 (1) (ඇ), (ii) වගන්තියේ සඳහන් වාර්තාවක් සමඟ ඉදිරිපත් කරනු ලබන්නේ නම් මිස, ඒ සංශෝධනය ලියාපදිංචි කරනු නොලැබිය යුතුය.

(3) අතුරු ව්‍යවස්ථාවල යම් සංශෝධනයක් මේ ප්‍රඥප්තියට හෝ රීතිවලට පටහැනි නොවන බවට රෙජිස්ට්‍රාර් සෑහීමකට පත්වන්නේ නම්, තමා සුදුසු යයි සලකතොත් ඔහු විසින් ඒ සංශෝධනය ලියාපදිංචි කළ හැකිය. යම් අතුරු ව්‍යවස්ථා සංශෝධනයක් ලියාපදිංචි කිරීම රෙජිස්ට්‍රාර් විසින් ප්‍රතික්ෂේප කිරීමට විරුද්ධව අභියාචනයක් ඒ සම්බන්ධයෙන් සාදනු ලැබිය හැකි යම් රීති අනුව අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ හැකි විය යුතුය.

(4) සමිතියක නාමයක් වෙනස් කරන සංශෝධනයක් ඒ සමිතියේ හෝ එහි යම් සාමාජිකයන්ගේ හෝ හිටපු සාමාජිකයන්ගේ යම් අයිතිවාසිකමක් හෝ බැඳීමක් කෙරෙහි බල නොපෑ යුතු අතර, එවකට පවත්නා යම් නීති කෘත්‍යයක් එහි අලුත් නාමය යටතේ ඒ සමිතිය විසින් හෝ සමිතියට විරුද්ධව ඉදිරියටත් පවත්වාගෙන යනු ලැබිය හැකිය.

(5) ලියාපදිංචි කල සමිතියක අතුරු ව්‍යවස්ථා සංශෝධනයක් රෙජිස්ට්‍රාර්වරයා විසින් ලියාපදිංචි කරනු ලබන අවස්ථාවක තමා විසින් සහතික කරන ලද ඒ සංශෝධනයේ පිටපතක් ඔහු විසින් සමිතිය වෙත නිකුත් කළ යුතුය. ඒ සංශෝධනය යථා පරිදි ලියාපදිංචි කර ඇති බවට ඒ සංශෝධනය සහතික කරනු ලැබූ පිටපත තීරණාත්මක සාක්ෂිය විය යුතුය. තවද, සමිතියේ නාමය සංශෝධනය වන අවස්ථාවකදී සංශෝධිත නම ඇතුලත් ලියාපදිංචි සහතිකයක් එම සමිතිය වෙත නිකුත් කළ යුතුය.

(6) මේ වගන්තියෙහි "සංශෝධනය" යන්නට අලුත් අතුරු ව්‍යවස්ථාවක් සෑදීම හා අතුරු ව්‍යවස්ථාවක් වෙනස් කිරීම හෝ පරිච්ඡින්න කිරීම ඇතුලත් වේ.

09 (1) ලියාපදිංචි කල සමිතියක් විසින්, කලින් ලබාගත් රෙජිස්ට්‍රාර්ගේ අනුමැතිය ඇතිව හා ඒ සමිතියේ මහා සභා රැස්වීමකට පැමිණ ඡන්දය දීමට සුදුසුකම් ඇති සාමාජිකයන්ගෙන් හෝ නියෝජිතයන්ගෙන් තුනෙන් දෙකක වැඩි සංඛ්‍යාවකගේ ඡන්දයෙන් සම්මත කර ගනු ලබන යෝජනාවකින්;

ලියාපදිංචි කළ සමිතිවල වත්කම් හා බැරකම් ඒකාබද්ධ කිරීම, බෙදීම හා පැවරීම.

(අ) සමිතියේ වත්කම් හා බැරකම් සම්පූර්ණයෙන්ම හෝ ඉන් යම් කොටසක් යම් ලියාපදිංචි කරනු ලැබූ අන්කිසි සමිතියකට පැවරීම හෝ

(ආ) සමිතිය සමිති දෙකක් හෝ ඊට වැඩි ගණනක් වශයෙන් බෙදා වෙන්කර ගැනීම, කළ හැකිය.

(2) යම් ලියාපදිංචි කළ සමිති දෙකක් හෝ ඊට වැඩි ගණනක් විසින්, කලින් ලබාගත් රෙජිස්ට්‍රාර්ගේ අනුමැතිය ඇතිව හා ඒ එක් එක් සමිතියේ මහා සභා රැස්වීමකට පැමිණ ඡන්දය දීමට සුදුසුකම් ඇති සාමාජිකයන්ගෙන් හෝ නියෝජිතයන්ගෙන් තුනෙන් දෙකක වැඩි සංඛ්‍යාවකගේ ඡන්දයෙන් සම්මත කර ගනු ලබන යෝජනාවකින් ඒකාබද්ධවී අලුත් සමිතියක් පිහිටුවා ගත හැකිය.

(3) ලියාපදිංචි කල සමිතියක් විසින් (1) වැනි උප වගන්තිය හෝ (2) වැනි උප වගන්තිය යටතේ සම්මත කරගනු ලබන යෝජනාවක අවස්ථාවෝචිත පරිදි පැවරීම, බෙදා වෙන්කර ගැනීම හෝ ඒකාබද්ධ කිරීම පිළිබඳ සියලු විස්තර අඩංගු විය යුතුය.

(අ) යෝජිත පැවරීමේ, බෙදීමේ හෝ ඒකාබද්ධවීමේ ආර්ථික යෝග්‍යතාව සම්බන්ධයෙන් රීති වලින් නියම කරනු ලබන තැනැත්තකුගෙන් හෝ ආයතනයකින් නිර්දේශ කිරීමේ වාර්තාවක් ලබාගෙන නොමැති නම් ;

(ආ) ලියාපදිංචිය සහතිකය අවස්ථාවෝචිත පරිදි බෙදා ඇත්තේ යම් සමිතිවලට ද නැතහොත් ඒකාබද්ධ වී ඇත්තේ යම් සමිති සමග ද, ඒ සමිතිවල අතුරු ව්‍යවස්ථා ප්‍රඥප්තියේ හෝ ඒ යටතේ සාදන ලද යම් රීතියක විධි විධානවලට අනුකූල නොවන බව පළකෙරෙන වාර්තාවක් 4 වන වගන්තියේ කාර්යය සඳහා වූ ආයතනයකින් හෝ නාමෝද්දිෂ්ඨ තැනැත්තකුගෙන් ලබාගෙන නොමැති නම් ;

ස්වකීය වත්කම් හා බැරකම් වෙනත් යම් ලියාපදිංචි සමිතියකට පැවරීමට හෝ එම සමිතිය, සමිති දෙකකට හෝ වැඩි ගණනකට බෙදීමට හෝ වෙනත් ලියාපදිංචි සමිතියක් සමග ඒකාබද්ධවීමට රෙජිස්ට්‍රාර්වරයා විසින් අනුමැතිය දෙනු නොලැබිය යුතුය.

(4) ලියාපදිංචි කල සමිතියක් විසින් එවැනි යම් යෝජනාවක් සම්මත කරගනු ලැබූ අවස්ථාවක, ඒ සමිතිය විසින් සමිතියේ සියලු සාමාජිකයන් හා ණය හිමියන් වෙත ලිඛිත දැන්වීමක් කළ යුතු අතර, පටහැනි අතුරු ව්‍යවස්ථා හෝ ගිවිසුමක් ඇත ද එය නොතකා යම් සාමාජිකයෙකු ණය හිමියකු වෙත ඒ දැන්වීම භාරදීමේ දිනයෙන් පසු එක් මාසයක කාලය තුළ අවස්ථාවෝචිත පරිදි තම කොටස්, තැන්පතු හෝ ණය මුදල් ඉල්ලා අස්කර ගැනීමට තෝරා ගැනීමේ බලය ඒ සාමාජිකයාට හෝ ණය හිමියාට තිබිය යුතුය.

(5) (4) වැනි උප වගන්තියේ නිශ්චිතව සඳහන් කාල සීමාව ඇතුලත තම තෝරා ගැනීමේ බලය ක්‍රියාවෙහි නොයොදවන යම් සාමාජිකයෙකු හෝ ණය හිමියකු විසින් යෝජනාවෙහි අඩංගු කරුණුවලට කැමැත්ත දක්වනු ලැබූ ලෙස සැලකිය යුතුය.

(6) ලියාපදිංචි කළ සමිතියක් විසින් මේ වගන්තිය යටතේ සම්මත කරගත් යෝජනාවකට යම් වත්කම් හා බැරකම් පැවරීමක් ඇතුළත්වන අවස්ථාවක, තත් කාලයෙහි බලපවත්නා යම් නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද එය නොතකා ඒ සම්මත කරගත් යෝජනාව තවදුරටත් තහවුරු කිරීමක් නොමැතිව පැවරුම්ලාභීන් වෙත ඒ වත්කම් හා බැරකම් සතු කිරීමේ ප්‍රමාණවත් පැවරීමක් ලෙස සළකනු ලැබිය යුතුය.

ඇතැම් අවස්ථාවලදී ලියාපදිංචි කළ සමිතිවල ලියාපදිංචි කිරීමේ සහතික අවලංගු කිරීම.

10 (1) ලියාපදිංචි කළ සමිතියක වත්කම් හා බැරකම් සියල්ලම වෙනත් ලියාපදිංචි කළ සමිතියකට 9 වැනි වගන්තියේ විධි විධාන අනුව පවරනු ලැබූ අවස්ථාවක, පළමුව සඳහන් වූ සමිතියේ ලියාපදිංචි කිරීම අවලංගු විය යුතු අතර ඒ සමිතිය විසුරුවා හරිනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතුවාක් මෙන්ම සංස්ථාවක් වශයෙන් පැවතීම ද අවසන් විය යුතුය.

(2) ලියාපදිංචි කළ සමිති දෙකක් හෝ ඊට වැඩි ගණනක් 9 වැනි වගන්තියේ විධි විධාන අනුව අලුත් සමිතියක් වශයෙන් ඒකාබද්ධ කරනු ලැබූ අවස්ථාවක ඒකාබද්ධ කරනු ලැබූ ඒ එක් එක් සමිතිය ලියාපදිංචි කරනු ලැබූ දිනයෙහි අවලංගු විය යුතු අතර ඒ එක් එක් සමිතිය විසුරුවා හරිනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතුවාක් මෙන්ම සංස්ථාවක් වශයෙන් පැවතීමද අවසන් විය යුතුය.

(3) ලියාපදිංචි කල සමිතියක් 9 වැනි වගන්තියේ විධි විධාන අනුව සමිති දෙකකට හෝ වැඩි ගණනකට වෙන්ව බෙදීයන අවස්ථාවක ඒ සමිතියේ ලියාපදිංචි කිරීම අලුත් සමිති ලියාපදිංචි කිරීමෙන් පසු අවලංගු විය යුතු අතර ඒ සමිතිය විසුරුවා හරිනු ලැබ ඇති ලෙස සළකනු ලැබිය යුතුවාක් මෙන්ම සංස්ථාවක් වශයෙන් පැවතිමද අවසන් විය යුතුය.

## III වැනි පරිච්ඡේදය

### *ලියාපදිංචි කරනු ලැබූ සමිතිවල සාමාජිකයන් සහ ඔවුන්ගේ අයිතිවාසිකම් හා වගකීම්*

අයවිය යුතු ගෙවීම් කරනු ලබන තෙක් සාමාජිකයින් විසින් අයිතිවාසිකම් පාවිච්චි නොකළ යුතු බව.

11 (1) සාමාජිකත්වය සම්බන්ධයෙන් රීති වලින් හෝ අතුරු ව්‍යවස්ථා වලින් නියම කරනු ලැබිය හැකි යම් ගෙවීමක් තමා විසින් කරනු ලැබ ඇත්නම් මිස හෝ කරනු ලබන තෙක් නැතහොත් සමිතියෙහි එසේ නියම කරනු ලැබිය හැකි යම් සම්බන්ධතාවක් අත්කර ගනු ලැබ ඇත්නම් මිස හෝ අත්කරගනු ලබන තෙක් ලියාපදිංචි කල සමිතියක කිසිම සාමාජිකයකු විසින් සාමාජිකයකුගේ අයිතිවාසිකම් පාවිච්චි නොකළ යුතුය.

(2) සමිතියක සාමාජිකයන්ගේ වගකීම සීමාසහිත වන අවස්ථාවක, ලියාපදිංචි සමිතියක් නොවන කිසිම සාමාජිකයෙකු විසින් සමිතියේ කොටස් ප්‍රාග්ධනයෙන් දරනු ලබන පංගුව රීති මඟින් නියම කරනු ලබන පරිදි පහෙන් එකක උපරිමයකට යටත්විය යුතුය.

කොටස් මිලට ගැනිම සඳහා ගෙවීම් ආකාරය.

(3) ලියාපදිංචි සමිතියක කොටසක අවම වටිනාකම රු.100.00 කට නොඅඩු විය යුතුය. යම් ලියාපදිංචි සමිතියක කොටසක වටිනාකම මහාසභාවේ කැමැත්ත පරිදි වැඩි කරනු ලැබිය හැකිය. සාමාජිකත්වය සඳහා යම් කොටසක් මිළට ගැනීමට කොටසේ වටිනාකමෙන් දහයෙන් එකකට නොඅඩු මුදලක් ගෙවීමෙන් ආරම්භ කළ හැකි අතර ඒ මූලික ගෙවීමේ දින සිට එක් වර්ෂයක් ඇතුළත කොටසේ සම්පූර්ණ වටිනාකම ගෙවා අවසන් කරනු ලැබිය යුතුය. කොටසක සම්පූර්ණ වටිනාකම එක් වාරිකයකින් ද ගෙවනු ලැබිය හැකිය.

(4) (අ) සාමාජිකත්වයට බඳවාගත් දින සිට එක් වර්ෂයක් ඉකුත්වූ ද එක් සම්පූර්ණ කොටසක වටිනාකම ගෙවා නිම කළාවූ ද සාමාජිකයෙක් පූර්ණ සාමාජිකයෙක් ලෙස සලකනු ලැබිය යුතුය. එකී පූර්ණ සාමාජිකත්වය ලැබෙන තෙක් ඡන්දය දීමේ අයිතිය හෝ ධූර දැරීමේ අයිතිය සාමාජිකයකු විසින් භුක්ති විඳිනු නොලැබිය යුතුය.

(ආ) එතෙකුදු වුවත් මේ ප්‍රඥප්තියේ 4 (1) (අ), 4 (1) (ආ), 5 (1) සහ (2) වගන්ති වලින් අනුදත් පරිපාටිය යටතේ සමිතියක් අලුතින් ලියාපදිංචි කිරීමට රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉල්ලුම් කරන පුද්ගලයින් සඳහා මෙය බල නොපැවැත්විය යුතුය.

ඡන්දය දීමේ සුදුසුකම්.

(5) පූර්ණ සාමාජිකත්වය ලබා ගැනිමෙන් පසුව පමණක් ලියාපදිංචි සමිතියක ඕනෑම රැස්වීමකදී ඡන්දය දීමට සහ නිලයකට තෝරා පත්කරනු ලැබීමට සාමාජිකයෙකුට හිමිකම් ඇත්තේය.

(6) පාර්ලිමේන්තුවේ, පළාත් සභාවක, මහ නගර සභාවක, නගර සභාවක හෝ ප්‍රාදේශිය සභාවක මන්ත්‍රීවරයෙකු වන කිසිම තැනැත්තෙකු ලියාපදිංචි සමුපකාර සමිතියක කාරක සභාවේ සාමාජිකයෙකු වශයෙන් තෝරා පත්කරගනු ලැබීමට හෝ තවදුරටත් එලෙස ධූරය දැරීමට සුදුස්සෙකු නොවන්නේය. නුසුදුසුකම්.

(7) යම් තැනැත්තෙක්, තෝරා පත්කර ගන්නා දිනයේ දී, සාමාජිකත්වය ලියාපදිංචි සමිති වලින් සමන්විත වන වෙනත් යම් ලියාපදිංචි සමිතියක සභාපතිව සිටින්නේ නම්, ඒ තැනැත්තා, සාමාජිකත්වය ලියාපදිංචි සමිතිවලින් සමන්විත වන පළමු සඳහන් සමිතියේ පරමාර්ථවලට සමාන නොවන පරමාර්ථ ඇත්තා වූ ලියාපදිංචි සමිතියක සභාපති ලෙස තෝරා පත්කර ගනු ලැබීමට නුසුදුස්සකු වන්නේය. සභාපතිවරයා ලෙස තෝරාපත් කිරීම සඳහා නුසුදුසුකම්.

12 (1) ලියාපදිංචි කළ සමිතියක් විසින් සමිතියේ අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව ව්‍යාපාර කටයුතු කරගෙනයාම සඳහා ගිවිසුමකට එළඹෙන සමිතියේ සාමාජිකත්වය ලබා ගැනීමට සුදුසුකම් නොමැති කවර හෝ පුද්ගලයකු ආශ්‍රිත සාමාජිකයකු වශයෙන් ඇතුළත් කරගත හැක. ආශ්‍රිත සාමාජිකයන්.

(2) ආශ්‍රිත සාමාජිකයකුට සමිතියේ වත්කම්වල හෝ ලාභවල කවර ආකාරයේ හෝ කොටසකට හෝ සමිතියේ කටයුතු කරගෙන යාමෙහිලා යම් ඡන්ද බලයකට හිමිකම් නොලැබිය යුතුය.

13 යම් ලියාපදිංචි කළ සමිතියක සාමාජිකයකු වශයෙන් යථා පරිදි ඇතුළත්කර ගනු ලැබූ යම් තැනැත්තකුගේ බාල වයස හෝ ඔහු නිසි වයසට නොපැමිණීම මේ ප්‍රඥප්තිය යටතේ හෝ මේ ප්‍රඥප්තිය යටතේ සාදන ලද රීති යටතේ ඔහු විසින් ලියා අත්සන් කරනු ලැබීම අවශ්‍ය නීත්‍යානුකූල ලේඛනයක් ලියා අත්සන් කිරීමට හෝ දෙනු ලැබීම් අවශ්‍ය නිදහස් කිරීමක් වීමට ඔහුට බාධාවක් නොවිය යුතුය. තවද එවැනි යම් තැනැත්තකු විසින් සමිතියක් සමඟ අතිකර ගනු ලැබූ යම් ගිවිසුමක් අවලංගු කිරීම සඳහා හෝ මඟ හරිනු පිණිස ඒ කරුණු හේතුවක් නොවිය යුතුය. බාල වයස්කරුවන් වන සාමාජිකයින් විසින් සමිති සමඟ ඇතිකර ගනු ලබන ගිවිසුම්.

එමෙන්ම එවැනි යම් තැනැත්තෙකු විසින් ප්‍රධාන පාර්ශවකරුවකු හෝ ඇපකරුවෙකු වශයෙන් සමිතියක් සමඟ ඇතිකරගත් එවැනි යම් ගිවිසුමක් ඔහුගේ බාල වයසට හෝ නිසි වයසට නොපැමිණීම නොතකා ඒ තැනැත්තා විසින් හෝ ඒ තැනැත්තාට විරුද්ධව නීතිය අනුව ක්‍රියාත්මක කළ හැකි විය යුතුය.

14 ලියාපදිංචි කළ සමිතියක යම් නිලධාරියෙකු පත්කිරීමෙහි ලා වූ යම් දෝෂයක් හෝ ඔහු තෝරා පත්කර ගැනිම සඳහා වූ යම් නුසුදුසුකමක් තදන්තරව සොයා ගැනීම ඒ සමිතිය වෙනුවෙන් ඒ නිළධාරියා විසින් ඇතිකර ගනු ලැබූ යම් ගිවිසුමක් අවලංගු කිරීම හෝ මඟහැරීම සඳහා හේතුවක් නොවිය යුතුය. සමිතිවල නිලධරයන් විසින් ඇතිකර ගනු ලබන ගිවිසුම්.

15 යම් මූලික සමිතියක සාමාජිකයෙකුට සමිතියේ කටයුතු පවත්වාගෙන යාමෙහි ලා එක් ඡන්දයකට වැඩියෙන් නොතිබිය යුතුය. සාමාජිකයින්ගේ ඡන්ද.

එසේ වුවද ඡන්ද සම සමව බෙදුනහොත් සභාපතිට තීරක ඡන්දයක් තිබිය යුතුය.

16 (1) යම් මූලික සමිතියක සාමාජිකයෙකු විසින් ඒ සමිතියේ යම් රැස්වීමකදී පෞද්ගලිකව හැර තම ඡන්දය පාවිච්චි නොකළ යුතුය. ඡන්ද පාවිච්චි කිරීමේ ආකාරය.

එසේ වුවද, නියෝජිතයන් මාර්ගයෙන් ඡන්දය දීමට සමිතියේ අතුරු ව්‍යවස්ථා යටතේ විධි විධාන සළස්වා ඇති අවස්ථාවක සමිතියේ යම් රැස්වීමකදී එසේ ඡන්දය දීමට ඉඩදිය හැකිය.

(2) වෙනයම් ලියාපදිංචි කළ සමිතියක සාමාජිකයෙකු වන ලියාපදිංචි කළ සමිතියක් විසින් ඒ වෙනයම් ලියාපදිංචි කළ සමිතියේ කටයුතු පවත්වාගෙන යාමෙහි ලා ඡන්දය දීමේ කාර්යය සඳහා ස්වකිය සාමාජිකයෙකුගෙන් කෙනෙකු හෝ වැඩි ගණනක් පත්කළ හැකිය.

(3) ලියාපදිංචි සමුපකාර සමිති වල නිලවරණ කටයුතු මෙම ප්‍රඥප්තිය යටතේ සමුපකාර විෂයභාර අමාත්‍යවරයා විසින් පනවනු ලබන රෙගුලාසි අනුව විය යුතුය.

කොටස් හෝ සම්බන්ධතා පැවරීම පිළිබඳ සීමා.

17 (1) ලියාපදිංචි කළ සමිතියක සාමාජිකයෙකුගේ හෝ සිටිය සාමාජිකයෙකුගේ හෝ මියගිය සාමාජිකයෙකුගේ හෝ ප්‍රාග්ධනයෙන් කොටස් හෝ වෙනත් සම්බන්ධතා පැවරීම, සතුව සිටිය හැකි වැඩිම ප්‍රමාණය සම්බන්ධයෙන් මේ ප්‍රඥප්තියෙන් හෝ රීති වලින් නියම කරනු ලැබිය හැකි කොන්දේසිවලට යටත්ව විය යුතුය.

(2) සීමාරහිත වගකීම් වලින් යුත් ලියාපදිංචි කළ සමිතියක් සම්බන්ධයෙන් වූ විට, කිසිම සාමාජිකයෙකු විසින් ;

(අ) තමා විසින් යම් කොටසක් හෝ සම්බන්ධතාවක් එක් අවුරුද්දකට නොඅඩු කාලයක් දරන ලද්දේ නම් ; හා

(ආ) සමිතිය වෙත හෝ සමිතියේ සාමාජිකයෙකු වෙත හෝ සාමාජිකත්වය සඳහා වූ ඉල්ලුම් පත්‍රය කාරක සභාව විසින් පිළිගනු ලැබ සිටින තැනැත්තෙකු වෙත පැවරීම කරනු ලබන්නේ නම්,

මිස තමා විසින් දරනු ලබන සමිතියේ ප්‍රාග්ධනයෙන් යම් කොටසක් හෝ සම්බන්ධතාවක් හෝ එහි යම් කිසි කොටසක් නොපැවරිය යුතුය.

## IV වැනි පරිච්ඡේදය

### *ලියාපදිංචි සමිතිවල යුතුකම්*

සමිති ලිපිනය.

18 දැන්වීම් හා ලිපි යවනු ලැබිය හැකි, රීති අනුව ලියාපදිංචි කරනු ලැබූ ලිපිනයක් සෑම ලියාපදිංචි කළ සමිතියකටම තිබිය යුතු අතර, ඒ ලිපිනය සම්බන්ධයෙන් යම් වෙනසක් ඇති වීමෙන් පසු දින 07 ක් ඇතුළත ඒ වෙනස රෙජිස්ට්‍රාර් වෙත දැන්විය යුතුය.

ප්‍රඥප්තිය, රීති, අතුරු ව්‍යවස්ථා යනාදියෙහි පිටපතක් පරීක්ෂා කර බැලීමට ඉඩකඩ තිබිය යුතු බව.

19 (1) ලියාපදිංචි කළ සෑම සමිතියක්ම විසින් මේ ප්‍රඥප්තියේ, රීතිවල හා සමිතියේ අතුරු ව්‍යවස්ථාවල පිටපත් 05 ක්ද සමිතියේ හා සාමාජිකයන්ගේ නාම ලේඛනයක්ද ගාස්තු ගෙවීමක් නොමැතිව සියලු යුක්ති සහගත වේලාවලදී පරීක්ෂා කර බැලීම සඳහා සමිතියේ ලියාපදිංචි කරන ලද ලිපිනය දරන ස්ථානයෙහි තැබිය යුතුය.

(2) නාම ලේඛනයේ පහත සඳහන් තොරතුරු ඇතුළත් විය යුතුය.

(අ) සෑම සාමාජිකයාගේම නම, සාමාජික අංකය, ජාතික හැඳුනුම්පත් අංකය, ලිපිනය සහ රැකියාව.

(ආ) සාමාජිකයෙකු වශයෙන් ලේඛනගත කරන ලද දිනය.

(ඇ) සාමාජිකත්වය අහිමි වූ දිනය.

(ඈ) සාමාජිකත්වය අහිමිවීමට හේතු වූ කරුණු.

## V වැනි පරිච්ඡේදය

### *ලියාපදිංචි කළ සමිති සතු වරප්‍රසාද*

සමිති සංස්ථාවක් විය යුතු බව.

20 සමිතියක් ලියාපදිංචි කිරීම හේතුකොට ගෙන, එය ලියාපදිංචි කරනු ලැබූ නාමය යටතේ, අවිච්ඡින්න පරම්පරාවක් හා පොදු මුද්‍රාවක් ඇති හා දේපල සතුව සිටීමේ ද, ගිවිසුම්වලට ඇතුළත් වීමේ ද, නඩු හා වෙනත් නීති කෘත්‍ය පැවරීමේ හා ඒවා සම්බන්ධයෙන් නිදහසට කරුණු කීමේ ද සමිතිය පිහිටුවීමේ කාර්යය සඳහා අවශ්‍ය සියළු දේවල් කිරීමේ ද බලය සහිත සංස්ථාවක් විය යුතුය.

සමිතියට හෝ සමිති මාර්ගයෙන් ද්‍රව්‍ය විකිණීම.

21 (1) කෘෂිකාර්මික හෝ සත්ව පාලනමය ද්‍රව්‍ය හෝ යම් කර්මාන්තයක නිෂ්පාදනය වන යම් භාණ්ඩයක් විකිණීම එක් පරමාර්ථයක් වශයෙන් ඇති ලියාපදිංචි කළ සමිතියක් විසින් ;

(අ) එවැනි යම් දෙයක් නිෂ්පාදනය කරන සමිතියේ සෑම සාමාජිකයෙකු විසින් ඒ ද්‍රව්‍ය සම්පූර්ණයෙන් හෝ එහි යම් නිශ්චිත කොටසක්, සමානුපාතයක් හෝ වර්ගයක් සමිතියට හෝ සමිතිය මාර්ගයෙන් විකිණිය යුතු බවට ; හා

(ආ) අතුරු ව්‍යවස්ථා හෝ ගිවිසුම් කඩ කිරීමේ වරදට වරදකරු ලෙස රීති වලින් නියම කළ හැකි ආකාරයෙන් ඔප්පු කරනු ලැබූ හෝ තීන්දු කරනු ලැබූ සාමාජිකයෙකු විසින් රීති වලින් හෝ සමිතියේ අතුරු ව්‍යවස්ථා වලින් නියම කරනු ලැබිය හැකි යම් ආකාරයකින් නිශ්චය කරනු ලබන හෝ තක්සේරු කරනු ලබන මුදලක් ප්‍රමාණ කළ අලාභ වශයෙන් සමිතියට ගෙවිය යුතු බවට,

සමිතියේ අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන සැලැස්වීම හෝ එහි සාමාජිකයන් සමඟ ගිවිසුමකට ඇතුළුවීම කළ හැකිය.

(2) ලියාපදිංචි කළ සමිතියක් විසින් (1) වන උප වගන්තිය යටතේ ඇති කරගත් ගිවිසුමකින් ඒ ගිවිසුමට අදාළ වන, නිෂ්පාදිත හෝ නිෂ්පාදනය කරනු ලැබීමට ආසන්න සියළු ද්‍රව්‍යයන් කෙරෙහි සමිතියේ වාසියට පළමු බැඳීමක් ඇතිවිය යුතුය.

(3) (1) වන උප වගන්තිය යටතේ වූ ගිවිසුමකින් උද්ගත වන යම් නීති කෘත්‍යයක දී ඒ ගිවිසුම ව්‍යාපාර තහනමක් වශයෙන් වූ ගිවිසුමක් යන්න නිදහසට කරුණක් නොවිය යුතුය.

(4) ලියාපදිංචි කළ සමිතියක සාමාජිකයෙකු ඒ සමිතියේ සාමාජිකයෙකු වීමට පෙර තම ද්‍රව්‍ය වෙනයම් තැනැත්තෙකුට භාරදීමට ගිවිසගෙන සිටීමේ හේතුව කරන කොටගෙන ඒ ද්‍රව්‍ය ලියාපදිංචි කළ සමිතියට භාරදීමට ඔහු අපොහොසත් වූයේ නම් ඒ නිෂ්පාදන සමිතියට භාරදීමට තමාට නියම කෙරෙන ඒ සමිතියේ යම් අතුරු ව්‍යවස්ථාවක් ඒ සාමාජිකයා විසින් කඩ කරනු ලැබූ ලෙස නොසැලකිය යුතුය.

(5) ලියාපදිංචි කළ සමිතියක සාමාජිකත්වය සඳහා ඉල්ලුම් කරන සෑම තැනැත්තකු විසින්, යම් ද්‍රව්‍යයක් වෙනයම් තැනැත්තෙකුට භාරදීම සඳහා තමා ඇතිකරගත් සියළු ගිවිසුම් පිළිබඳ විස්තර තම ඉල්ලුම් පත්‍රයෙහි එළිදරවු කරන ලෙස නියම කරනු ලැබුවහොත් එසේ කළ යුතුය.

22 (1) ලියාපදිංචි කළ සමිතියක් සම්බන්ධයෙන් වූ විට ඒ සමිතියේ සාමාජිකයන් හෝ එහි යම් කොටසක් මධ්‍යම පළාතේ, එහි යම් දිස්ත්‍රික්කයක හෝ ප්‍රදේශයක යම් භාණ්ඩයක් නිපදවන්නන් බවට අමාත්‍යවරයා සෑහීමකට පත්වන අවස්ථාවක මධ්‍යම පළාත් සභාවේ සමුපකාර විෂය භාර අමාත්‍යවරයා විසින් තමාගේ අභිමතය පරිදි මධ්‍යම පළාතේ, එහි යම් දිස්ත්‍රික්කයක හෝ ප්‍රදේශයක, ඒ භාණ්ඩය පිළිබඳ එක් එක් නිපදවන්නාට ඒ නිපදවන්නා ඒ සමිතියේ සාමාජිකයෙකු වුවද නොවුවද ඒ නිපදවන්නා විසින් නිෂ්පාදනය කරනු ලබන ඒ භාණ්ඩයෙහි සම්පූර්ණ ප්‍රමාණයෙන් ඔහුගේ ප්‍රයෝජනයට හෝ පරිභෝජනයට අවශ්‍ය නොවන කොටස් ඒ සමිතියට හෝ සමිතිය මාර්ගයෙන් විකුණන ලෙස විධාන කළ හැකිය. ඇතැම් අවස්ථාවල දී ලියාපදිංචි කළ සමිතියක් මාර්ගයෙන් නිෂ්පාදන අනිවාර්යෙන් විකිණීම.

(2) මධ්‍යම පළාතේ පළාත් සභාවේ සමුපකාර විෂයභාර අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තිය යටතේ කරනු ලැබූ සෑම ආඥාවක්ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, ඒ ආඥාවෙහි ඒ භාණ්ඩය, ආඥාව ක්‍රියාත්මක විය යුතු ප්‍රදේශය හා ඒ භාණ්ඩය නිපදවන්නාට ගෙවිය යුත්තේ කවර පදනමක් මත ද යන වග නිශ්චිතව සඳහන් කළ යුතුය.

(3) සෑම ආඥාවක් එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දින සිට ක්‍රියාත්මක විය යුතු අතර (5) වැනි උපවගන්තියේ විධිවිධානවලට යටත්ව එය පරිච්ඡින්න කරනු ලබන තෙක් අඛණ්ඩව ක්‍රියාත්මක විය යුතුය.

(4) සෑම ආඥාවක්ම ක්‍රියාත්මක වීමෙන් පසු හැකි ඉක්මනින් අනුමැතිය සඳහා මධ්‍යම පළාතේ පළාත් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.

(5) මධ්‍යම පළාතේ පළාත් සභාව විසින් අනුමත කිරීම ප්‍රතික්ෂේප කරනු ලබන සෑම ආඥාවක්ම පරිච්චින්න කරනු ලැබූ ලෙස සළකනු ලැබිය යුතු අතර එය යටතේ කලින් කරන ලද හෝ කරනු ලැබීමට ඉඩදෙන ලද කිසිවක වලංගුභාවයට හානිකර නොවිය යුතුය. ආඥාවක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැළකෙන දිනය ඒ ආඥාව අනුමත කිරීම මධ්‍යම පළාතේ පළාත් සභාව විසින් ප්‍රතික්ෂේප කරනු ලබන දිනය විය යුතු අතර ඒ දිනය ගැසට් පත්‍රයෙහි නිවේදනය කරනු ලැබිය යුතුය.

(6) (අ) මධ්‍යම පළාතේ පළාත් සභාවේ සමුපකාර විෂයභාර අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන ආඥාවකින් (ඒ ආඥාව මින්මතු "සංශෝධනය කිරීමේ ආඥාව" යනුවෙන් සඳහන් කරනු ලැබේ.) (1) වන උප වගන්තිය යටතේ කලින් කරන ලද යම් ආඥාවක් ඕනෑම අවස්ථාවක වෙනස් කළ හැකිය. සෑම සංශෝධනය කිරීමේ ආඥාවක්ම එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දින සිට ක්‍රියාත්මක විය යුතුය.

(ආ) සංශෝධනය කිරීමේ ආඥාවකින් වෙනස් කරනු ලබන (1) වැනි උප වගන්තිය යටතේ කරන ලද ආඥාවක් එසේ වෙනස් නොකරන ලද්දේ නම් ක්‍රියාත්මකව විය හැකිව තිබූ කාල පරිච්ඡේදය තුළ එසේ වෙනස් කරනු ලැබූ පරිදි අඛණ්ඩව ක්‍රියාත්මක විය යුතු අතර ඊට වැඩි කාලයක් ක්‍රියාත්මක නොවිය යුතුය.

(ඇ) සෑම සංශෝධනය කිරීමේ ආඥාවක්ම අනුමැතිය සඳහා මධ්‍යම පළාතේ පළාත් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.

එසේ වුවද (1) වැනි උප වගන්තිය යටතේ කරන ලද ආඥාවක් (4) වැනි උප වගන්තිය යටතේ මධ්‍යම පළාතේ පළාත් සභාව විසින් අනුමත කරනු ලැබීමට පෙර සංශෝධනය කිරීමේ ආඥාවකින් හෝ ආඥා වැඩි ගණනකින් වෙනස් කරනු ලැබූ අවස්ථාවක ඒ ආඥාව ඒ උප වගන්තිය යටතේ අනුමැතිය සඳහා මධ්‍යම පළාත් සභාව වෙත ඉදිරිපත් කළ විට එය සංශෝධනය කිරීමේ ආඥාවෙන් හෝ ආඥාවලින් ඇති කරන ලද සියලු වෙනස් කිරීම් එහි අන්තර්ගත කරනු ලැබිය යුතු අතර එවැනි අවස්ථාවකදී එවැනි සංශෝධනය කිරීමේ ආඥාවක වෙන් වෙන් වශයෙන් මධ්‍යම පළාතේ පළාත් සභාව වෙත ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවිය යුතුය.

(ඈ) අනුමැතිය සඳහා මධ්‍යම පළාතේ පළාත් සභාව ඉදිරියට ගෙන එනු ලැබූ යම් සංශෝධනය කිරීමේ ආඥාවක් මධ්‍යම පළාතේ පළාත් සභාව විසින් අනුමත කිරීම ප්‍රතික්ෂේප කිරීම ඒ සංශෝධනය කරනු ලැබූ ආඥාව පරිච්ඡින්න කරනු ලැබීමක් ලෙස සැළකිය යුතු අතර, (1) වැනි උපවගන්තිය යටතේ කරනු ලැබූ ආඥාව ඒ පරිච්ඡින්න කිරීමේ දිනයේ සිට ඒ සංශෝධනය කිරීමේ ආඥාව කරනු නොලැබුවාක් මෙන් අඛණ්ඩව ක්‍රියාත්මක විය යුතුය.

(ඉ) (1) වැනි උප වගන්තිය යටතේ කලින් කරන ලද යම් ආඥාවක් මධ්‍යම පළාතේ පළාත් සභාවේ සමුපකාර විෂයභාර අමාත්‍යවරයා විසින් යම් විටෙක පරිච්ඡින්න කළ හැකිය. එවැනි යම් ආඥාවක් පරිච්චින්න කිරීමේ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කළ යුතු අතර ඒ ආඥාව පළ කිරීමේ දින සිට පරිච්ඡින්න කරන ලද ලෙස සළකනු ලැබිය යුතුය.

(7) සෑම ආඥාවක්ම මධ්‍යම පළාතේ පළාත් සභාව විසින් අනුමත කරනු ලැබූ විට එය මෙහිලා පනවනු ලැබූවක් මෙන් වලංගු හා බල සහිත විය යුතුය.

(8) මේ වගන්තිය යටතේ ගැසට් පත්‍රයෙහි පළ කිරීමට නියමිත සෑම නිවේදනයක්ම මධ්‍යම පළාතේ පළාත් සභාවේ සමුපකාර විෂයභාර අමාත්‍යවරයාගේ අත්සන යටතේ පළ කළ යුතුය.

(9) මේ වගන්තිය යටතේ කරන ලද යම් ආඥාවක විධිවිධාන අන්කිසි ලිඛිත නීතියක විධි විධාන සමග නොගැලපීම හෝ ගැටීම නොතකා ඒ ආඥාව බල පවත්නා කාල පරිච්ඡේදය තුළ ඒ අන් ලිඛිත නීතිය අභිබවා ඒ විධිවිධාන බල පැවැත්විය යුතුය.

(10) සෑම සාමාජිකයෙකු නොවන ලියාපදිංචි කළ සමිතියකට සමිතියක් මාර්ගයෙන් යම් භාණ්ඩයක් විකුණන ලෙස (1) වැනි උප වගන්තිය යටතේ ආඥාවකින් විධාන කරනු ලැබූ

සෑම නිපදවන්නකුම ඒ විධානය අනුව වූ එවැනි යම් විකිණීමක් සම්බන්ධයෙන් හා ඒ විකිණීමෙන් උද්ගතවන යම්කරුණක් හෝ ගණුදෙනුවක් සම්බන්ධයෙන් ඔහු ඒ සමිතියේ සාමාජිකයෙකුව සිටියේ නම් යටත් විය හැකිව තිබූ කොන්දේසි හා බැඳීම්වලටම යටත් විය යුතුය.

(11) (1) වන උපවගන්තිය යටතේ ආඥාවක් කරන ලද්දේ යම් නිපදවන්නෙකු සම්බන්ධයෙන්ද ඒ නිපදවන්නා වූ ද ලියාපදිංචි කරනු ලැබූ සමිතියේ සාමාජිකයෙකු නොවන්නා වූ ද යම් නිපදවන්නකු විසින් ඒ සමිතියේ සාමාජිකයෙකු ලෙස ඇතුළත්වීම සඳහා ඉල්ලුම් කරනු ලබන අවස්ථාවක සමිති විසින්

(අ) ඔහු එසේ කැමති වන්නේ නම්, ඔහුගේ ගිණුමට සමිතියට ලැබුණ හෝ සමිතිය විසින් දරනු ලබන යම් අරමුදල් වලින් සාමාජිකත්වය සඳහා වූ දායක මුදල සම්පූර්ණයෙන්ම හෝ ඉන් යම් කොටසක් කපාගත යුතුය ;

(ආ) ඉහත කී පරිදි යම් කපාගැනීමකට යටත්ව ඒ දායක මුදල සම්පූර්ණයෙන්ම ගෙවීමෙන් පසු ඔහු සාමාජිකයෙකු වශයෙන් ඇතුළත් කළ යුතුය.

23 (1) වෙන යම් තැනැත්තෙකු විසින් නිෂ්පාදනය කරන ලද යම් භාණ්ඩයක් ලියාපදිංචි කළ සමිතියකට හෝ ඒ සමිතිය මාර්ගයෙන් විකිණීමට ඒ වෙනත් තැනැත්තා 21 වැනි වගන්තිය යටතේ ගිවිසගෙන සිටින හෝ 22 වැනි වගන්තිය යටතේ වූ ආඥාවකින් බැඳී සිටින බව දැන සිටිය දී හෝ ඒ පිළිබඳව දැන්වීමක් ලැබ ඇතිව සිටිය දී අවස්ථාවෝචිත පරිදි ඒ ගිවිසුම කඩ කරමින් හෝ ඒ ආඥාවට පටහැනිව ඒ භාණ්ඩය විකිණීමට හෝ

ගිවිසුම් කඩ කිරීමට අන්‍යයන් පොළඹවන තැනැත්තන්

භාරදීමට වෙන තැනැත්තා පොළඹවන හෝ කැමති කරවා ගන්නා යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් දෙදහසකට නොවැඩි දඩයකට යටත් විය යුතුය.

(2) (1) වැනි උපවගන්තිය යටතේ වරදකට වරදකරු කරනු ලැබූ තැනැත්තා සංස්ථාවක් වන අවස්ථාවක, ඒ වරද කරන විට ඒ සංස්ථාවේ අධ්‍යක්ෂවරයෙකු හෝ නිලධාරියෙකුව සිටි තැනැත්තෙකුට, ඒ වරද සිදු කරන ලද්දේ තමා නොදැනුවත්ව හෝ ඒ වරද සිදු කිරීම වැළැක්වීම සඳහා නිසි සියළු උද්‍යෝගයෙන් තමා ක්‍රියාකළ බව ඔහු විසින් ඔප්පු කරනු ලැබුවහොත් මිස ඒ වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතුය.

24 (1) ණයකරුවකුගේ දේපළ සම්බන්ධයෙන් ජනරජයේ හෝ පළාත් සභාවේ ප්‍රමුඛතා හිමිකමට හා කුලී හෝ කුලී වශයෙන් අයකර ගත හැකි යම් මුදලක් සම්බන්ධයෙන් ඉඩම් හිමියෙකුගේ කැප අයිතියට හෝ කලින් ලියාපදිංචි කරන ලද යම් බැඳීමකට යටත්ව

යම් සාමාජිකයෙකුට අයත් වගා, කෘෂි ද්‍රව්‍ය, ගවයන්, උපකරණ, අමු ද්‍රව්‍ය හා නිෂ්පාදිත භාණ්ඩ සම්බන්ධයෙන් ලියාපදිංචි කළ සමිතියක අයිතිවාසිකම්

යම් සාමාජිකයෙකු හෝ කලින් සිටි සාමාජිකයෙකු විසින් ලියාපදිංචි කළ සමිතියකට ගෙවිය යුතු යම් ණයක් හෝ සපුරා නොමැති ඉල්ලීමක්

(අ) ඒ සාමාජිකයා හෝ කලින් සිටි සාමාජිකයා විසින් සමිතියෙන් ගත් ණය මුදලකින් සම්පූර්ණයෙන්ම හෝ කොටසකින් වැවූ වගාවක් හෝ එසේ ලබාගත් වෙනත් කෘෂි ද්‍රව්‍යයක් කෙරෙහි පළමු බැඳීමක් විය යුතුය ;

(ආ) සමිතිය විසින් සාමාජිකයෙකුට හෝ කලින් සිටි සාමාජිකයෙකුට දෙන ලද මුදලින් හෝ භාණ්ඩවලින් වූ යම් ණයකින් සම්පූර්ණයෙන්ම හෝ කොටසක් ඔහුට සපයන ලද හෝ ඔහු විසින් මිළට ගනු ලැබූ යම් ගවයන්, ගවයන් සඳහා වූ ආහාර, කෘෂිකාර්මික හෝ කාර්මික උපකරණ හෝ නිෂ්පාදනයට ගන්නා අමු ද්‍රව්‍ය දැනුම්දීමක් නොමැතිව සද්භාවයෙන් මිලට ගන්නා ගැනුම්කරුවෙකුගේ හෝ පැවරුම්ලාභියෙකුගේ හිමිකම කෙරෙහි බලනොපෑ යුතු ය. තව ද,

(2) ගෙවල් කුලිය, කොටස්, ණය මුදල් හෝ ගැනුම් මුදල් සම්බන්ධයෙන් යම් සාමාජිකයෙකු හෝ කලින් සිටි සාමාජිකයෙකු විසින් නිවාස සංගමයකට ගෙවිය යුතු යම් සපුරා නොමැති ඉල්ලීම් හෝ නොගෙවා ඇති ගාස්තු හෝ ඒ සමිතියට ගෙවිය යුතු වෙනයම් අයිතිවාසිකම් හෝ මුදල් සමිතියේ නිශ්චල දේපළ පිළිබඳ ඔහුගේ සම්බන්ධතාව කෙරෙහි පළමු බැඳීමක් විය යුතු ය.

සාමාජිකයන්ගේ කොටස් හෝ සම්බන්ධතා කෙරෙහි බැඳීම් හා හිලව් කිරීම්

25 සාමාජිකයෙකුගෙන් කලින් සිටි සාමාජිකයෙකුගෙන් හෝ මියගිය සාමාජිකයෙකුගේ බූදලයෙන් ;

(අ) සමිතියට අයවිය යුතු යම් ණයක් ;

(ආ) අන්කිසි ලියාපදිංචි කළ සමිතියකට අය විය යුතු යම් ණයක් ; හෝ

(ඇ) යම් ලියාපදිංචි කළ සමිතියක ඇවරකරුට අය විය යුතු යම් මුදලක් ;

පියවීම සඳහා, ඒ සාමාජිකයාගේ, කලින් සිටි සාමාජිකයාගේ හෝ මියගිය සාමාජිකයාගේ ප්‍රාග්ධනයෙහි කොටසක් හෝ වෙනත් සම්බන්ධතා හා තැන්පතු කෙරෙහි ද සාමාජිකයාට හෝ කලින් සිටි සාමාජිකයාට හෝ මියගිය සාමාජිකයාගේ බූදලයට ගෙවිය යුතු යම් ලාභාංශයක්, ප්‍රසාද මුදලක් හෝ ලාභ කෙරෙහිද ලියාපදිංචි කළ සමිතියකට බැඳීමක් තිබිය යුතු අතර සාමාජිකයෙකුට හෝ කලින් සිටි සාමාජිකයෙකුට හෝ මියගිය සාමාජිකයෙකුගේ බූදලයට බැර කෙරෙන හෝ ගෙවිය යුතු යම් මුදලක් හිලව් කිරීම හෝ එවැනි ණයක් හෝ මුදලක් ගෙවීමෙහිලා හෝ ගෙවීම සම්බන්ධයෙන් අවස්ථාවෝචිත පරිදි ඒ අන් සමිතියට හෝ ඇවරකරුට ගෙවීම ඒ ලියාපදිංචි කළ සමිතිය විසින් කළ හැකිය.

කොටස්, දායක මුදල් හා වෙනත් සම්බන්ධතා තහනම් කිරීමට හෝ විකිණීමට යටත් නොවන බව.

26 25 වැනි වගන්තියේ විධිවිධානවලට යටත්ව, ලියාපදිංචි කළ සමිතියක ප්‍රාග්ධනයෙහි සාමාජිකයෙකුගේ කොටස, මුදල හෝ වෙනත් සම්බන්ධතා ඒ සාමාජිකයා විසින් ඇතිකර ගන්නා ලද යම් ණයක් හෝ වගකීමක් සම්බන්ධයෙන් අධිකරණයක යම් තීන්දු ප්‍රකාශයක් හෝ ආඥාවක් යටතේ තහනමට ගැනීමට හෝ විකිණීමට යටත් නොවිය යුතුය. එසේ බුන්වත් වීමෙහි දී පත්කරනු ලබන ඔහුගේ පැවරුම්ලාභියාට හෝ සිවිල් නඩු විධාන සංග්‍රහයේ I වැනි පරිච්ඡේදය යටතේ පත් කරනු ලබන භාරගන්නෙකුට ඒ කොටසට, දායක මුදලට හෝ වෙනත් සම්බන්ධතාවට කිසිදු හිමිකමක් හෝ ඒ සම්බන්ධයෙන් හිමිකමක් කියාපෑමේ කිසිම අයිතියක් නොතිබිය යුතුය.

සාමාජිකයා මියගිය විට සම්බන්ධතා පැවරීම.

27 (1) සාමාජිකයෙකු මියගිය පසු ලියාපදිංචි කළ සමිතියක් විසින් ඒ මියගිය සාමාජිකයාගේ කොටස හෝ වෙනත් සම්බන්ධතා ඒ වෙනුවෙන් සාදනු ලැබූ රීති අනුව නම් කරනු ලැබූ තැනැත්තෙකුට, හෝ එසේ නම් කරනු ලැබූ කිසිම තැනැත්තකු නොසිටී නම් මියගිය සාමාජිකයාගේ නීත්‍යානුකූල උරුමකරු හෝ නියෝජිතයා ලෙස කාරක සභාවට පෙනී යා හැකි වෙනයම් තැනැත්තෙකුට පැවරිය හැකිය. නැතහොත් රීති හෝ අතුරු ව්‍යවස්ථා අනුව නිශ්චය කරනු ලැබූ ඒ සාමාජිකයාගේ කොටසේ හෝ වෙනත් සම්බන්ධතාවේ වටිනාකමට සමාන මුදලක් නම් කළ තැනැත්තාට, උරුමකරුට හෝ නීත්‍යානුකූල තැනැත්තාට ගෙවිය හැකිය.

එසේ වුව ද,

(අ) සීමාරහිත වගකීම්වලින් යුත් සමිතියක් සම්බන්ධයෙන් වූ විට අවස්ථාවෝචිත පරිදි ඒ නම් කරනු ලැබූ තැනැත්තා, උරුමකරු හෝ නීත්‍යානුකූල නියෝජිතයා විසින් මියගිය සාමාජිකයාගේ කොටස හෝ වෙනත් සම්බන්ධතාව සම්බන්ධයෙන් ඉහත කී පරිදි නිශ්චය කරනු ලැබූ වටිනාකම සමිතිය විසින් ගෙවන ලෙස ඉල්ලා සිටිය හැක.

(ආ) සීමාසහිත වගකීම්වලින් යුතු සමිතියක් සම්බන්ධයෙන් වූ විට සමිතිය විසින්, මියගිය සාමාජිකයාගේ කොටස හෝ වෙනත් සම්බන්ධතා, සමිතියේ සාමාජිකත්වය සඳහා රීති හා අතුරු ව්‍යවස්ථා අනුව සුදුසුකම්ලත් අවස්ථාවෝචිත පරිදි ඒ නම් කළ තැනැත්තා, උරුමකරු හෝ නීත්‍යානුකූල නියෝජිතයා වෙත හෝ මියගිය තැනැත්තාගේ මරණයෙන් පසු හය

මාසයක් ඇතුළත ඔහු විසින් කරනු ලබන ඉල්ලීමෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබූ එසේ සුදුසුකම් ලත් වෙන යම් තැනැත්තෙකු වෙත පැවරිය හැකි ය.

(2) ලියාපදිංචිකළ සමිතියක සාමාජිකයෙකු විසින් ඒ ලියාපදිංචි සාමාජිකයාට ගෙවිය යුතු වෙනත් සියලු මුදල් අවස්ථාවෝචිත පරිදි ඒ නම් කළ තැනැත්තා, උරුමකරු හෝ නීත්‍යානුකූල නියෝජිතයා වෙත ගෙවිය යුතු ය.

(3) ලියාපදිංචි කළ සමිතියක් විසින්, මේ වගන්තියේ විධි විධාන අනුව කරන ලද සියලු පැවරීම් හා ගෙවීම්, වෙනයම් තැනැත්තකු විසින් සමිතියට ඉදිරිපත් කරනු ලබන යම් ඉල්ලීමකට විරුද්ධව වලංගු හා බලසහිත විය යුතු ය.

28 (1) ලියාපදිංචි කළ සමිතියක් විසින් බාලවයස්කරුවන්ගේ හෝ ඔවුන්ගේ අර්ථලාභය සඳහා තැන්පතු භාරගත හැකි අතර, ඒ තැන්පතු සම්බන්ධයෙන් ගෙවිය යුතු විය හැකි පොලිය බාල වයස්කරුවන්ට ලියාපදිංචි කළ සමිතියක් විසින් ගෙවීම නීත්‍යානුකූල විය යුතුය. බාලවයස්කරුවකු විසින් කරන ලද යම් තැන්පත් කිරීමක් ඊට එකතු වූ පොලියත් සමඟ ඒ බාලවයස්කරුට ගෙවනු ලැබිය හැකිය. තව ද බාලවයස්කරුවෙකු වෙනුවෙන් වූ යම් තැන්පත් කිරීමක් ඊට එකතු වූ පොලියත් සමඟ ඒ බාලවයස්කරුගේ ප්‍රයෝජනය සඳහා ඒ බාලවයස්කරුගේ භාරකරු වෙත ගෙවනු ලැබිය හැකි ය. බාලවයස්කරුවකු විසින් හෝ ඔහු වෙනුවෙන් කරනු ලබන තැන්පතු.

(2) මේ වගන්තිය යටතේ සමිතියක් විසින් යම් බාලවයස්කරුවකුට හෝ භාරකරුවකුට ගෙවන ලද මුදල් සඳහා ඔහුගෙන් ලබාගන්නා ලදුපතක් ඒ මුදල සම්බන්ධයෙන් ඒ සමිතියේ වගකීම ඉටුකළ බවට ප්‍රමාණවත් නිදහස් කිරීමක් විය යුතු ය.

29 (1) හිටපු සාමාජිකයකු, සාමාජිකයකුව සිටීම කෙළවර වූ දින පැවතියාවූ ලියාපදිංචි කළ සමිතියක ණය සම්බන්ධයෙන් ඔහු ගේ බැඳීම ඒ දින සිට ගණන් බලන අවුරුදු දෙකක කාලපරිච්ඡේදයක් තුළ අඛණ්ඩව පැවතිය යුතු ය. සමිතියේ ණය සම්බන්ධයෙන් හිටපු සාමාජිකයා හා මියගිය සාමාජිකයාගේ බූදලය බැඳී ඇති බව.

(2) සාමාජිකයෙකු මියගිය දින සිට ගණන් බලන අවුරුදු දෙකක කාලපරිච්ඡේදයක් තුළ ඔහුගේ බූදලය, ඔහු මියගිය දින පැවති සමිතියේ ණය සම්බන්ධයෙන් බැඳී තිබිය යුතු ය.

30 යම් ලියාපදිංචි කළ සමිතියක් විසින් පවත්වාගෙන යනු ලබන සාමාජිකයන්ගේ යම් නාම ලේඛනයක් හෝ ලැයිස්තුවක් එහි සටහන් කරන ලද පහත සඳහන් විස්තරවලින් යම් විස්තරයක් පිළිබඳව බැලූ බැල්මට පිළිගත හැකි සාක්ෂිය විය යුතු ය. සාමාජිකයන්ගේ නාමලේඛනය.

(අ) සාමාජිකයකු වශයෙන් යම් තැනැත්තකුගේ නම ඒ නාම ලේඛනයෙහි හෝ ලැයිස්තුවෙහි සටහන් කරන ලද දිනය ;

(ආ) සාමාජික අංකය

(ඇ) එබඳු යම් තැනැත්තකු සාමාජිකයකුව සිටීම නතර කළ දිනය.

31 (1) ලියාපදිංචි කළ සමිතියක් ගණුදෙනු කිරීමෙහි දී විධිමත් ලෙස තබන ලද පොතක වූ යම් සටහනක පිටපතක් රීතිවලින් නියම කරනු ලැබිය හැකි යම් ආකාරයකින් සහතික කරනු ලැබුවේ නම් ඒ සටහන පැවති බවට බැලූ බැල්මට පිළිගත හැකි සාක්ෂියක් ලෙස යම් සිවිල් හෝ අපරාධ නීති කෘත්‍යයක දී පිළිගත යුතුය. තව ද ඒ මුල් සටහන පිළිගනු ලබන සෑම අවස්ථාවකදීම හා පිළිගනු ලබන ප්‍රමාණයටම ඒ පිටපතෙහි සටහන් කරන ලද කරුණු, ගණුදෙනු හා ගණන් පිළිබඳ සාක්ෂි වශයෙන් පිළිගනු ලැබිය යුතු ය. සමිතියේ පොත්වල සටහන් ඔප්පු කිරීම.

(2) ලියාපදිංචි කළ සමිතියක් පාර්ශවකරුවකු නොවන යම් නීති කෘත්‍යයක දී,
(1) වන උප වගන්තිය යටතේ ඔප්පු කළ හැකි කරුණු අඩංගු සමිතියේ පොත්වලින් යම් පොතක් ඉදිරිපත් කරන ලෙස හෝ එහි සටහන් කරන ලද යම් කරුණු, ගණුදෙනු හෝ ගණන් ඔප්පු කිරීම පිණිස සාක්ෂිකරුවකු වශයෙන් පෙනී සිටින ලෙස අධිකරණය විසින් විශේෂ හේතු කරන කොට ගෙන එසේ කිරීමට විධානය කරතහොත් මිස, ඒ සමිතියේ කිසිම නිලධරයකුට එසේ කිරීමට බල නොකළ යුතු ය.

සමිතියක් විසින් ඔඩපන වශයෙන් සුරැකුම්පත් නිකුත් කිරීම.

32 තත් කාලයෙහි බලපවත්නා ලිඛිත නීතියක හෝ වෙනත් නීතියක් නොතකා, ලියාපදිංචි කළ සමිතියක් විසින්

(අ) සාමාන්‍ය ගිණුම් තුලනයක් සඳහා ඇප වශයෙන් ඒ සමිතිය සතු යම් සුරැකුම්පත් ඔඩපන කළ හැකි ය. තව ද,

(ආ) සමිතිය වෙත නිකුත් කරන ලැබූ දැන්වීමක් අවසන් වන දිනයෙහි මුදල් ගෙවීම නොකරන ලද්දේ නම් අධිකරණය වෙත නොගොස් ඒ සුරැකුම්පත්වලින් යමක් හෝ ඒ සියල්ලම විකුණා එයින් ලැබෙන මුදල් ඒ ගිණුම් තුලනයට බැර කරන ලෙස ණයහිමියාට බලය පැවරිය හැකි ය.

දේපල අත්කර ගැනීමේ හා විකිණීමේ අයිතිය.

33 ලියාපදිංචි කළ සමිතියක් විසින් එකී සමිතියේ පරමාර්ථවලට සම්බන්ධ යම් කාර්යයක් සඳහා සමුපකාර බැංකු හා මුල්‍ය සේවා ක්ෂේත්‍රයට අදාළව නම්, රුපියල් දෙලක්ෂ පනස් දහස (රු.250,000/-) කට වැඩි වටිනාකමක් සහිත හා අනෙකුත් ව්‍යාපාර අංශවලට අදාළව නම්, රුපියල් ලක්ෂ පහ (රු.500,000/-) කට වඩා වටිනාකමක් ඇති, වෙළඳ බඩු තොග නොවන කිසිදු චංචල හෝ නිශ්චල දේපලක් මිලට ගැනීම, විකිණීම, උකස් කිරීම, බද්දට දීම, හුවමාරු කිරීම හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීම සිදු කරන විට සමිතියේ මහ සභාවේ අනුමැතියට අමතරව රෙජිස්ට්‍රාර්වරයාගේ පූර්ව අනුමැතිය ද ලියවිල්ලකින් ලබා ගත යුතු ය.

ඉඩම් හා ගොඩනැගිලි අනිවාර්යයෙන් අත්කර ගැනීම.

34 (1) ලියාපදිංචි කළ සමිතියක පරමාර්ථවලට සම්බන්ධ යම් කාර්යයක් සඳහා යම් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් අවශ්‍ය වන අවස්ථාවක ඒ කාර්යය පොදු කාර්යයක් ලෙස සළකනු ලැබිය යුතු අතර, ආණ්ඩුව විසින් ඒ සමිතිය සඳහා ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ ඒ ඉඩම හෝ ගොඩනැගිල්ල අත්කර ගත හැකි ය.

(2) ලියාපදිංචි කළ සමිතියක් සඳහා ආණ්ඩුව විසින් ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ යම් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් අත්කර ගත යුතු අවස්ථාවක ඒ සමිතිය විසින්, ඒ ඉඩම හෝ ගොඩනැගිල්ල සම්බන්ධයෙන් ඒ පනතේ 38 වැනි වගන්තිය යටතේ ආඥාවක් කරනු ලැබීමට පෙර ඒ ඉඩම හෝ ගොඩනැගිල්ල සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දිය වශයෙන් ඒ පනත යටතේ නිශ්චය කරනු ලැබූ මුදල හා අත්කර ගැනීමේ කටයුතුවල දී ආණ්ඩුව විසින් දරනු ලබන වියදම් ද ආණ්ඩුවට ගෙවිය යුතු ය.

(3) එසේ වුවද ඒ පනත යටතේ වන්දි මුදල නිශ්චය කිරීමට පෙර යම් හදිසි කාර්යයක් හේතුකොට ගෙන යම් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් අත්කර ගැනීමට අවශ්‍ය වන අවස්ථාවක, ඒ ඉඩම හෝ ගොඩනැගිල්ල සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දිය වශයෙන් නිශ්චය කරනු ලැබිය හැකි යයි අත්කර ගැනීමේ නිලධරයා අදහස් කරන යම් මුදලක් ඒ ආඥාව කිරීමට පෙර ඒ සමිතිය විසින් ආණ්ඩුවට ගෙවිය යුතු අතර, ඉතුරු මුදලක් ඇතොත් ඒ ඉතුරු මුදල ඒ පනත යටතේ වන්දි මුදල නිශ්චය කරනු ලැබීමෙන් පසු ගෙවිය යුතු ය.

## VI වැනි පරිච්ඡේදය

### *අතුරු ව්‍යවස්ථාවලට අදාළ සාමාන්‍ය විධිවිධාන*

සමිතියක අතුරු ව්‍යවස්ථාවලින් සාමාජිකයන් බැඳෙන බව.

35 (1) ලියාපදිංචි කළ සමිතියක සෑම අතුරු ව්‍යවස්ථාවකින්ම එම අතුරු ව්‍යවස්ථාව ලියාපදිංචි කරනු ලැබීමෙන් පසු ඒ සමිතියේ එක් එක් සාමාජිකයා විසින් එම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන පිළිපැදීමට එක් එක් සාමාජිකයා දුන් පොරොන්දුවක් එම අතුරු ව්‍යවස්ථාවට ඇතුළත් වූයේ නම් එකී ප්‍රමාණයටම සමිතිය ද එහි සාමාජිකයන් ද බැඳී සිටිය යුතු ය.

(2) ලියාපදිංචි කළ සමිතියක අතුරු ව්‍යවස්ථාවක අර්ථ නිරූපනය සම්බන්ධයෙන් පැන නගින යම් ආරවුලක් තීරණය කිරීම සඳහා රෙජිස්ට්‍රාර් වෙත යොමු කළ යුතු අතර, ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය නීත්‍යානුකූලව අවසානාත්මක හා තීරණාත්මක විය යුතු ය.

36. අතුරු ව්‍යවස්ථා සෑදීමට යම් රීතියකින් බලය පැවරුණ යම් කරුණක් සම්බන්ධයෙන් ලියාපදිංචි කළ සමිතියක් විසින් සාදන ලද කිසිම අතුරු ව්‍යවස්ථාවක් එය ව්‍යාපාර තහනම් කිරීමේ ගිවිසුමක්ය යන හේතුව පිට පමණක් කිසිම අධිකරණයකදී ප්‍රශ්න නොකළ යුතුය. ව්‍යාපාර තහනම් කරන අතුරු ව්‍යවස්ථා සෑදීමේ බලය

37. ලියාපදිංචි කළ යම් සමිතියක් විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථා වලින් සමිතියේ අතුරු ව්‍යවස්ථා කඩ කිරීම සම්බන්ධයෙන් එහි සාමාජිකයන්ට දඩ නියම කිරීම සඳහා රීතිවලට යටත්ව විධිවිධාන සැළැස්විය හැකිය. එසේ වුවද, සාමාජිකයන්ට දඩ නියම කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා සෑදීමේ බලය

(අ) සමිතිය විසින් ඒ දඩය නියම කිරීමට අදහස් කරන බව හා ඊට හේතු ඔහු වෙත ලියවිල්ලකින් දැනුම් දී ඇත්නම් මිස, හා

(ආ) රීතිවලින් නියම කරනු ලැබිය හැකි කාලයක් තුළ හා ආකාරයකින් ඒ දඩය නියම කිරීමට විරුද්ධව ප්‍රමාණවත් හේතු දැක්වීමට ඔහු අපොහොසත් වී ඇත්නම් මිස,
කිසිම සාමාජිකයකුට ඒ දඩය නියම නොකළ යුතුය.

## VII වැනි පරිච්ඡේදය

### *ලියාපදිංචි කළ සමිතිවල දේපල හා අරමුදල්*

38. (1) ලියාපදිංචි කළ සමිතියක් විසින් සාමාජිකයකු නොවන කිසිම තැනැත්තෙකුට යම් ණය මුදලක් නොදිය යුතුය. එසේ වුවද ලියාපදිංචි කළ සමිතියක් රෙජිස්ට්‍රාර්වරයාගේ පූර්ව අනුමැතිය ඇතිව සහ ඔහු විසින් නියම කරනු ලැබිය හැකි කොන්දේසි මත ද මහාසභාවේ අනුමැතිය ඇතිව ද ලියාපදිංචි සමිතියක් විසින් එකී සමිතියේ ආශ්‍රිත සාමාජිකත්වය ඇති වෙනත් ලියාපදිංචි කළ සමිතියකට ණය ප්‍රදානය කළ හැකිය. නැතහොත් ආශ්‍රිත සාමාජිකයකුට ණයට බඩු සැපයිය හැක. ලියාපදිංචි කළ සමිති වලින් දෙනු ලබන ණය.

(2) ස්වකීය මහා සභාවේ අනුමැතිය ඇතිව හැර ලියාපදිංචි සමිතියක් විසින්, කෘෂිකාර්මික නිෂ්පාදන නොවන යම් චංචල දේපළක ඇපය මත මුදල් ණයට දෙනු නොලැබිය යුතුය.

39. (1) ලියාපදිංචි කළ සමිතියක් විසින් මෙම ප්‍රඥප්තියේ XIV පරිච්ඡේදය අනුව පනවනු ලබන සමුපකාර බැංකු හා මූල්‍ය කටයුතු නියාමන නීති සහ සමුපකාර සමිති රීති මාලා වලින් හෝ අතුරු ව්‍යවස්ථාවලින් නියම කරනු ලැබිය හැකි ප්‍රමාණයකට හා එසේ නියම කරනු ලැබිය හැකි කොන්දේසි යටතේ පමණක් සාමාජිකයන් නොවන තැනැත්තන්ගේ තැන්පතු හා ණය මුදල් භාරගත යුතුය. ලියාපදිංචි කළ සමිති විසින් භාරගනු ලබන තැන්පතු හා ණය මුදල්.

(2) ලියාපදිංචි කළ සමිතියකට යම් නිශ්චල හෝ චංචල දේපළක උකස් පිට බැංකුවක් විසින් ණය මුදලක් දෙන ලද අවස්ථාවක ලේඛණ ලියාපදිංචි කිරීමේ ආඥා පනත යටතේ ඒ උකස ලියාපදිංචි කිරීමේ දිනයට පෙර එම ආඥා පනත යටතේ යථා පරිදි ලියාපදිංචි කරන ලද්දා වූද එම දේපළට බලපාන්නා වූද උකස් හෝ එසේ ලියාපදිංචි කරන ලද උකසකින් ආරක්ෂිත එසේ බලපාන්නා වූ ගෙවීමට බැඳී සිටීමක් හැර එම දේපළට බලපාන්නා වූ ඒ ලියාපදිංචි කරන ලද සමිතියේ කවර වූ හෝ අන් සෑම ණයකට හෝ එසේ බලපාන්නා වූ සෑම උකසකටම හෝ ගෙවීමකටම බැඳී සිටීමකට ඉහලින් ප්‍රමුඛස්ථානය ඇතිව ඒ උකස ලියාපදිංචි කිරීමේ දිනයෙහි සිට හා ඉන්පසු ඒ උකස යටතේ වූ මුදල් ගෙවීමට ඒ දේපළ බැඳී තිබිය යුතුය.

40. ලියාපදිංචි කළ සමිතියක් විසින් සාමාජික නොවන තැනැත්තන් සමඟ කරනු ලබන ගනුදෙනු 38 හා 39 වැනි වගන්ති වලින් විධිවිධාන සලසා ඇති පරිදි හැර, රීති වලින් නියම කරනු ලැබිය හැකි තහනම් හා සීමා කිරීම් වලට සමිතියේ කාරක සභාව යටත්ව කටයුතු කළ යුතුය. සාමාජික නොවන තැනැත්තන් සමඟ කරනු ලබන වෙනත් ගනුදෙනු සීමා කිරීම.

41. (1) ලියාපදිංචි කළ සමිතියක් විසින් භාර ආඥාපනතේ 20 වැනි වගන්තියෙහි නිශ්චිතව සඳහන් යම් දේපලක් පිළිබඳව පළමු උකසක් නොවන යම් සුරැකුම්පත්වල හෝ යම් රජයේ බැංකුකරුවෙකු සමඟ හෝ රෙජිස්ට්‍රාර් විසින් සමුපකාර බැංකු හා මූල්‍ය කටයුතු නියාමනය යටතේ මෙම කාර්යය සඳහා අනුමත කරන ලද බැංකුකරුවකු වශයෙන් ක්‍රියා කරන යම් සමිතියේ අරමුදල් ආයෝජනය කිරීම.

තැනැත්තකු සමග හෝ රෙජිස්ට්‍රාර් විසින් මෙම කාර්යය සඳහා අනුමත කරන ලද වෙනයම් ලියාපදිංචි කළ සමිතියක කොටස්වල හෝ ඇපය පිට හෝ රීතිවලින් අවසරය දෙන ලද වෙනයම් ආකාරයකින් සමිතියේ අරමුදල් තැන්පත් කිරීමට හෝ ආයෝජනය කිරීම කළ හැකි ය.

(2) මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මකව තිබුනේ නම් වලංගු විය හැකිව තිබූ මේ ප්‍රඥප්තිය ආරම්භවීමට පෙර කරන ලද යම් තැන්පතුවක් හෝ ආයෝජනයක් මෙයින් වලංගුකර ස්ථිර කරනු ලැබේ.

ලාභ පිළිබඳ සුදුස්සක් කිරීම.

42. (1) ලියාපදිංචි කළ සෑම සමිතියක් විසින් 44 වැනි වගන්තිය යටතේ විගණක විසින් නිශ්චය කරනු ලබන පරිදි යම් මුදල් වර්ෂයක් තුළ එහි වූ ශුද්ධ ලාභ වලින් ;

(අ) ඒ ශුද්ධ ලාභ වලින් සියයට විසිපහකට නොඅඩු යම් මුදලක් සමිතියේ නිදන් අරමුදලට ව්‍යවස්ථාපිත සංචිතයට මාරු කළ යුතු ය.

(ආ) එමෙන්ම රීති යටතේ පිහිටුවන ලද සමුපකාර අරමුදලට ශුද්ධ ලාභ වලින් රීති මඟින් නියම කරනු ලැබිය හැකි යම් කොටසක් දායක මුදල් වශයෙන් ගෙවිය යුතු ය.

(2) ශුද්ධ ලාභවල ශේෂය පහත සඳහන් කාර්යයන් සියල්ලම හෝ ඉන් යමක් සඳහා ප්‍රයෝජනයට ගනු ලැබිය හැකි ය.

(අ) සාමාජිකයන් විසින් ගෙවා නිම කරන ලද කොටස් ප්‍රාග්ධනය සම්බන්ධයෙන් රීති වලින් නියමිත ප්‍රමාණයට නොවැඩි ප්‍රමාණය අනුව සාමාජිකයන්ට ලාභාංශ ගෙවීම.

(ආ) සාමාජිකයන් විසින් සමිතිය සමග කරන ලද ගණුදෙනුවල වටිනාකම සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථාවල නියමිත ප්‍රමාණයට හා ආකාරයකින් ඔවුනට ප්‍රතිදාන ගෙවීම.

(ඇ) අතුරු ව්‍යවස්ථාවල නියම කරනු ලැබිය හැකි යම් අරමුදල් වලට දායක මුදල් ගෙවීම.

(ඈ) අතුරු ව්‍යවස්ථාවල නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි අන් කිසිවකට කරනු ලබන ගෙවීම්.

(ඉ) යම් සාමාජීය, සංස්කෘතික හෝ විනෝද කාර්යයන් පිණිස හෝ ප්‍රාදේශීය හෝ මහජන ප්‍රයෝජනය සඳහා වූ වෙනයම් අරමුදලක් සඵල කිරීම සඳහා වැය කිරීම පිණිස පොදු සුභසාධක අරමුදලට සමිතියේ එක් එක් ව්‍යාපාරික අංශ වල ශුද්ධ ලාභයෙන් සියයට දෙක බැගින් වනසේ මුළු ශුද්ධ ලාභයෙන් උපරිමයට සියයට දහයට වැඩි නොවන පරිදි මුදලක් වෙන් කිරීම.

(3) ලියාපදිංචි සමිතියක රෙජිස්ට්‍රාර්වරයාගේ සාමාන්‍ය හෝ විශේෂ අනුමැතියක් නොමැතිව 1 සහ 2 උප වගන්තිවල සඳහන් පරිදි කිසිදු ලාභ බෙදීමක් නොකළ යුතු ය.

## VIII වැනි පරිච්ඡේදය

### *ලියාපදිංචි සමිතියක ගිණුම්, අයවැය, විගණනය, විභාගය, පරීක්ෂණය සහ විමර්ශනය*

සමිතියේ ගිණුම්.

43. (1) සෑම ලියාපදිංචි සමිතියක්ම, සමිතියේ ආදායම හා වියදම, වත්කම් හා බැරකම් සහ වෙනත් සියළුම ගණුදෙනු පිළිබඳව රෙජිස්ට්‍රාර්වරයා විසින් නියමකරනු ලබන ප්‍රමිතීන්ට අනුකූලව ගිණුම් පවත්වාගෙන යා යුතු අතර, සෑම සමිතියක්ම ඒ අනුව කටයුතු කළ යුතුය.

(2) රෙජිස්ට්‍රාර්වරයා විසින් හෝ ඔහු විසින් බලය දෙන ලද යම් තැනැත්තෙකු විසින් නියම කරනු ලබන පරිදි, සමිතියේ කටයුතු වලට අදාළ ගිණුම්, උපලේඛන හා සංඛ්‍යාත පිළිබඳ වාර්ෂික ප්‍රකාශයක් සෑම ලියාපදිංචි කළ සමිතියක් විසින්ම සකස් කරනු ලැබිය යුතු ය. ඒ ගිණුම් ප්‍රකාශය, එය අදාළ වන මුදල් වර්ෂය අවසන් වී මාස තුනක් ඇතුළත රෙජිස්ට්‍රාර්වරයා වෙත හෝ ඔහු විසින් බලය දෙන ලද වෙනත් තැනැත්තා වෙත හෝ ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ විධි විධාන වලින් කිසිවක් අනුව කටයුතු කිරීම ලියාපදිංචි කළ සමිතියක් විසින් පැහැර හරිනු ලබන අවස්ථාවක, ඒ සමිතියේ කාරක සභාවේ සෑම සාමාජිකයෙකුම වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරුවකු කරනු ලැබූ විට රුපියල් හාරදහස නොඉක්මවන දඩයකට ඔහු යටත්විය යුතුය.

(4) ඉහත 43(2) වගන්තියේ විධිවිධාන පරිදි කටයුතු නොකරන අවස්ථාවක සමිතියේ වාර්ෂික ගිණුම් පිළියෙල කිරීම සඳහා අමතරව මාස දෙකක සහන කාලයක් ලබා දීමට රෙජිස්ට්‍රාර්වරයාට සළකා බැලිය හැකිය. ඒ අනුවද කටයුතු නොකළහොත් රෙජිස්ට්‍රාර්වරයා විසින් නියම කරනු ලබන අයෙකු ලවා සමිතියේ ගිණුම් සකස් කිරීම සිදු කළ හැකි අතර ඒ සඳහා යන වියදම එම කාර්යය පැහැර හරින ලද තැනැත්තන්ගෙන් රීති මගින් නියම කරනු ලබන ආකාරයට අයකර ගැනීමට රෙජිස්ට්‍රාර්වරයාට හැකි විය යුතුය.

(5) (අ) සෑම ලියාපදිංචි කළ සමිතියක් විසින්ම, ආදායම් ඉලක්ක පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම, මූල්‍ය හා මුදල් සම්පත්, මුදල් ආයෝජන අයවැය ගතකරන ලද ලාභාලාභ ගිණුම ආදායම් සහ වියදම් ගිණුම් හා ශේෂ පත්‍ර දැක්වෙන අයවැය ඇස්තමේන්තුවක් සෑම මුදල් වර්ෂයක් වෙනුවෙන්ම පිළියෙල කරනු ලැබිය යුතුය. අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම.

(ආ) ඒ අයවැය ඇස්තමේන්තුව අදාළ වන මුදල් වර්ෂ ආරම්භ වීමට පෙරාතුව වූ මාස දෙකකට වත් කලින් එය අනුමැතිය සඳහා සමිතියේ මහා සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

(ඇ) එම අයවැය ඇස්තමේන්තුව අදාළ වන මුදල් වර්ෂය ආරම්භවීමට පෙරාතුව වූ එක් ලිත් මාසයකට වත් කලින්, ඒ අයවැය ඇස්තමේන්තුවේ පිටපතක් රෙජිස්ට්‍රාර්වරයා වෙත යවනු ලැබිය යුතුය.

(ඈ) එම අයවැය ඇස්තමේන්තුව පිළියෙල කරනු ලැබිය යුතු ආකෘතිය සහ ආකාරයද, එහි අඩංගු විය යුතු අවම තොරතුරු ද රෙජිස්ට්‍රාර්වරයා විසින් තීරණය කරනු ලබන පරිදි විය යුතුය.

44 (1) සෑම අවුරුද්දකට වරක් සෑම ලියාපදිංචි කරනු ලැබූ සමිතියකම ගිණුම්, රෙජිස්ට්‍රාර් විසින් විගණනය කිරීම හෝ ඒ වෙනුවෙන් ලියවිල්ලකින් වූ සාමාන්‍ය හෝ විශේෂ නියෝගයක මාර්ගයෙන් ඔහු විසින් බලය පවරනු ලබන යම් රාජ්‍ය නිලධාරියෙකු, සමුපකාර සංවර්ධන නිලධාරියෙකු හෝ වරලත් ගණකාධිකාරිවරයකු හෝ වරලත් ගණකාධිකාරි සමාගමක් ලවා විගණනය කරවීම කළ යුතුය. විගණනය.

(2) (1) වන උප වගන්තිය යටතේ වූ විගණනයෙහි :

(අ) කාලය ඉකුත් වූ ණය සම්බන්ධයෙන් පරීක්ෂණයක් ;

(ආ) ලියාපදිංචි සමිතිවල වත්කම් සහ බැරකම් පිළිබඳ තක්සේරුවක් සහ සත්‍යාක්ෂණයක් ;

(ඇ) නිසි මුදල් පාලනය සහ සමිතියේ කටයුතු සම්බන්ධයෙන් අඛණ්ඩ ඇගයීමක් කිරීමට හැකි වනු පිණිස තොරතුරු ඉදිරිපත් කිරීම සහතික කිරීමට සංවිධාන ක්‍රම, කාර්ය පරිපාටි, පොත්, වාර්තා සහ වෙනත් ලිපි ලේඛන නිසි ලෙස සහ ප්‍රමාණවත් ලෙස සැලසුම් කරනු ලැබ ඇත්තේද සහ ඒ ක්‍රම, කාර්ය පටිපාටි, පොත්, වාර්තා සහ වෙනත් ලේඛන ඵලදායක ලෙස ක්‍රියාත්මක වන්නේද පිළිබඳ පරීක්ෂණයක් ;

(ඈ) සමිතිය පවත්වාගෙන යාම, මේ ප්‍රඥප්තියේ හෝ ඒ යටතේ සාදන ලද රීති, නියෝග හෝ අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන වලට අනුකූල වන්නේද, සමිතියේ කටයුතු පරිපාලනය කිරීම ඒ ප්‍රඥප්තියේ, රීති වල, නියෝග වල හෝ අතුරු ව්‍යවස්ථා වල විධිවිධාන වලට අනුකූලව කර ඇත්තේද යන්න පිළිබඳ පරීක්ෂණයක් ;

(ඉ) අරමුදල් උපයෝගි කිරීම කාර්යක්ෂම ලෙස සහ පිරිමැසුම් සහිතව ක්‍රියාත්මක කොට ඇත්තේ ද යන්න පිළිබඳ පරීක්ෂණයක් ;

(ඊ) ලියාපදිංචි සමිතියට අයත් සහ එහි පාලනය යටතේ ඇති මුදල් සහ දේපළ වල ආරක්‍ෂාව සහතික කරනු පිණිස විධිමත් කාර්ය පරිපාටි සකස් කොට ඇත්තේද යන්න පිළිබඳ පරීක්‍ෂණයක් ;

(උ) ගිණුම්, මුදල් යෙදවීම සහ තක්සේරු කිරීම සම්බන්ධයෙන් වූ සිද්ධාන්ත කෙරෙහි නිසි අවධානය ඇතිව සැළකිල්ලට භාජනය කොට ඇති කාල සීමාව සම්බන්ධයෙන් සමිතියේ කටයුතු පිළිබඳව සත්‍ය වූ සහ නිවැරදි ගිණුමක් ඉදිරිපත් කිරීම පිණිස විගණනය කරනු ලැබූ ගිණුම් සැලසුම් කොට ඇත්තේ ද යන්න පිළිබඳ පරීක්‍ෂණයක් ;

(ඌ) සමිතියේ ගිණුම් යාවත්කාලීන කර ගැනීමට හා නිවැරදි කිරීමට හැකිවන ලෙසින් අභ්‍යන්තර විගණනයක් පවත්වාගෙන ගොස් ඇත්ද යන්න එම අභ්‍යන්තර විගණනය මගින් පෙන්වා දී ඇති දෝෂ හා මග හැරීම් නිවැරදි කර ගැනීමට ක්‍රියා කර තිබේද යන්න පිළිබඳ පරීක්‍ෂණයක් ;

(එ) XIV වැනි පරිච්ඡේදයේ සමුපකාර බැංකු හා මූල්‍ය කටයුතු නියාමනයක් සිදුකර ඇත්ද යන්න පිළිබඳ පරීක්‍ෂණයක් සහ වෙනත් නියමිත කරුණු ඇතුලත් විය යුතුය.

(3) (1) වන උප වගන්තිය යටතේ විගණනයක කාර්යයක් සඳහා රෙජිස්ට්‍රාර්ට හෝ ඒ ගණන් විගණනය කිරීම පිණිස ඔහු විසින් බලය පවරනු ලැබූ යම් තැනැත්තකුට;

(අ) රෙජිස්ට්‍රාර්ගේ හෝ විගණනය සඳහා ඔහු විසින් බලය පවරනු ලැබූ තැනැත්තාගේ මතය අනුව සමිතියේ යම් ගණුදෙනු හෝ එහි කටයුතු පිළිබඳ කළමනාකාරීත්වය සම්බන්ධයෙන් වැදගත් තොරතුරු සැපයිය හැකි කලින් සිටි හෝ දැනට සිටින සමිතියේ යම් නිලධරයෙකු, නියෝජිතයෙකු, සේවකයෙකු හෝ සාමාජිකයෙකු හෝ වෙනයම් තැනැත්තකු කැඳවීමේ,

(ආ) සමිතියේ කටයුතු වලට අදාළ යම් පොතක් හෝ ලේඛණයක් හෝ සමිතියට අයත් යම් මුදලක් සුරැකුම් පතක් හෝ වෙනත් දේපලක් ඉදිරිපත් කරන ලෙස එය සන්තකව හෝ භාරව සිටින, කලින් සිටි හෝ දැනට සිටින සමිතියේ නිලධරයකුට, නියෝජිතයකුට, සේවකයකුට හෝ සාමාජිකයකුට හෝ වෙනයම් තැනැත්තකුට නියම කිරීමේ හා

(ඇ) ඒ විගණනයේ දී තමා විසින් වංචාවක් සොයාගනු ලබන අවස්ථාවක සමිතියේ ගණන් පොත් හෝ ලේඛණ තම භාරයට ගැනීමේ බලය තිබිය යුතුය.

(4) රෙජිස්ට්‍රාර්වරයාට හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් තත්කාර්යය සඳහා සාමාන්‍ය හෝ විශේෂ නියමයක් මගින් ලියවිල්ලකින් බලය දෙනු ලැබූ යම් තැනැත්තකුට ලියාපදිංචි කළ සමිතියක් විසින් පවත්වාගෙන යනු ලබන සියළු පොත්, ලේඛණ, ගිණුම් සහ ලියවිලි, සුරැකුම්පත් සහ අතේ ඇති මුදල් සියලූ අවස්ථාවලදී ලබා ගැනිමටද, පරීක්‍ෂා කිරීමටද හිමිකම තිබිය යුතුය. තවද ඉහත කී දේ භාරව සිටින හෝ පවත්වාගෙන යන හෝ සන්තකයෙහි ඇතිව සිටින සෑම තැනැත්තකුම ඒවා රෙජිස්ට්‍රාර්වරයාට හෝ ඒ බලය පවරනු ලැබූ තැනැත්තාට ඉදිරිපත් කළ යුතුය.

(5) නැතහොත් සමිතියේ ගණුදෙනු සහ වැඩ කටයුතු සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර්වරයා හෝ ඒ පරීක්‍ෂණය හෝ විගණනය කරන ඒ සඳහා බලය පවරනු ලැබූ තැනැත්තා විසින් නියම කරනු ලබන තොරතුරු සැපයිය යුතුය.

(6) රෙජිස්ට්‍රාර් හා ලියාපදිංචි කල සමිතියක ගණන් විගණනය කිරීම සඳහා ඔහු විසින් බලය පවරනු ලැබූ සෑම තැනැත්තකුම දණ්ඩ නීති සංග්‍රහයෙහි අර්ථානුකුලව රාජ්‍ය සේවකයන් ලෙස සැළකිය යුතුය.

(අ) සමිතියක සංවිධානය හෝ කළමනාකාරීත්වය භාරව සිටින හෝ භාරව සිටි හෝ සමිතියක නිලධාරියෙකුව හෝ සේවකයකුව සිටින හෝ කවර හෝ අවස්ථාවක සිටි යම් තැනැත්තකු විසින් මේ ප්‍රඥප්තිය යටතේ හෝ වෙනත් යම් නීතියක් යටතේ හෝ පනවනු ලැබූ රීතිවල හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් අනුමත කරන ලද, සමුපකාර සමිති වලට හෝ මුදල් කාර්ය පටිපාටියට අදාළ රීතිවල නැතහොත් නියෝග වල හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් හෝ සමුපකාර

සේවක කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද චක්‍රලේඛන වල හෝ පොදු විධාන කිසිවක හෝ සමිතියේ අතුරු ව්‍යවස්ථාවල හෝ සමිතියේ කාරක රීතිවල විධි විධානයන්ට පටහැනිව යම් ගෙවීමක් කර ඇති බව හෝ සමිතියේ යම් අරමුදල් පාවිච්චි කර ඇති බව

ii (i) වන උප වගන්තිය යටතේ වූ විගණනයන් පැවැත්වෙද්දී හෝ එය අවසානයේදී හෝ යම් අක්‍රමිකතාවයක් හෝ අරමුදල් හෝ දේපල අවභාවිතාවක් සොයා ගතහොත් රෙජිස්ට්‍රාර් විසින් එවැනි සෑම ගෙවීමකටම හා එවැනි සෑම අරමුදල් පාවිච්චි කිරීමකටම ඉඩ නොදිය යුතු අතර, ඒ නීති විරෝධි ගෙවීම හෝ අරමුදල් පාවිච්චි කිරීම කරන සහ/හෝ කිරීමට බලය දෙන තැනැත්තන්ගෙන් අධිභාර කළ යුතුය. තවද ඒ තැනැත්තන්ගේ නොසැලකිල්ල හෝ විෂමාචාරය හේතුකොට ගෙන දරන්නට සිදුවූ යම් ඌණතාවයක් හෝ පාඩුවක් සහ ඒ තැනැත්තන් විසින් ගණන් දැක්විය යුතු වු නමුත් එසේ ගණන් නොදක්වන ලද යම් මුදලක් ඒ තැනැත්තන්ගෙන් අයකර ගත යුතුය. තවද, ඒ එක් එක් අවස්ථාවේදී ඒ තැනැත්තන්ගෙන් අයවිය යුතු මුදල සහතික කොට තම තීරණය ලියවිල්ලකින් ඒ තැනැත්තන් වෙත දන්වා යැවිය යුතුය.

(ආ) යම් තැනැත්තකුට යම් ඉඩදීමක් නොකිරීමට හෝ යම් අධිභාරයක් කිරීමට පෙර රෙජිස්ට්‍රාර් විසින් හෝ රෙජිස්ට්‍රාර් විසින් ඒ වෙනුවෙන් ලියවිල්ලකින් වූ සාමාන්‍ය හෝ විශේෂ නියෝගයකින් බලය පවරනු ලැබූ යම් තැනැත්තකු විසින් සුදුසු යැයි සිතිය හැකි යම් කරුණු සම්බන්ධයෙන් කරුණු කියා සිටීමට හෝ යම් කරුණු ඉදිරිපත් කිරීමට ඒ තැනැත්තාට ඔහු විසින් අවස්ථාවක් දිය යුතු අතර එවැනි ඉඩ නොදීමක් හෝ අධිභාර කිරීමක් කරනු ලැබුව හොත් රෙජිස්ට්‍රාර්ගේ හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ තැනැත්තාගේ තීරණය සඳහා හේතු ඉල්ලා ඔහු වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් පසු ඒ ඉඩ නොදීම හෝ අධිභාර කිරීමක් කරනු ලැබුව හොත් රෙජිස්ට්‍රාර්ගේ හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ තැනැත්තාගේ තීරණය සඳහා හේතු ඉල්ලා ඔහු වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් පසු ඒ ඉඩ නොදීම හෝ අධිභාර කිරීම සම්බන්ධයෙන් තම තීරණයේ හේතු ලියවිල්ලකින් ඒ තැනැත්තා වෙත සැපයිය යුතුය.

(ඇ) රෙජිස්ට්‍රාර් විසින් කරන ලද තීරණයට අනුකූලව ක්‍රියා නොකරන ලද අවස්ථාවක 66(2) වැනි වගන්තියේ විධිවිධාන අදාළ විය යුතුය.

45 (1) ලියාපදිංචි කළ සමිතියක ක්‍රියාකාරීත්වයෙහි යම් අඩුපාඩු 44 වන වගන්තිය යටතේ කරන ලද විගණනයකදී එළිදරව් වුවහොත්, රෙජිස්ට්‍රාර් විසින් ඒ අඩුපාඩු සමිතියේ දැන ගැනීමට හා ඒ අන් සමිතියක සාමාජිකයෙකු නම් ඒ අන් සමිතියේ දැන ගැනීමට ද සැලැස්විය යුතුය.

විගණනයෙහි අඩුපාඩු සමිති වෙත දැන්වීම

(2) රෙජිස්ට්‍රාර් විසින්, එළිදරව් කරන ලද අඩුපාඩු සම්බන්ධයෙන් පිළියම් යෙදීම සඳහා නියෝගයෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් පියවරක් ඒ නියෝගයෙහි සඳහන් කාලය ඇතුළත දී ගන්නා ලෙස සමිතියට හෝ එහි නිලධරයන්ට විධාන කෙරෙන නියෝගයක් කළ හැකිය.

46 (1) රෙජිස්ට්‍රාර්වරයා විසින් තම මෙහෙයවීමෙන්ම, ලියාපදිංචි සමිතියක සංයුතිය, ක්‍රියාකාරීත්වය, වත්කම් සහ මුදල් තත්වය පිළිබඳව විභාගයක් හෝ එහි පොත් පිළිබඳ පරීක්ෂණයක් පවත්වනු ලැබිය හැකිය. තවද කාරක සභාවේ බහුතරයක ඉල්ලීම මත හෝ ලියාපදිංචි සමිතියක සාමාජිකයන්ගෙන් තුනෙන් එකකට නොඅඩු සාමාජික සංඛ්‍යාවකගේ ඉල්ලීම මත හෝ සමිතියක මහාසභාව නියෝජිතයින්ගෙන් සමන්විත වන විටක දී එවැනි මහාසභාවක් නියෝජනය කිරීමට බලය ඇති සම්පූර්ණ නියෝජිත සංඛ්‍යාවෙන් තුනෙන් එකකට නොඅඩු නියෝජිත පිරිසකගේ ඉල්ලීම මත ලියාපදිංචි සමිතියක සංයුතිය, ක්‍රියාකාරීත්වය, වත්කම් සහ මුදල් තත්වය පිළිබඳ විභාගයක් හෝ එහි පොත් පිළිබඳ පරීක්ෂණයක් රෙජිස්ට්‍රාර්වරයා විසින් පවත්වනු ලැබිය යුතුය. රෙජිස්ට්‍රාර්වරයා විසින් තත්කාර්ය සඳහා ලිඛිත නියමයන් මඟින් බලය දෙනු ලැබූ යම් තැනැත්තෙකුට ලියාපදිංචි සමිතියේ සංයුතිය, ක්‍රියාකාරිත්වය, වත්කම් සහ මුදල් තත්වය පිළිබඳ විභාගයක් හෝ එහි පොත් පිළිබඳ පරීක්ෂණයක් පැවැත්වීමට විධාන කළ හැකිය.

විභාග සහ පරීක්ෂණය

(2) 1 වන උපවගන්තිය යටතේ විභාගයක් පැවැත්වීමේ කාර්යය සඳහා රෙජිස්ට්‍රාර්වරයාට හෝ විභාගයක් හෝ පරීක්ෂණයක් පැවැත්වීමට ඔහු විසින් බලය දෙනු ලැබූ යම් තැනැත්තකුට ;

(අ) කලින් සිටි හෝ දැනට සිටින සමිතියේ යම් නිලධරයෙකු, නියෝජිතයකු, සේවකයෙකු හෝ සාමාජිකයෙකු හෝ රෙජිස්ට්‍රාර්වරයාගේ හෝ විභාග කිරීමට හෝ පරීක්ෂා කිරීමට ඔහු විසින් බලය දෙනු ලැබූ තැනැත්තාගේ මතය අනුව සමිතියේ ගණුදෙනු කිසිවක් සම්බන්ධයෙන් හෝ එහි කටයුතු කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් වැදගත් තොරතුරු දිය හැකි වෙනත් යම් තැනැත්තෙකු කැඳවීමට ;

(ආ) යම් පොතක්, ලේඛණයක්, මුදල්, ඇප හෝ වෙනත් දේපල සන්තකයෙහි ඇත්තා වූ හෝ භාරව සිටින්නා වූ සමිතියේ කලින් සිටි හෝ දැනට සිටින යම් නිලධරයෙකු, නියෝජිතයකු, සේවකයකු හෝ වෙනත් යම් තැනැත්තෙකුට සමිතියේ කටයුතු වලට අදාළ යම් පොතක් හෝ ලේඛණයක් හෝ සමිතියට අයත් යම් මුදල් හෝ ඇප හෝ වෙනත් දේපළ ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට ;

(ඇ) තමා විසින් යොමු කරනු ලබන යම් කාරණා තීරණය කිරීම පිණිස තමා විසින් සඳහන් කරනු ලබන යම් වේලාවක සහ ස්ථානයකදී සමිතියේ සාමාජිකයන්ගේ සභා රැස්වීමක් කැඳවීමට සහ

(ඈ) ඒ විභාගය හෝ පරීක්ෂණය අතරතුර වංචාවක් හෝ අක්‍රමිකතාවයක් ඇති බව විශ්වාස කිරීමට තමාට හේතු ඇති අවස්ථාවක සමිතියේ ගිණුම් පොත් හෝ ලේඛණ තම භාරයට ගැනීමට බලය ඇත්තේය.

(3) මෙම වගන්තිය යටතේ විභාගයක් හෝ පරීක්ෂණයක් කිරීමට පත් කරන නිලධාරියා හෝ නිලධාරීන් විසින් අදාල විභාගය හෝ පරීක්ෂණය සිදු කර එකී පරීක්ෂණ වාර්තාව රෙජිස්ට්‍රාර්වරයා විසින් නියම කරනු ලබන දිනට අවසන් කර රෙජිස්ට්‍රාර්වරයා වෙත ලබා දිය යුතුය.

(4) රෙජිස්ට්‍රාර්වරයා සහ මේ වගන්තිය යටතේ විභාගයක් හෝ පරීක්ෂණයක් පැවැත්වීමට ඔහු විසින් බලය දෙනු ලැබූ සෑම තැනැත්තෙකුම දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතුය.

සමිතියක මුදල්, පොත් පත්, දේපල, ගිණුම්, ලේඛන පරීක්ෂා කිරීම හා විමර්ශනය කිරීම

47. (1) රෙජිස්ට්‍රාර්ට යම් ලියාපදිංචි සමිතියක මුදල්, පොත්පත්, දේපල, ගිණුම් සහ වෙනත් ඕනෑම ලේඛණයක් පරීක්ෂා කිරීම හෝ සමිතියක කටයුතු විමර්ශනය කිරීම කළ හැකිය. නැතහොත් ඒ වෙනුවෙන් ලියවිල්ලකින් හෝ නියෝගයක් මගින් ඔහු විසින් බලය පවරනු ලබන යම් තැනැත්තෙකුට එවැනි පරීක්ෂණයක් සහ විමර්ශනයක් කරන ලෙස විධාන කළ හැකිය.

(2) 1 වන උප වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර්වරයාට හෝ ඔහු විසින් බලය පවරනු ලබන සමුපකාර සංවර්ධන නිලධාරියෙකුට මෙම ප්‍රඥප්තියේ 46(2)(අ),(ආ),(ඇ),(ඈ) සහ 46(4) වගන්ති යටතේ හිමි සියළුම බලතල තිබිය යුතුය.

## IX වැනි පරිච්ඡේදය

### *ලියාපදිංචි කළ සමිතියක නිලධරයන්ගේ සේවය අත්හිටුවීම, නිලධරයන් ඉවත් කිරීම සහ ලියාපදිංචි කළ සමිතියක කාරක සභාව විසුරුවා හැරීම*

සමිතියක කාරක සභිකයන් ඉවත් කිරීම හෝ කාරක සභාව විසුරුවා හැරීම.

48 (1) 46(1) වන වගන්තිය යටතේ වූ විභාගයකින් හෝ පරීක්ෂණයකින් හෝ 47 (1) වන වගන්තිය යටතේ වූ පරීක්ෂණයකින් සහ විමර්ශනය කිරීමකින් හෝ පසු ලියාපදිංචි කළ සමිතියක කාරක සභිකයෙකු/ කාරක සභිකයන් හෝ කාරක සභාව එහි යුතුකම් නිසි ආකාරයෙන් ඉටු නොකරන බව රෙජිස්ට්‍රාර්ගේ මතය වුවහොත් ඒ කාරක සභිකයා/කාරක සභිකයින් හෝ කාරක සභාව ඉවත් කිරීම හෝ විසුරුවා හැරීම සම්බන්ධයෙන් ඔවුන්ගෙන් විරෝධතා කිසිවක් වේතොත් ඒ විරෝධතා ප්‍රකාශ කරනු පිණිස ඔහු විසින් එම තැනැත්තාට/ තැනැත්තන්ට අවස්ථාවක් ලබා දීමෙන් පසු සහ ඔහු විසින් කැඳවනු ලැබූ සමිතියේ මහසභා රැස්වීමකදී ඒ විරෝධතා සළකා බැලීමෙන් පසු ලියවිල්ලකින් වූ නියෝගයක් මගින් අදාල කාරක සභිකයා/කාරක සභිකයින් ඉවත් කිරීම හෝ කාරක සභාවම විසුරුවා හැරීම කරනු ලැබිය හැකිය.

(අ) එසේ ඉවත් කරනු ලැබූ කාරක සභාවක සාමාජිකයන් ඔවුන් එසේ ඉවත් කරනු ලැබූ දින සිට වර්ෂ පහක් ගතවන තෙක් ලියාපදිංචි කළ කිසිදු සමිතියක නිලයකට පත් කරනු ලැබීමට නුසුදුස්සන් වේ.

(ආ) රෙජිස්ට්‍රාර්වරයා විසින් සමිතියේ කටයුතු පාලනය හා පරිපාලනය කිරීමට සුදුසු හා නිසි තැනැත්තන් පස් දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවක් පාලක මණ්ඩලයක් ලෙස පත් කළ හැකි අතර යටත් පිරිසෙයින් ඉන් දෙදෙනෙකුවත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විය යුතුය.

(ඇ) ඉහත 1(ආ) යටතේ රෙජිස්ට්‍රාර්වරයා විසින් පාලක මණ්ඩලය සඳහා සිදු කරනු ලබන පත් කිරීම් අවුරුදු තුනකට නොවැඩි කාලයක් තුල බල පැවැත්විය යුතුය. එසේ වුවද රෙජිස්ට්‍රාර් විසින් තම අභිමතය පරිදි කලින් කල ඒ විධානය බල පැවැත්විය යුතු කාලපරිච්ඡේදය දීර්ඝ කිරීමේ කාර්යය සඳහා ඒ ආඥාව සංශෝධනය කළ හැකි නමුදු ඒ විධානය එසේ බලපැවැත්විය යුතු මුළු කාල පරිච්ඡේදය එක් පාලක මණ්ඩලයක් සඳහා අවුරුදු තුනකට වැඩි නොවිය යුතුය. තවද,

(ඈ) එවැනි පාලක මණ්ඩල රැස්වීමක සණ පූරණය 67(3) උපවගන්තියේ නියමයන්ට අනුකූල විය යුතුය.

(ඉ) 48(1)(ඈ) වගන්තියේ විධිවිධාන වලට යටත්ව පත්කරනු ලබන සුදුසු තැනැත්තන් සමිතියේ කටයුතු කළමනාකරණය හා පරිපාලනය කළ යුතු යැයි කොමසාරිස්වරයා විසින් නිශ්චය කරනු ලබන කාල සීමාවක් සඳහා පත් කරනු ලැබිය යුතුය.

(2) 46(1) වන වගන්තිය යටතේ වූ විභාගයක් හෝ පරීක්ෂණයක් හෝ 47 වන වගන්තිය යටතේ වූ පරීක්ෂණයක් නැතහොත් විමර්ශනයක් නිම කිරීමට පෙර කාරක සභාවට විරුද්ධව චෝදනාවක් තහවුරු වී ඇතැයි රෙජිස්ට්‍රාර්වරයාගේ මතය වේ නම් එම කාරක සභාව මාස හයක කාල සීමාවක් සඳහා අත්හිටුවීමටද සමිතියේ වැඩ කටයුතු කළමනාකරණය කිරීම සහ පරිපාලනය කිරීම පිණිස අන්තර්කාලීන මණ්ඩලයක් පත් කිරීමටද ඔහුට බලය තිබිය යුතුය. තවද ඒ කාරක සභාව අත්හිටුවනු ලැබූ දින සිට මාස හයක කාල සීමාවක් ඇතුලත එම විභාගය, පරීක්ෂණය හෝ විමර්ශනය රෙජිස්ට්‍රාර්වරයා විසින් නිමකළ යුතු අතර ඒ කාරක සභාව 1 වන උපවගන්තිය යටතේ විසුරුවා හැරීම සම්බන්ධයෙන් අවසන් තීරණයක් ගනු ලැබිය යුතුය.

(3) රෙජිස්ට්‍රාර්ගේ සාමාන්‍ය විධානයට හා පාලනයට යටත්ව, ලියාපදිංචි කළ සමිතියක කටයුතු පාලනය කිරීම සඳහා මේ වගන්තිය යටතේ පත් කරනු ලැබූ යම් තැනැත්තකුට හෝ තැනැත්තන්ට;

සමිතියේ යථා පරිදි සංස්ථාපනය කරන ලද කාරක සභාවේ සියළු බලතල, අයිතිවාසිකම් හා වරප්‍රසාද තිබිය යුතු අතර ක්‍රියාත්මක කරනු ලැබිය හැකිය. තවද ඒ සමිතියේ කටයුතු කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීම උදෙසා අවශ්‍ය වන අවස්ථාවක, මහා සභාව සතු බලතල අතුරින් එසේ අවශ්‍ය වන බලතලද ඒ මහ සභාව බැහැර කෙරෙන පරිදි තිබිය යුතු අතර ක්‍රියාත්මක කරනු ලැබිය හැකිය.

(4) ලියාපදිංචි කළ සමිතියක කටයුතු පාලනය කිරීම සඳහා මේ වගන්තිය යටතේ පත් කරනු ලැබූ තැනැත්තන් විසින් නීතියට හෝ ඒ සමිතියේ අතුරු ව්‍යවස්ථාවලට පටහැනිව කරන ලද යම් ක්‍රියා නිසා සමිතියට විඳීමට සිදුවූ යම් පාඩුවක් සඳහා ඔවුන් සාමූහිකව හා වෙන් වෙන්ව වගකිව යුතුය.

(5) ලියාපදිංචි කළ සමිතියක කටයුතු පාලනය කිරීම සඳහා මේ වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර් විසින් පත් කරන ලද යම් තැනැත්තකුට හෝ තැනැත්තන්ට ගෙවිය යුතු පාරිශ්‍රමිකය ඔහු විසින් නියම කළ හැකිය. ඒ පාරිශ්‍රමිකය හා ඒ සමිතියේ කළමනාකාරීත්වයෙහිලා දරන්නට සිදුවන වෙනත් වියදම් ඇතොත් ඒ වියදම් ද එහි මුදල් වලින් ගෙවිය යුතුය.

(6) ලියාපදිංචි කළ සමිතියක කටයුතු පාලනය කිරීම සඳහා මේ වගන්තිය යටතේ පත් කරනු ලැබ (1) වැනි උප වගන්තියේ (ආ) ඡේදය යටතේ වූ විධානය බල පැවැත්වීම නතර වන දිනයට පෙරාතුව වූ දිනයෙහි ධූරය දරමින් සිටින තැනැත්තා හෝ තැනැත්තන් විසින් එකී දිනයට පෙර සමිතියේ අතුරු ව්‍යවස්ථා අනුව අලුත් කාරක සභාවක් පත් කිරීමට කටයුතු පිළියෙල කිරීම ඔහුගේ හෝ ඔවුන්ගේ යුතුකම විය යුතුය.

(7) සමිතියේ ලියාපදිංචිය 49 වැනි වගන්තිය යටතේ අවලංගු කිරීමට රෙජිස්ට්‍රාර් සතු බලය කෙරෙහි මේ වගන්තියේ කිසිවක් බලපාන ලෙස නොසැලකිය යුතුය.

## X වන පරිච්ඡේදය

### *ලියාපදිංචි කළ සමිතියක් විසුරුවා හැරීම*

විසුරුවා හැරීම. 49 (1) 46 වැනි වගන්තිය යටතේ වූ විභාගයකින් හෝ පොත් පිළිබඳ පරීක්ෂණයකින් පසු ලියාපදිංචි කළ සමිතියක සාමාජිකයන්ගෙන් හතරෙන් තුන් කොටසක් විසින් හෝ සමිතියක මහ සභාව නියෝජිත මහ සභාවක් වන විටෙකදී එවැනි මහ සභාවක් නියෝජනය කිරීමට බලය ඇති සම්පූර්ණ නියෝජිත සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු නියෝජිත පිරිසකගේ ඉල්ලීම මත එය විසුරුවා හැරීම සඳහා කරනු ලබන ඉල්ලීමක් ලැබීමෙන් පසු හා තම විරෝධතා ඉදිරිපත් කිරීමට සමිතියට සහ ඒ සමිතියේ ණය හිමියන්ට අවස්ථාවක් ලබාදීමෙන් පසු, ඒ සමිතිය විසුරුවා හැරිය යුතුයයි රෙජිස්ට්‍රාර්වරයා අදහස් කරයි නම්, ඔහු විසින් තම අත්සන යටතේ වූ නියෝගයක් මගින්, ඒ සමිතියේ ලියාපදිංචිය අවලංගු කරනු ලැබිය හැකිය.

(2) ලියාපදිංචි කළ සමිතියක යම් සාමාජිකයෙකු විසින් හෝ යම් ණයහිමියකු විසින් (1) වැනි උප වගන්තිය යටතේ වූ නියෝගයක දිනයේ සිට මාස දෙකක් ඇතුළත ඒ නියෝගයට විරුද්ධව මධ්‍යම පළාතේ පළාත් සභාවේ සමුපකාර විෂයභාර අමාත්‍යවරයා වෙත අභියාචනා කළ හැකිය.

(3) සමිතියක ලියාපදිංචිය අවලංගු කරමින් නියෝගයක් නිකුත් කිරීමේ දින සිට මාස දෙකක් ඇතුළත කිසිම අභියාචනයක් ඉදිරිපත් කරනු නොලැබූ අවස්ථාවක ඒ නියෝගය ඒ කාලය ගතවූ විට ක්‍රියාත්මක විය යුතුය. මාස දෙකක් ඇතුළත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක නියෝගය ස්ථිර කරනු ලබන තෙක් ඒ නියෝගය බල නොපැවැත්විය යුතුය.

(4) සමිතියක ලියාපදිංචිය රෙජිස්ට්‍රාර් විසින් 49(1) වැනි උප වගන්තිය යටතේ අවලංගු කරනු ලබන අවස්ථාවක, සමිතියේ ලියාපදිංචිය අවලංගු කිරීමේ නියෝගය ක්‍රියාත්මක වන තෙක් හෝ අභියාචනයක දී මධ්‍යම පළාතේ පළාත් සභාවේ සමුපකාර විෂයභාර අමාත්‍යවරයා විසින් ඒ නියෝගය අවලංගු කරනු ලබන තෙක් සමිතියේ පොත්, ලේඛන හා වෙනත් දේපළ භාරව සිටීමට හා ඒ සමිතියේ කටයුතු පාලනය කිරීම සඳහා එක් තැනැත්තෙකු හෝ තැනැත්තන් වැඩි ගණනනක් රෙජිස්ට්‍රාර් විසින් පත්කළ හැකිය.

ඒ තැනැත්තා හෝ තැනැත්තන් පත්කරනු ලැබූ විට සමිතියේ කාරක සභාව විසින් හෝ සමිතියේ පොත්, ලේඛණ හා වෙනත් දේපළ භාරව සිටින වෙනයම් තැනැත්තෙකු විසින් ඒ පොත් ලේඛන හෝ දේපළ පළමු සඳහන් තැනැත්තා හෝ තැනැත්තන් වෙත භාරදිය යුතු අතර ලියාපදිංචිය අවලංගු කිරීමේ නියෝගය ක්‍රියාත්මක වන තුරු හෝ මධ්‍යම පළාතේ පළාත් සභාවේ සමුපකාර විෂයභාර අමාත්‍යවරයා විසින් අභියාචනයක දී ඒ නියෝගය අවලංගු කරනු ලබන තෙක් ඒ කාරක සභාව අක්‍රිය විය යුතුය.

සමිතියක ලියාපදිංචිය අවලංගු කිරීම. 50 යම් ලියාපදිංචි කළ සමිතියක ලියාපදිංචිය;

(අ) යම් සමිතියක් ලියාපදිංචි කිරීමේ දී සමුපකාර නීතියට අනුව කොන්දේසියක් ලෙස මෙම ප්‍රඥප්තියේ 4(1)අ වගන්තිය ප්‍රකාරව අවම වශයෙන් සිටිය යුතු සාමාජික සංඛ්‍යාවට වඩා ලියාපදිංචි සමුපකාර සමිතියක සාමාජික සංඛ්‍යාව අඩුවී ඇත්නම් හෝ

(ආ) සමිතිය ලියාපදිංචි කළ දින සිට අවුරුදු එකක කාල පරිච්ඡේදයක් තුළ ඒ ලියාපදිංචි කළ සමිතිය වැඩ ආරම්භ කොට නැත්නම් හෝ මේ වගන්තිය යටතේ අවලංගු කිරීමේ නියෝගය පැනවීමේ දිනයට පෙර අවුරුදු දෙකක කාල පරිච්ඡේදයක් තුළ සමිතිය අක්‍රියව තිබෙන බවට රෙජිස්ට්‍රාර්වරයා විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලබන තැනැත්තෙකු විසින් සිදුකරනු ලබන සාමාන්‍ය හෝ විශේෂ පරීක්ෂණයකින් පසුව රෙජිස්ට්‍රාර්වරයා ගේ මතය වන අවස්ථාවක රෙජිස්ට්‍රාර් විසින් ලියවිල්ලකින් වූ නියෝගයක් මගින් අවලංගු කළ හැකිය

51 ලියාපදිංචි කළ සමිතියක, ලියාපදිංචිය 49 වැනි වගන්තිය හෝ 50 වැනි වගන්තිය යටතේ වූ නියෝගයකින් අවලංගු කරනු ලැබූ අවස්ථාවක මෙහි මින් මතු විසුරුවා හැරීමේ දිනය වශයෙන් සඳහන් කෙරෙන ඒ නියෝගය ක්‍රියාත්මක වන දින සිට ඒ සමිතිය සංස්ථාවක් ලෙස පැවතීම නතර විය යුතුය.

ලියාපදිංචිය අවලංගු කිරීමේ බලපෑම.

එසේ වුවද මේ ප්‍රඥප්තියෙන් හෝ මේ ප්‍රඥප්තිය යටතේ සමිතිය වෙත පැවරුණු යම් වරප්‍රසාද රෙජිස්ට්‍රාර් විසින් සමිතිය සඳහා පත් කරනු ලැබූ යම් ඈවරකරුවකු හෝ ඈවරකරුවන් වෙත පවරනු ලැබූ ලෙස සැළකිය යුතුය.

52 49 හෝ 50 වැනි වගන්තිය හෝ යටතේ සමිතියක් ලියාපදිංචිය අවලංගු කරනු ලැබූ අවස්ථාවක ඒ සමිතියේ ඈවරකරු හෝ ඈවරකරුවන් වශයෙන් එක් තැනැත්තකු හෝ තැනැත්තන් වැඩි ගණනක් රෙජිස්ට්‍රාර් විසින් පත් කළ හැකිය.

සමිතිය ලියාපදිංචිය අවලංගු කිරීමෙන් පසු ඈවර කිරීම.

අවස්ථාවෝචිත පරිදි 49 වැනි වගන්තිය හෝ 50 වැනි වගන්තිය යටතේ අවලංගු කිරීමේ නියෝගය ක්‍රියාත්මක වන දිනයේ සමිතියේ සියලුම දේපළ හා වත්කම් ඈවරකරු හෝ ඈවරකරුවන් වෙත පවරනු ලැබිය යුතුය.

53 (1) 52 වැනි වගන්තිය යටතේ පත් කරන ලද ඈවරකරුට රෙජිස්ට්‍රාර්ගේ මඟ පෙන්වීම හා පාලනයට හා 54 වැනි වගන්තිය යටතේ වූ නියෝගයක් මගින් රෙජිස්ට්‍රාර් විසින් නියම කරනු ලබන යම් සීමාකිරීම්වලට යටත්ව පහත සඳහන් කටයුතු කිරීමේ බලය තිබිය යුතුය.

ඈවරකරුවන්ගේ බලතල.

(අ) සමිතියේ වත්කම්වලට සමිතියේ සාමාජිකයන් හා හිටපු සාමාජිකයන් විසින් ගෙවිය යුතු හෝ සමිතියේ මියගිය සාමාජිකයන්ගේ බූදල්වලින් ලැබිය යුතු දායක මුදල් කලින් කල නිශ්චය කිරීම ;

(ආ) හිමිකම් කියාපෑම් සමිතියේ පොත්වල එතෙක් සටහන්වී නැති ණයහිමියන් විසින් සිය හිමිකම් කියාපෑම් ඇතුළත් කරවා ගැනීම සඳහා ඒවා ඉදිරිපත් කළ යුත්තේ හෝ ඒ හිමිකම් කියාපෑම් ඔවුන් විසින් තහවුරු කරනු ලැබීමට පෙර කෙරෙන වත්කම් බෙදා දීමෙන් ඒ ණයහිමියන් අත්හරිනු ලැබිය යුත්තේ යම් දිනයකට පෙර ද ඒ දිනය ප්‍රකාශනයකින් හෝ දැන්වීමකින් නියම කිරීම ;

(ඇ) ණයහිමියන් අතර උද්ගත වන ප්‍රමුඛත්වය පිළිබඳව යම් ප්‍රශ්නයක් මේ ප්‍රඥප්තියේ විධි විධානවලට අනුකූලව තීරණය කිරීම;

(ඈ) 58 වැනි වගන්තියෙහි සඳහන් යම් විස්තරයක යම් ආරවුලක් (සමිතිය සම්බන්ධයෙන් එහිවූ සඳහන් කිරීම් ඈවරකරු සම්බන්ධයෙන්වූ සඳහන් කිරීම් ලෙස තේරුම් ගෙන) ඒ වගන්තිය යටතේ බේරුම් කිරීම සඳහා යොමු කිරීම හා සමිතිය වෙනුවෙන් තමාගේ නමින් හෝ ධුරයෙන් සිවිල් නඩු හා වෙනත් නීති පැවරීම හා නීති කෘත්‍යවලදී ප්‍රතිවාද ඉදිරිපත් කිරීම ;

(ඉ) ඈවරකිරීමේ ගාස්තු කවර පුද්ගලයන් විසින් හා කවර ප්‍රමාණවලින් දැරිය යුතුද යන්න තීරණය කිරීම ;

(ඊ) සමිතිය ගණන් බේරා වසා දැමීමේදී අවශ්‍ය විය හැකි වත්කම් එකතුකිරීම සහ සමිතියේ ණයහිමියන් විසින් හිමිකම් ඉදිරිපත් කළයුතු ආකාරය සහ නිශ්චිත කාලසීමාවේදී වගකීම් පියවීමේ විධිමත් ක්‍රමවේදයක් රීතිවලින් නියම කරන ආකාරයට ඇති කිරීම හා ක්‍රියාත්මක කිරීම.

(උ) රෙජිස්ට්‍රාර්ගේ අනුමැතිය කලින් ලැබ ඇත්තේ නම් සමිතිය විසින් හෝ සමිතියට විරුද්ධව ඉදිරිපත් කරනු ලැබූ හිමිකම් කියාපෑම සමථයකට පත් කිරීම ;

(ඌ) ඈවර කිරීම නිසි ලෙස පැවැත්වීම සඳහා අවශ්‍ය විය හැකි සාමාජිකයන්ගේ මහා සභා රැස්වීම කැඳවීම ;

(එ) සමිතියේ පොත් ලේඛන හා වත්කම් තම සන්තකයට ගැනීම ;

(ඒ) සමිතියේ දේපළ විකිණීම ;

(ඔ) ඈවර කිරීම සම්බන්ධයෙන් රැස් කරන ලද සියලු මුදල් රෙජිස්ට්‍රාර්වරයා විසින් නියම කරනු ලබන යම් ආකාරයකින් තැන්පත් කිරීම;

(ඕ) රෙජිස්ට්‍රාර් විසින් වත්කම් බෙදාදීමේ යෝජනා ක්‍රමයක් අනුමත කරනු ලැබූ විට සමිතියේ වත්කම් පහසු ආකාරයකින් බෙදා දීම සඳහා කටයුතු පිළියෙල කිරීම;

(ක) වැඩදායී ලෙස ගණන් බේරා වසා දැමීම සඳහා අවශ්‍ය වියහැකිතාක් දුරට සමිතියේ කටයුතු පවත්වාගෙන යාම එසේ වුවද ණය දෙන සමිතියක ඈවරකරුට යම් ණය මුදල් නිකුත් කිරීම සඳහා මෙහි අඩංගු කිසිවකින් හිමිකම් නොලැබිය යුතුය.

(2) 49 වැනි වගන්තිය හෝ 50 වැනි වගන්තිය යටතේ ලියාපදිංචිය අවලංගු කරනු ලැබූ සමිතියක යම් සාමාජිකයෙකු හෝ කලින් සිටි සාමාජිකයෙකු විසින් යම් ණයක් ගෙවීමට ඇති හා ඒ තැනැත්තා ඒ අවලංගු කිරීම දිනයෙන් පසු මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කළ අන් කිසි සමිතියක සාමාජිකයෙකු වන අවස්ථාවක 52 වැනි වගන්තිය යටතේ පත් කරන ලද පළමු සඳහන් සමිතියේ ඈවරකරුට රෙජිස්ට්‍රාර්ගේ මඟ පෙන්වීම හා පාලනයට සහ 54 වැනි වගන්තිය යටතේ වූ නියෝගයක් මගින් රෙජිස්ට්‍රාර් විසින් නියම කරනු ලබන වෙන යම් සීමාකිරීම්වලටද යටත්ව ඒ තැනැත්තාට ඒ අන් සමිතියෙන් අයවිය යුතු මුදලෙන් ඒ ණයට වැඩි නොවන මුදලක් ඒ සාමාජිකයාගෙන් ඒ අන් සමිතියට අයවිය යුතු ණයක් වූවාක් මෙන් අය කොට ඒ මුදල ඈවරකරු වෙත යවන ලෙස ඒ අන් සමිතියට නියම කිරීමේ බලය තිබිය යුතුය.

(3) මේ ප්‍රඥප්තිය යටතේ පත් කරන ලද යම් ඈවරකරුවෙකුට ඒ වෙනුවෙන් සාදනු ලැබිය හැකි රීතිවලට යටත්ව මේ වගන්තියේ කාර්යයන් කරගෙන යාම පිණිස යම් බලතල අවශ්‍ය වන ප්‍රමාණයට, දිසා අධිකරණයක් සම්බන්ධයෙන් සිවිල් නඩු විධාන සංග්‍රහය යටතේ විධිවිධාන සලස්වා ඇති මාර්ගයෙන්ම හා (අවශ්‍ය විය හැකි පමණින්) ඒ ආකාරයටම පාර්ශ්වකරුවන් හා සාක්ෂිකරුවන් කැඳවීමට හා පැමිණ සිටීමට ඔවුනට බල කිරීමටත්, ලේඛන ඉදිරිපත් කරන ලෙස ඔවුනට බල කිරීමටත් බලය තිබිය යුතුය.

ඈවර කිරීම පාලනය කිරීමට රෙජිස්ට්‍රාර් සතු බලය.

54 (1) ඈවරකරු රෙජිස්ට්‍රාර්ගේ පාලනයට හා විධානයට යටත්ව සිය බලතල ක්‍රියාවේ යෙදවිය යුතු අතර,

(අ) ඈවරකරුවෙකු විසින් කරනු ලබන යම් නියෝගයක් පරිච්ඡින්න කොට හෝ වෙනස් කොට අවශ්‍ය කවර හෝ අළුත් නියෝගයක් කිරීම ද ;

(ආ) ඈවරකරුවකු ධුරයෙන් ඉවත් කිරීමට ද ;

(ඇ) සමිතියේ සියලුම පොත්, ලේඛන හා වත්කම් ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට ද ;

(ඈ) 53 වගන්තිය යටතේ වූ ඈවරකරුවකුගේ බලතල ලියවිල්ලකින් වූ නියෝගයකින් සීමා කිරීමට ද ;

(ඉ) ගණන් ඉදිරිපත් කරන ලෙස ඈවරකරුවකුට තම අභිමතය පරිදි නියම කිරීම ද ;

(ඊ) ඈවරකරුට ගණන් විගණනය කරවා ගැනීම හා සමිතියේ වත්කම් බෙදාදීමට බලය පැවරීමට ද ;

(ඌ) ඇවරකරුට පාරිශ්‍රමිකය ගෙවීමට නියෝග කිරීම හෝ

(ඌෟ) 53(1) (ඈ) උප වගන්තිය යටතේ බේරුම් කිරීමට යොමු කළ හැකි ආරවුලක් නොවන, ඇවරකරු හා යම් තෘතීය පාර්ශවකරුවෙකු හා අතර පවතින්නා වූ යම් ආරවුලක් පිළිබඳව බේරුම්කරු දෙන තීරණයෙන් බැඳී සිටීමට ඒ පාර්ශවකරු ලියවිල්ලකින් කැමැත්ත ප්‍රකාශ කරතහොත් බේරුම් කිරීම සඳහා යොමු කිරීමද, රෙජිස්ට්‍රාර් විසින් කළ හැකි ය.

(2) "අතිරික්ත අරමුදල" යනුවෙන් හැඳින්වෙන අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු අතර, ඇවරකරු විසින් රැස්කරනු ලබන සියළු මුදල් ඒ අරමුදලට බැර කළ යුතු ය. තව ද ඒ අරමුදල රීතිවලට අනුකූලව රෙජිස්ට්‍රාර්වරයා විසින් ක්‍රියාත්මක කළ යුතු ය.

55 (1) 54 වැනි වගන්තිය යටතේ තමා වෙත යොමු කරනු ලැබූ යම් කරුණක් සම්බන්ධයෙන් වූ බේරුම්කරුගේ තීරණයෙන් පාර්ශවකරුවන් බැඳී සිටිය යුතු අතර, ඒ වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර් විසින් කරනු ලැබූ නියෝගයක් ක්‍රියාත්මක කරන ආකාරයට ඒ තීරණය ක්‍රියාත්මක කළ හැකි විය යුතු ය. නියෝග ක්‍රියාත්මක කිරීම.

(2) බේරුම්කරුවෙකු විසින් හෝ රෙජිස්ට්‍රාර් විසින් 53 වැනි වගන්තිය හෝ 54 වැනි වගන්තිය යටතේ කරනු ලැබූ නියෝගයක් කිසිම සිවිල් අධිකරණයක දී ප්‍රශ්න නොකල යුතු අතර, ඒ සමිතියේ ලියාපදිංචි කරන ලද කාර්යාලය පිහිටි ස්ථානය සම්බන්ධයෙන් අධිකරණ බලය ඇති යම් සිවිල් අධිකරණයක් විසින් ඒ අධිකරණයේ තීන්දු ප්‍රකාශයක් ක්‍රියාත්මක කරන ආකාරයෙන් ඒ නියෝගය ක්‍රියාත්මක කළ යුතු ය.

එසේ වුව ද ලියාපදිංචිය අවලංගු කරනු ලැබූ සමිතියක ණය හිමියකු වන යම් බැංකුවකට, යම් ඇවරකරුවකුට හෝ රෙජිස්ට්‍රාර් විසින් 53 වන වගන්තිය හෝ 54 වැනි වගන්තිය යටතේ කරන ලද නියෝගයකට විරුද්ධව ඒ ඇවරකරුගේ හෝ රෙජිස්ට්‍රාර්ගේ නියෝගයේ දිනයේ සිට මාස දෙකක් ඇතුළත මධ්‍යම පළාතේ පළාත් සභාවේ සමුපකාර විෂයභාර අමාත්‍යවරයා වෙත අභියාචනා කිරීමට හිමිකම් තිබිය යුතු ය.

(3) 53 වැනි වගන්තිය හෝ 54 වැනි වගන්තිය යටතේ ඇවරකරුවෙකු විසින් හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් නියෝගයක් කිරීමෙන් පසු මාස දෙකක් අතුළත මධ්‍යම පළාතේ පළාත් සභාවේ සමුපකාර විෂයභාර අමාත්‍යවරයා වෙත කිසිම අභියාචනයක් ඉදිරිපත් කරනු නොලැබූ අවස්ථාවක ඒ ඇවරකරුගේ හෝ රෙජිස්ට්‍රාර්ගේ එම නියෝගය එම කාලපරිච්ජේදය ගතවීමෙන් පසු බල පැවැත්විය යුතු ය. මාස දෙකක් ඇතුළත මධ්‍යම පළාතේ පළාත් සභාවේ සමුපකාර විෂයභාර අමාත්‍යවරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක අමාත්‍යවරයා විසින් ස්ථිර කරනු ලබන තෙක් ඇවරකරුගේ හෝ රෙජිස්ට්‍රාර්ගේ නියෝගය බල නොපැවැත්විය යුතු ය.

56 මෙහි පෙරාතුව ප්‍රකාශිතවම විධිවිධාන සැලසුනු ප්‍රමාණයට හැර මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කළ සමිතියක් විසුරුවා හැරීමට අදාළ යම් කරුණක් සම්බන්ධයෙන් කිසිම සිවිල් අධිකරණයකට කිසිම අධිකරණ බලයක් නොතිබිය යුතු ය. සිවිල් අධිකරණයක අධිකරණ බලය සීමා කිරීම.

57 (1) ලියාපදිංචි අවලංගු කරන ලද සමිතියක් ඇවර කිරීමේදී සංචිත අරමුදල ඇතුළු අරමුදල් 39(2) වැනි වගන්තියේ විධි විධානවලට යටත්ව ප්‍රථම කොට ඇවර කිරීමේ ගාස්තුව සඳහා ද, ඊළඟට ආණ්ඩුවේ ණය, ආණ්ඩුව ඇප වූ ණය හා පළාත් සභාවේ ණය හා පළාත් සභාව ඇප වූ ණය ආපසු ගෙවීම සඳහා ද, ඉක්බිතිව සමිතියේ වෙනත් වගකීම් ඉටු කිරීම පිණිස ද, ඉක්බිතිව කොටස් ප්‍රාග්ධනය ගෙවීම පිණිස ද, ඉක්බිතිව සමිතියේ අතුරු ව්‍යවස්ථාවලින් අවසර ලැබෙන්නේ නම්, ලාභ බෙදනු නොලැබූ යම් කාල පරිච්ජේදයක් සඳහා අවුරුද්දකට සියයට හයකට නොවැඩි ප්‍රමාණයකින් ලාභාංශයක් ගෙවීම සඳහා ද, ලාභ පිළිබඳ සුදුස්සක් කරනු නොලැබූ යම් කාල පරිච්ජේදයක් වෙනුවෙන්, ඒ කාල පරිච්ඡේදය විසුරුවා හැරීමේ දිනයට පෙරාතුවම වූ අවස්ථාවක හා සාමාජිකයන්ට ප්‍රතිදානයක් ගෙවීම සඳහා ද යෙදවිය යුතු ය. ඇවර කිරීම අවසන් කිරීම.

(2) සමිතියක ඇවර කිරීම අවසන් කරනු ලැබූ හා ඒ සමිතියේ යම් ණය හිමියකු විසින්, වත්කම් බෙදා දීමේ යෝජනා ක්‍රමය යටතේ තමාට අයවිය යුතු දේ සම්බන්ධයෙන් හිමිකම් කියාපෑමක්

ඉදිරිපත් කරනු නොලැබූ හෝ ඒ දෙය ඔහුට නොලැබුණ විට ඇවර කිරීම අවසන් කිරීමේ දැන්වීම *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු ය. තව ද ඒ සමිතියේ අරමුදල් සම්බන්ධයෙන් වූ යම් හිමිකම් කියා පෑමක් පිළිබඳව කිසිම නඩුවක් එය ඒ දැන්වීම *ගැසට් පත්‍රයේ* පළ කිරීමේ දින සිට මාස තුනක් ඇතුළත ආරම්භ වන්නේ නම් මිස පවත්වාගෙන නොයා යුතු ය.

(3) (1) වැනි උප වගන්තියෙහි නිශ්චිතව සඳහන් කර්යයන් සඳහා සහ (2) වැනි උප වගන්තිය යටතේ නඩුවක් පවරනු ලැබූ යම් හිමිකම් කියාපෑම් ගෙවීම සඳහා මුදල් යෙදීමෙන් පසු ඉතිරි වන යම් අතිරික්තයන් ඒ සමිතිය විසුරුවා හැරීමේ දිනයෙහි එහි නිලධරයන්ව සිටි තැනැත්තන් විසින් රෙජිස්ට්‍රාර්ගේ අනුමැතියට යටත්ව තෝරාගත හැකි යම් ප්‍රාදේශීය හෝ මහජනෝපාකාර අරමුණක් සඳහා යෙදිය හැකි ය.

සමිතිය ඇවර කිරීමේ දිනයෙන් පසු මාස තුනක් ඇතුළත රෙජිස්ට්‍රාර් විසින් අනුමත කරනු ලැබූ ඉහත කී අරමුණක් තෝරා ගැනීම ඒ තැනැත්තන් පැහැර හැරියහොත් රෙජිස්ට්‍රාර් විසින් අතිරික්තය බැංකුවක හෝ ලියාපදිංචි කළ සමිතියක තැන්පත් කළ යුතු ය.

එසේ තැන්පත් කළ අතිරික්තය මේ ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා පිහිටුවනු ලැබිය හැකි අතිරික්ත අරමුදලකට ගෙවනු ලැබිය හැකි ය. රීතිවලින් විධිවිධාන සලස්වනු ලැබිය හැකි යම් කාර්යයන් සඳහා එසේ විධිවිධාන සලස්වනු ලැබිය හැකි අකාරයකින් ඒ අතිරික්ත අරමුදලින් මුදල් වියදම් කිරීම වාර්ෂිකව විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කරනු ලබන ඇස්තමේන්තුව අනුව රෙජිස්ට්‍රාර්වරයාට සිදුකළ හැකි ය.

එසේ වුව ද අතිරික්තයට එකතු වන යම් පොළියක් සමුපකාර අරමුදලට ගෙවනු ලැබිය හැකි ය.

## XI වැනි පරිච්ඡේදය

### *ආරවුල්*

ආරවුල් සමථයකට පත්කිරීම.

58 (1) ලියාපදිංචි කළ සමිතියක ව්‍යාපාරයකට සම්බන්ධ යම් ආරවුලක්,

(අ) සාමාජිකයන්, හිටපු සාමාජිකයන් සහ සාමාජිකයන්, හිටපු සාමාජිකයන් හා මියගිය සාමාජිකයන් මඟින් හිමිකම් කියා පාන තැනැත්තන් අතර හෝ සමිතියේ අතීත හෝ වර්තමාන නිලධරයන් හෝ සේවකයන් අතර හෝ මියගිය නිලධරයන්ගේ හෝ සේවකයන්ගේ උරුමකරුවන්ගේ හෝ නීත්‍යානුකූල නියෝජිතයන් අතර ; හෝ

(ආ) සාමාජිකයකු, හිටපු සාමාජිකයකු හෝ සාමාජිකයකු, හිටපු සාමාජිකයෙකු හෝ මියගිය සාමාජිකයෙකු මඟින් හිමිකම් කියාපාන තැනැත්තෙකු හා සමිතිය, එහි කාරක සභාව හෝ එහි අතීත හෝ වර්තමාන යම් නිලධරයකු හෝ සේවකයකු හෝ මියගිය යම් නිලධරයකු හෝ සේවකයකුගේ යම් උරුමකරුවෙකු හෝ නීත්‍යානුකූල නියෝජිතයෙකු අතර ; හෝ

(ඇ) සමිතිය හෝ එහි කාරක සභාව හා සමිතියේ අතීත හෝ වර්තමාන යම් නිලධරයෙකු හෝ සේවකයකු යම් මියගිය නිළධරයෙකුගේ හෝ සේවකයකුගේ යම් උරුමකරුවෙකු හෝ නීත්‍යානුකූල නියෝජිතයෙකු අතර ; හෝ

(ඈ) සමිතියේ හෝ එහි කාරක සභාව ; සහ

(i) ව්‍යාපාරය හෝ ඉන් කොටසක් ඒ සමිතියට පවරනු ලැබූ වෙනයම් සමිතියක සාමාජිකයකුව හෝ නිලධරයෙකුව හෝ සේවකයකුව සිටි යම් තැනැත්තෙකු ;

(ii) 1 අනු ඡේදයෙහි සඳහන් සමිතියේ සාමාජිකයෙකු හෝ හිටපු සාමාජිකයෙකු හෝ මියගිය සාමාජිකයෙකු මගින් හිමිකම් කියාපාන යම් තැනැත්තෙකු ;

(iii) 1 අනු ඡේදයෙහි සඳහන් සමිතියේ යම් නිළධරයෙකුගේ හෝ සේවකයකුගේ උරුමකරුවෙකු හෝ නීත්‍යානුකූල නියෝජිතයකු වන යම් තැනැත්තෙකු අතර ; හෝ

(ඉ) සමිතිය හා ලියාපදිංචි කළ අන්කිසි සමිතියක් අතර උද්ගත වන්නේ නම්, තීරණය සඳහා ඒ ආරවුල රෙජිස්ට්‍රාර් වෙත යොමු කරනු ලැබිය යුතු ය.

(ඊ) අතීත හෝ වර්තමාන සාමාජිකයකුගෙන්, නිලධරයෙකුගෙන් හෝ සේවකයකුගෙන් හෝ මියගිය සාමාජිකයකුගේ නිලධරයකුගේ හෝ සේවකයකුගේ යම් නම් කළ තැනැත්තකුගෙන්, උරුමකරුවකුගෙන් හෝ නීතිඥානුකූල නියෝජිතයකුගෙන් ලියාපදිංචි සමිතියකට අයවිය යුතු ණයක්, ඉල්ලීමක් හෝ අලාභයක් සඳහා ඒ සමිතිය විසින් ඉදිරිපත් කරනු ලැබූ හිමිකම් පෑමක් හෝ ලියාපදිංචි සමිතියකින් අතීත හෝ වර්තමාන නිලධරයකුගෙන් හෝ සේවකයකුගෙන් හෝ සාමාජිකයකුගෙන් සාමාජිකයකුට හෝ ලියාපදිංචි සමිතියකින් මියගිය සාමාජිකයකුගේ, නිලධරයකුගේ හෝ සේවකයකුගේ යම් නම් කළ තැනැත්තකුට, උරුමකරුවකුට හෝ නීත්‍යානුකූල නියෝජිතයකුට අයවිය යුතු යම් ණයක්, ඉල්ලීමක් හෝ අලාභයක් සඳහා ඉදිරිපත් කරනු ලැබූ හිමිකම් පෑමක් ඒ ණය හෝ අලාභය පිළිගත යුතු වුව ද, නොවුව ද මේ උප වගන්තියේ අර්ථානුකූලව සමිතියේ ව්‍යාපාරයට අදාළ ආරවුලක් ලෙස සැලකනු ලැබිය යුතු ය.

(2) රෙජිස්ට්‍රාර් විසින් (1) වන උපවගන්තිය යටතේ යොමු කිරීමක් ලැබීමෙන් පසු,

(අ) තමා විසින්ම ඒ ආරවුල සම්බන්ධයෙන් තීරණය කළ හැකිය; නැතහොත්

(ආ) ඒ පිළිබඳව සුදුස්සක් කිරීම සඳහා බේරුම්කරුවකු හෝ බේරුම්කරුවන් වෙත යොමු කළ හැකි ය.

(3) බේරුම්කරුගේ හෝ බේරුම්කරුවන්ගේ තින්දුවෙන් අතෘප්තියට පත් යම් පාර්ශවකරුවන් විසින්, එකී තීන්දුවට විරුද්ධව රෙජිස්ට්‍රාර්වරයා වෙත අභියාචනයක් කළ හැකි ය. එවැනි අභියාචනයක් ඊට හේතුද සමග ලිඛිතව එකී තීන්දුව ප්‍රකාශයට පත් කරන ලද දින සිට (සති අන්ත හා ප්‍රසිද්ධ නිවාඩු දිනයන් ද, තීන්දුව ප්‍රකාශයට පත් කරන ලද දිනයද හැර) දින තිහක් ඇතුළත ඉදිරිපත් කළ යුතු ය. තීන්දුව ප්‍රකාශයට පත් කරන ලද්දේ යම් පාර්ශවයකට විරුද්ධව ද ඒ පාර්ශවකරු විසින් අභියාචනයක් කරන කළ රුපියල් පන්සියයක් ද (රු.500/-) ඒ තීන්දු කරන ලද මුදලින් සියයට දහයක් ද (10%) යන දෙකෙන් වැඩි වටිනාකම එකී අභියාචනය සඳහා තැන්පත් මුදලක් වශයෙන් ඒ අභියාචනය සමග ඉදිරිපත් කළ යුතු ය. අභියාචනය සිදු කරන්නේ, යම් මුදලක් ඉල්ලා සිටින පාර්ශවකරුවෙකු විසින් නම්, රුපියල් පන්සියයක් ද (රු.500/-) ඒ ඉල්ලා සිටින මුදලින් සියයට දහයක් ද (10%) යන වටිනාකම් දෙකෙන් වැඩි වටිනාකම අභියාචනය සමග ඉදිරිපත් කළ යුතු ය. එසේ වුව ද, ඉහත කී කුමන පාර්ශවයක් විසින් හෝ තැන්පත් කළ යුතු අභියාචනා තැන්පත් මුදලේ වටිනාකම රුපියල් විසි පන් දහසක් (රු.25,000/-) ඉක්ම වන්නේ නම් තැන්පත් කළ යුතු අභියාචනා මුදලේ උපරිම වටිනාකම රුපියල් විසි පන් දහසකට (රු.25,000/-) සීමා විය යුතු අතර එම ප්‍රමාණය ඉහත කී විධිවිධාන අනුව නියමිත අභියාචනා තැන්පත් ලෙස පිළිගත යුතු ය.

ඉහත (3) උපවගන්තියේ විධිවිධානවලට අනුකූල නොවන අභියාචනා රෙජිස්ට්‍රාර්වරයා විසින් ප්‍රතික්ෂේප කළ යුතු ය.

(4) (3) වැනි උප වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර් වෙත යම් අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබූ කිසියම් පාර්ශවකරුවෙකුට, ඒ පාර්ශවකරු විසින්ම හෝ යම් නියෝජිතයකු මාර්ගයෙන් රෙජිස්ට්‍රාර් ඉදිරියේ පෙනී සිට ඒ අභියාචනය සම්බන්ධයෙන් කරුණු කියා සිටීමට හිමිකම් තිබිය යුතු ය.

(5) (2) වැනි උප වගන්තිය යටතේ හෝ (3) වැනි උප වගන්තිය යටතේ වූ අභියාචනයක දී රෙජිස්ට්‍රාර්ගේ තීරණය අවසානාත්මක විය යුතු අතර ඒ පිළිබඳව යම් සිවිල් අධිකරණයක දී ප්‍රශ්න නොකළ යුතු ය.

(6) (2) වැනි උප වගන්තිය යටතේ බේරුම්කරුවෙකුගේ හෝ බේරුම්කරුවන්ගේ තීන්දුව සම්බන්ධයෙන් (3) වැනි උප වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර් වෙත කිසිම අභියාචනයක් යොමු

කරනු නොලබන්නේ නම් හෝ එබඳු යම් අභියාචනයක් අත් හරිනු ලබන්නේ නම් හෝ ඉල්ලා අස්කර ගනු ලබන්නේ නම් ඒ තීන්දුව අවසානාත්මක විය යුතු අතර ඒ පිළිබඳව කිසිම සිවිල් අධිකරණයකදී ප්‍රශ්න නොකළ යුතු ය.

(7) මේ වගන්තිය යටතේ ආරවුලක විෂය වන යම් හිමිකම් කියාපෑමක් සම්බන්ධයෙන් කාලසීමා ආඥා පනතේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

(8) මේ වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර් වෙත යොමු කරනු ලැබූ ආරවුලක් ලියාපදිංචි කළ සමිතියක ව්‍යාපාරයට අදාළ ආරවුලක් ද යන්න පිළිබඳව යම් ප්‍රශ්නයක් උද්ගත වුවහොත් ඒ සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර්ගේ තීරණය අවසානාත්මක විය යුතු අතර, ඒ පිළිබඳව කිසිම සිවිල් අධිකරණයක දී ප්‍රශ්න නොකළ යුතු ය.

(9) මේ වගන්තියෙහි "සාමාජිකයා" යන්නට ආශ්‍රිත සාමාජිකයෙක් ද ඇතුළත් වේ.

තීරණය හෝ තීන්දුව ක්‍රියාත්මක කිරීම.

59 (1) 58 වැනි වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර් වෙත යොමු කරනු ලැබූ ආරවුලක් හෝ අභියාචනයක් සම්බන්ධයෙන් ඔහුගේ තීරණයකින් (මේ වගන්තියෙහි මින් මතු එය "තීරණයක්" යනුවෙන් හඳුන්වනු ලැබේ) හෝ ඒ වගන්තිය යටතේ බේරුම්කරුවෙකු වෙත යොමු කරනු ලැබූ ආරවුලක් පිළිබඳ වූත් ඒ වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර්වරයා වෙත යථා පරිදි අයාචනයක් ඉදිරිපත් කරනු නොලැබූත්, මේ වගන්තියේ මින් මතු "තීන්දුවක්" යනුවෙන් හඳුන්වනු ලබන තීන්දුවකින් කෙරෙන නිගමනය ඒ ආරවුලේ එක් පාර්ශවකරුවෙකුගෙන් ඒ ආරවුලේ අනෙක් පාර්ශවකරුට මුදලක් අයවිය යුතු බව වූත් ඒ මුදල ඊට සම්බන්ධ ගාස්තු හා පොළී ඇතොත් ඒවා සමඟ නොගෙවා ඇත්තා වූත්, අවස්ථාවක රෙජිස්ට්‍රාර් විසින්, ඒ මුදල අයවිය යුත්තේ පාර්ශවකරුවෙකුගෙන් ද මේ වගන්තියෙහි මින් මතු "පැහැර හරින්නා" යනුවෙන් හඳුන්වනු ලබන ඒ පාර්ශවකරු සම්බන්ධයෙන්

(අ) ගාස්තුව හා පොළිය ඇතොත් ඒ පොළිය ද සමග ඒ මුදල පිළිබඳව විස්තර හා පැහැර හරින්නාගේ නම අඩංගු සහතිකයක් ඒ පැහැර හරින්නා පදිංචිව සිටින හෝ ඒ පැහැර හරින්නාට අයත් යම් චංචල හෝ නිශ්චල දේපලක් පිහිටි යම් දිස්ත්‍රික්කයක අධිකරණ බලය ඇති දිසා අධිකරණයක් වෙත නිකුත් කිරීම ; හෝ

(ආ) ගාස්තුව හා පොළිය ඇතොත් ඒ පොළිය ද සමග අයවිය යුතු මුදල පිළිබඳ විස්තර හා පැහැර හරින්නාගේ නම හා අන්තිමට දැනගත් ඔහුගේ ව්‍යාපාරික හෝ පදිංචි ස්ථානය අඩංගු සහතිකයක් ඒ ස්ථානයේ පිහිටි කොට්ඨාශයෙහි අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත් අධිකරණය වෙත නිකුත් කිරීම කළ හැකි ය.

(2) (1) වැනි උප වගන්තියේ (අ) ඡේදය යටතේ දිසා අධිකරණයක් වෙත සහතිකයක් නිකුත් කරනු ලැබූ අවස්ථාවක එය ලැබීමෙන් පසු ඒ අධිකරණය විසින් ඒ පැහැර හරින්නාගේ සියලුම චංචල හෝ නිශ්චල දේපළ හෝ ඉන් යමක් හෝ ඒ මුදල අයකර ගැනීම සඳහා පිස්කල් විසින් අවශ්‍ය යයි සැළකිය හැකි ඉන් යම් කොටසක් තහනමට ගෙන විකුණන ලෙස පිස්කල්ට බලය පැවරෙන හා නියම කෙරෙන දේපළ තහනම් ඇස්කීසියක් පිස්කල් වෙත නිකුත් කරන ලෙස විධාන කළ යුතු ය. ඒ තහනමට ගෙන විකිණීම සම්බන්ධයෙන් සිවිල් නඩු විධාන සංග්‍රහයේ 226 හා 297 වැනි වගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

(3) (1) වැනි උප වගන්තියේ (ආ) ඡේදය යටතේ මහේස්ත්‍රාත්වරයෙකු වෙත සහතිකයක් නිකුත් කරනු ලැබූ අවස්ථාවක, මුදල් අයකර ගැනීම සඳහා පැහැර හරින්නාට විරුද්ධව වැඩිදුරටත් ක්‍රියා නොකළ යුත්තේ මන්දැයි හේතු දැක්වීම සඳහා මහේස්ත්‍රාත්වරයා විසින් ඒ පැහැර හරින්නා තමා ඉදිරියට කැඳවිය යුතු අතර, ප්‍රමාණවත් හේතු ඔහු විසින් නොදක්වන ලද්දේ නම් බන්ධනාගාර ගත කිරීමෙන් දඬුවම් කළ නොහැකි වුව ද, දඩයකින් පමණක් දඬුවම් කළ හැකි වරදකට ඒ පැහැර හරින්නන් සම්බන්ධයෙන් මහේස්ත්‍රාත්වරයා විසින් කරන ලද දණ්ඩන නියමයකින් නියම කෙරෙන දඩයක් ලෙස ඒ මුදල සලකනු ලැබිය යුතු ය. එවිට 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහයේ 291 වැනි වගන්තියේ (එහි (1) වැනි උප වගන්තියේ (අ) හා (ඇ) ජේද හැර) විධිවිධාන අදාළ විය යුතු අතර ඒ දණ්ඩන නියමය කරන අවස්ථාවේ දී ඒ වගන්තියේ විධිවිධාන අනුව මහේස්ත්‍රාත්වරයා විසින් කළ හැකිව තිබූ යම්

විධානයක් ඔහු විසින් කළ හැකිය. 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 291 වන වගන්තිය අනුව නියම කරනු ලැබූ දඬය පැහැර හරින්නකු 59(1)(ආ) වගන්තියේ නිශ්චිත සහතිකයෙහි සඳහන් යම් මුදල් ප්‍රමාණයක් ගෙවීමෙන් නිදහස් කරනු නොලැබිය යුතුය.

(4) රෙජිස්ට්‍රාර්, මේ වගන්තිය යටතේ සහතිකයක් නිකුත් කරන අවස්ථාවක ඒ පිළිබඳ නිවේදනයක් පෞද්ගලිකව භාර දීමෙන්, ලියාපදිංචි කළ තැපැලෙන් හෝ විදුලි පණිවුඩ මාර්ගයෙන් යැවීමෙන් පැහැර හරින්නා වෙත නිකුත් කළ යුතුය. එහෙත් පැහැර හරින්නාට ඒ නිවේදනය නොලැබීම හේතු කොට ගෙන මේ වගන්තිය යටතේ වූ නීති කෘත්‍ය අවලංගු නොවිය යුතුය.

(5) මේ වගන්තිය යටතේ වූ යම් නීති කෘත්‍යවලදී රෙජිස්ට්‍රාර්ගේ සහතිකයේ වූ යම් ප්‍රකාශයක නිවැරදි භාවය සළකා බැලීමට පරීක්ෂා කිරීමට හෝ ඒ පිළිබඳ තීරණය කිරීමට යම් දිසා අධිකරණයකට හෝ මහේස්ත්‍රාත් අධිකරණයටකට මේ වගන්තියේ කිසිවකින් බලය නොලැබිය යුතුය. නොහොත් නියම නොවිය යුතුය.

(6) (අ) (2) වන උප වගන්තිය යටතේ විකිණීමෙන් ලත් යම් මුදලක් හා (3) වන උප වගන්තිය යටතේ ගෙවන ලද හෝ අය කරන ලද යම් මුදලක් අවස්ථාවෝචිත පරිදි දිසා අධිකරණය හෝ මහේස්ත්‍රාත් අධිකරණය විසින් රෙජිස්ට්‍රාර්වරයා වෙත යැවිය යුතුය. රෙජිස්ට්‍රාර් විසින් ඒ මුදල සම්බන්ධයෙන් ආදාළ තීරණය හෝ තීන්දුව අනුව සුදුස්සක් කළ යුතුය.

(ආ) ඒ අනුව සුදුස්සක් කරන තුරු රෙජිස්ට්‍රාර්වරයා විසින් එම මුදල් රජයට ආදායම් ලැබෙන පරිදි රජයේ බැංකුවක තැන්පත් කළ යුතු අතර එයින් ලැබෙන පොළී ආදායම් වෙනම අරමුදලක් මඟින් කළමනාකරණය කිරීමේ බලය රෙජිස්ට්‍රාර්වරයා සතු වන්නේය.

(ඇ) පොළී ආදායම් අරමුදල්වල යෙදවීම සම්බන්ධයෙන් විධිවිධාන රීති මගින් නියම කිරීමේ බලය අමාත්‍යවරයා සතු වන්නේය. එසේ රීති පනවන තෙක් විෂයභාර අමාත්‍යංශයේ ලේකම්වරයාගේ අනුමැතියට යටත්ව එකී අරමුදල් කළමනාකරණය කළ යුතුය.

60 (1 ලියාපදිංචි කළ සමිතියක සාමාජිකත්වය සඳහා යම් තැනැත්තෙකු විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයක් ඒ සමිතිය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබූ අවස්ථාවක ඒ ප්‍රතික්ෂේප කිරීමට විරුද්ධව ඒ තැනැත්තා විසින් රෙජිස්ට්‍රාර් වෙත අභියාචනයක් කළ හැකිය. ඒ අභියාචනය සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර්ගේ තීරණය අවසානාත්මක විය යුතු අතර, එය පිළිපැදීමට සමිතිය බැඳී සිටිය යුතුය.

වෙනත් ඇතැම් කරුණු සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර් විසින් තීරණය කළ යුතු බව.

(2) ලියාපදිංචි කළ සමිතියක සාමාජිකයෙකු ඒ සමිතියේ ධූරයකට යථා පරිදි තෝරා පත් කර ගන්නා ලද්දේ ද යන්න සම්බන්ධයෙන් හෝ සාමාජිකයෙකු ඒ සමිතියේ සාමාජිකයෙකුව හෝ නිලධරයෙකුව සිටීම නතර වූයේද යන්න සම්බන්ධයෙන් හෝ සමිතියේ යම් මහා සභා රැස්වීමක් වලංගු ලෙස පවත්වනු ලැබුවේ ද යන්න සම්බන්ධයෙන් යම් ප්‍රශ්නයක් උද්ගත වන අවස්ථාවක ඒ ප්‍රශ්නය සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර් විසින් තීරණය කළ යුතු අතර ඔහුගේ තීරණය අවසානාත්මක විය යුතුය.

## XII පරිච්ඡේදය

### *රීති*

61 (1) මේ ප්‍රඥප්තියේ ප්‍රතිපත්ති හා විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හෝ බල ගැන්වීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි සියලු රීති මධ්‍යම පළාත් සභාවේ සමුපකාර විෂය භාර අමාත්‍යවරයා විසින් සෑදිය හැකිය.

(2) විශේෂයෙන්ම හා (1) වැනි උප වගන්තියෙන් පැවරුනු බලතලවල සාමාන්‍යත්වයට හානියක් නොමැතිව ඒ රීතිවලින් ;

(අ) සමිතියක් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කිරීමේදී අනුගමනය කළ යුතු කොන්දේසි හා ඒ ඉල්ලුම් කිරීම පිළිබඳ කාර්ය පටිපාටීන් ද ලියාපදිංචි කිරීම සඳහා ගෙවිය යුතු ගාස්තු ප්‍රමාණය පිළිබඳව සහ ලියාපදිංචිය අලුත් කිරීම සඳහා වන විධිවිධානයන් නියම කළ හැකිය.

(ආ) සාමාජිකයන් වශයෙන් ඇතුළත්වීම සඳහා ඉල්ලුම් කරන හෝ සාමාජිකයන් වශයෙන් ඇතුළත් කරගනු ලැබූ තැනැත්තන් විසින් අනුගමනය කළ යුතු කොන්දේසි නියම කළ හැකි අතර කලින් කල සාමාජිකයන් තොරා පත් කර ගැනීම හා ඇතුළත් කර ගැනීම හා සාමාජිකත්වයේ අයිතිවාසිකම් පාවිච්චි කිරීමට පෙර කළ යුතු ගෙවීම් හා ලබාගත යුතු සම්බන්ධතා සඳහා විධි විධාන සැලැස්විය හැකිය.

(ඇ) සාමාජිකයන් ඉල්ලා අස්වීම හා නෙරපීම සඳහා ද ඉල්ලා අස්වන හෝ නෙරපනු ලබන සාමාජිකයන්ට කළ යුතු ගෙවීම් සඳහා ද හිටපු සාමාජිකයන්ගේ වගකීම් සඳහා ද විධි විධාන සැලැස්විය හැකිය.

(ඈ) ලියාපදිංචි කළ සමිතියක සාමාජික සංඛ්‍යාව ඒ සමිතිය විසින් සීමා කළ හැකි ප්‍රමාණය නියම කළ හැකිය.

(ඉ) මියගිය සාමාජිකයකුගේ සම්බන්ධතාවයේ වටිනාකම නිශ්චය කළ යුතු අකාරය සඳහා ද ඒ සම්බන්ධතාවයේ වටිනාකම ගෙවිය හැකි හෝ පැවරිය හැකි තැනැත්තෙකු නම් කිරීම සඳහා ද විධි විධාන සැලැස්විය හැකිය.

(ඊ) මෙම ප්‍රඥප්තියේ 11 වැනි වගන්තියේ විධි විධාන වලට යටත්ව සාමාජිකයකු සතුව තිබිය හැකි ලියාපදිංචි කළ සමිතියක ප්‍රාග්ධනයේ වැඩිම කොටස් ගණන හෝ පංගුව නියම කළ හැකිය.

(උ) ණය හෝ මුදල් ණයවර සඳහා ඉල්ලුම් කරන සාමාජිකයන් විසින් කළ යුතු ගෙවීම්, අනුගමනය කළ යුතු කොන්දේසි හා ලියා අත්සන් කළ යුතු බැඳුම්කරවල, නීත්‍යානුකූල ලේඛනවල හෝ වෙනත් ලේඛනවල ආකෘති, දිය හැකි ණයවල හෝ ප්‍රදානය කළ හැකි ණයවල කාල සීමාව, තනි සාමාජිකයන්ට පනවනු ලැබිය හැකි උපරිම මුදල හා ඔවුන් සම්බන්ධයෙන් ඉඩ දෙනු ලැබිය හැකි වැඩිම ණයවර නියම කළ හැකිය.

(ඌ) සීමාරහිත වගකීම්වලින් යුත් සමිතියක සාමාජිකයින්ට ලාභ බෙදා දිය හැක්කේ යම් කොන්දේසිවලට යටත්ව ද ඒ කොන්දේසි හා සමිති විසින් ගෙවිය හැකි ලාභාංශ පිළිබඳ උපරිම ප්‍රමාණය නියම කළ හැකිය.

(එ) කොටස් මඟින් හෝ ඍණ පත්‍ර මඟින් හෝ වෙනයම් ආකාරයකින් අරමුදල් ලබාගත හැකි ආකාරය හා තැන්පතු සම්බන්ධයෙන් ගෙවිය හැකි පොළී ප්‍රමාණය විධිමත් කළ හැකිය.

(ඒ) සාමාජිකයන්ගේ මහා සභා රැස්වීම සඳහා ද ඒ රැස්වීම්වල කාර්ය පටිපාටිය සඳහා ද රැස්වීම්වල දී පාවිච්චි කළ යුතු බලතල සඳහා ද විධි විධාන සැලැස්විය හැකිය.

(ඔ) ලියාපදිංචි කළ සමිතියක සාමාජිකයකු, කළමනාකරණ කාරක සභාවේ හෝ ප්‍රාදේශීය හෝ ශාඛා කාරක සභාවක සාමාජිකයකු ලෙස තෝරා පත්කර ගැනීම සම්බන්ධයෙන් කාර්ය පටිපාටිය සහ තෝරාපත්කර ගැනීම සම්බන්ධයෙන් වූ නුසුදුසුකම් නියම කල හැකිය.

(ඕ) කාරක සභාවක සාමාජිකයන් හා වෙනත් නිලධරයන් පත් කිරීම, ඔවුන්ගේ සේවය අත්හිටුවීම හා ඔවුන් ඉවත් කිරීම සඳහා ද කාරක සභා රැස්වීම්වල කාර්ය පටිපාටිය සඳහා ද කාරක සභාව හා වෙනත් නිලධරයන් විසින් පාවිච්චි කළ යුතු බලතල හා ඉටු කළ යුතු යුතුකම් සඳහා ද විධි විධාන සැලැස්විය හැකිය.

(ක) සමිතියක් විසින් අතුරු ව්‍යවස්ථා සෑදිය හැකි හෝ සෑදිය යුතු කරුණු සහ අතුරු ව්‍යවස්ථා සෑදීමේ දී, වෙනස් කිරීමේ දී හා පරිච්චින්න කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය ඒ අතුරු ව්‍යවස්ථා පැනවීමට වෙනස් කිරීමට හෝ පරිච්චින්න කිරීමට පෙර සපුරාලිය යුතු කොන්දේසි නියම කළ හැකිය.

(ග) ලියාපදිංචි කළ හැකි සමිතියක් විසින් තැබිය යුතු ගණන් හා පොත් සහ ලියාපදිංචි කළ සමිතියක වත්කම් හා බැරකම් පෙන්නුම් කරන ශේෂ පත්‍රයක් කලින් කල පළ කිරීමට නියම කළ හැකිය.

(ජ) ලියාපදිංචි කළ සමිතිවල ගණන් විගණනය කිරිම සඳහා සහ ඒ විගණනය සඳහා ගෙවිය යුතු යම් ගාස්තු ඇතොත් ඒ ගාස්තු ගෙවීම සඳහා විධි විධාන සැලැස්වීම ද පවත්නා සමිති විගණනය කිරීම, ඒවා පරිපාලනය කිරීම සහ ඒවාට සහය දීම සඳහා ද සමුපකාර ප්‍රචාරක කටයුතු සඳහා ද සමුපකාර අධ්‍යාපනය හා පුහුණුව සඳහා ද පාවිච්චි කිරීම පිණිස සමුපකාර අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලකට සියලුම ලියාපදිංචි කළ සමිතිවලින් හෝ එවැනි යම් සමිතිවලින් දායක මුදල් අය කිරීමට විධි විධාන සැලැස්වීම ද ඒ අරමුදලේ පරිපාලනය සඳහා විධි විධාන සැලැස්විම ද කළ හැකිය.

(ච) ලියාපදිංචි කරන ලද සමිති විසින් රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කළ යුතු වාර වාර්තා සහ ඒ වාර වාර්තා ඉදිරිපත් කළ යුතු තැනැත්තන් හා අකාරය නියම කළ හැකිය.

(ට) ලියාපදිංචි කළ සමිති සතු පොත්වල ඇතුළත්ව ඇති සටහන් වල පිටපත් සහතික කළ හැකි තැනැත්තන් හා අකාරය සඳහා විධි විධාන සැලැස්විය හැකිය.

(ඩ) සාමාජිකයන්ගේ නාම ලේඛනයක් සහ සාමාජිකයන්ගේ වගකීම් කොටස්වලින් සීමාසහිත වූ අවස්ථාවක කොටස් පිළිබඳ නාම ලේඛණයක් සකස් කොට පවත්වාගෙන යාම සඳහා ද විධි විධාන සැලැස්විය හැකිය.

(ණ) සංචිත අරමුදල් ඇතිකොට පවත්වාගෙන යාම හා ඒ අරමුදල් යෙදිය හැකි පරමාර්ථ සඳහා ද ලියාපදිංචි කළ සමිතියක පාලනය යටතේ ඇති යම් අරමුදල් ආයෝජනය කිරීම සඳහා ද විධි විධාන සැලැස්විය හැකිය.

(ත) සමිතියක් වෙත හෝ ඒ මාර්ගයෙන් ද්‍රව්‍ය විකිනීමට අදාළ යම් අතුරු ව්‍යවස්ථාවක් හෝ ගිවිසුමක් කඩ කිරීමක් පිළිබඳ යම් ප්‍රශ්නයක් නිශ්චය කළ හැකි ආකාරය හා එබඳු යම් කඩ කිරීමක් නිසා ප්‍රමාණ කළ අලාභය නිශ්චය කළ හැකි හෝ තක්සේරු කළ හැකි ආකාරය නියම කළ හැකිය.

(ද) බේරුම්කරුවකු හෝ බේරුම්කරුවන් පත් කිරීමේ ක්‍රමය හා රෙජිස්ට්‍රාර් හෝ ඒ බේරුම්කරු හෝ බේරුම්කරුවන් ඉදිරියෙහි පැවැත්වෙන කෘත්‍යන්හිදී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය හා රෙජිස්ට්‍රාර්ගේ තීරණය හෝ බේරුම්කරුවන්ගේ තීන්දු ක්‍රියාත්මක කළ යුතු ආකාරය නියම කළ හැකිය.

(න) ආණ්ඩුවෙන් හෝ පළාත් සභාවෙන් මුදල් ආධාර සඳහා ඉල්ලුම් කරන ලියාපදිංචි සමුපකාර සමිතියක් විසින් පිළිපැදිය යුතු කොන්දේසි නියම කළ හැකිය.

(ප) රෙජිස්ට්‍රාර් විසින් කරන ලද නියෝගවලට විරුද්ධව අමාත්‍යවරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි විය යුතු වූද, මේ ප්‍රඥප්තිය යටතේ ප්‍රකාශිතව ම විධි විධාන සලස්වා නැත්තා වූද කරුණු නිශ්චය කළ හැකිය.

(බ) 52 වැනි වගන්තිය යටතේ පත් කරනු ලැබූ ඈවරකරුවෙකු විසින් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය හා ඒ ඈවරකරුගේ නියෝගවලට විරුද්ධව අභියාචනා ඉදිරිපත් කළ හැකි විය යුතු අවස්ථා නියම කළ හැකිය.

(ම) 57 වැනි වගන්තියෙහි සඳහන් අතිරික්ත අරමුදලක් පිහිටුවා පවත්වාගෙන යාම සඳහා විධි විධාන සැලැස්වීම හා ඒ අරමුදලේ මුදල් වියදම් කළ හැකි ආකාරය හා කාර්යයන් නියම කිරීම කළ හැකිය.

(ය) 59 වන වගන්තිය අනුව රෙජිස්ට්‍රාර්වරයාගෙන් අභියාචන, උසාවි දඩ මුදල්වලට අදාළව තැන්පත් ගිණුම් ඇති කිරීම හා පොළී අරමුදලක් පිහිටුවීම හා ඒවා කළමනාකරණය සඳහා විධිවිධාන සැලැස්වීමට රීති නියම කළ හැකිය. එතෙක් විෂයභාර අමාත්‍යාංශ ලේකම්වරයා ගේ නියමයන් පරිදි රෙජිස්ට්‍රාර්වරයා අවශ්‍ය විධිවිධාන සකස් කළ යුතුය.

(ර) 42 (ආ) වගන්තිය අනුව පිහිටුවනු ලබන සමුපකාර සංවර්ධන අරමුදල කළමනාකරණය සඳහා රීති මඟින් විධිවිධාන සැලැස්විය යුතුය. එතෙක් විෂයභාර අමාත්‍යාංශ ලේකම්වරයා ගේ නියමයන්ට යටත්ව අවශ්‍ය විධිවිධාන රෙජිස්ට්‍රාර්වරයා විසින් සකස් කළ යුතුය.

(ල) මේ ප්‍රඥප්තිය යටතේ හෝ ඒ යටතේ සාදනු ලැබූ රීති යටතේ අභියාචනා ඉදිරිපත් කිරීම, ඇසීම හා ඒ පිළිබඳ සුදුස්සක් කිරීම සම්බන්ධයෙන් පාවිච්චි කළ යුතු ආකෘති, ගෙවිය යුතු වෙනත් ගාස්තු, පිළිපැදිය යුතු කාර්ය පටිපාටිය හා ඒවාට සම්බන්ධ හෝ අනුශාංගික වෙනත් සියලු කරුණු නියම කිරීම කළ හැකිය.

(ව) සමිතිය ගණන් බේරා වසා දැමීමේ දී අවශ්‍ය විය හැකි වත්කම් එකතු කිරීම සහ සමිතියේ ණයහිමියන් විසින් හිමිකම් ඉදිරිපත් කළයුතු ආකාරය සහ නිශ්චිත කාලසීමාවේ දී වගකීම් පියවීමේ විධිමත් ක්‍රමවේදයන් නියම කල හැකිය.

(ස) 43(4) වගන්තිය පරිදි සමිතියේ ගිණුම් සකස් කිරීම සඳහා අතිරේකව වැය වූ මුදල් එම කාර්යය පැහැර හරින ලද තැනැත්තන්ගෙන් අයකර ගැනීමට අදාළ විධිවිධාන නියම කල හැකිය.

(ශ) 63 වගන්තිය යටතේ සමුපකාර බැංකු හා මූල්‍ය කටයුතු නියාමනය සඳහා ප්‍රතිපත්ති සම්පාදනය, නියාමන මණ්ඩලයේ කාර්යයන් නියම කිරීම හා ඊට අදාළ මාර්ගෝපදේශ කාර්ය පටිපාටික රීති හා නියෝග නියම කිරීම කල හැකිය.

(3) (අ) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම රීතියක් ම *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ දින සිට හෝ ඒ රීතියේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනක සිට හෝ ක්‍රියාත්මක විය යුතුය.

(ආ) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම රීතියක් ම *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු අතර එසේ පළ කිරීමෙන් පසු මසක් ඇතුළත පළාත් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.

(ඇ) පළාත් සභාව විසින් සම්මත කරනු නොලැබූ යම් රීතියක් එකී අනනුමත දිනයේ සිට එකී රීතිය යටතේ කලින් කරන ලද ක්‍රියාවකට ඉන් හානියක් නොවන පරිදි පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතුය. යම් රීතියක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය *ගැසට් පත්‍රයකින්* නැවත ප්‍රකාශයට පත් කළ යුතුය.

3 වන උපවගන්තියේ නියමිත නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ කිරීමෙන් පසු සෑම රීතියක් ම මෙහි පනවනු ලැබූවාක් මෙන් වලංගු හා බල සහිත විය යුතුය.

## XIII වැනි පරිච්ඡේදය

### *ආණ්ඩුවට අයවිය යුතු ණය*

ආණ්ඩුවට සහ පළාත් සභාවට අයවිය යුතු මුදල් අයකර ගැනීම.

62 (1) ලියාපදිංචි කළ සමිතියකින් හෝ ලියාපදිංචි කළ සමිතියක යම් නිළධරයෙකුගෙන් හෝ සාමාජිකයෙකුගෙන් හෝ එහි හිටපු සාමාජිකයෙකුගෙන් එම තත්වයෙන් ආණ්ඩුවේ ණය, පළාත් සභාවේ ණය හා ආණ්ඩුව ඇප වූ ණය හා පළාත් සභාව ඇප වූ ණය වෙනුවෙන් අය විය යුතු ණය හා 46 වැනි වගන්තිය යටතේ ආණ්ඩුවට ප්‍රදානය කරන ලද යම් ගාස්තුද

ඇතුලත්ව ආණ්ඩුවට අය විය යුතු සියළු මුදල්, ජනරජයට අය වියයුතු ණය අයකර ගැනීම සඳහා ආණ්ඩුවේ ණයකරු ආඥාපනත යටතේ විධිවිධාන සළස්වා ඇති ආකාරයෙන්ම අය කරගනු ලැබිය හැකි අතර 40(2) වෙනි වගන්තියේ විධිවිධානවලට යටත්ව අන්කිසි තැනැත්තෙකුට හෝ තැනැත්තන්ට අය වියයුතු මුදල්වලට ඉහලින් ඒවාට ප්‍රමුඛත්වය ලැබිය යුතුය.

(2) ලියාපදිංචි කළ සමිතියකින් ආණ්ඩුවට හා පළාත් සභාවට අයවිය යුතුව (1) වැනි උප වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් පළමුව සමිතියේ දේපළවලින් අය කරගත හැකිය. දෙවනුව සාමාජිකයන්ගේ වගකීම සීමා කරනු ලැබූ ලියාපදිංචි කළ සමිතියක් සම්බන්ධයෙන් වූ විට සාමාජිකයන්ගේ වගකීමේ සීමාවට යටත්ව සමාජිකයන්ගෙන්ද තෙවනුව අන් සමිති සම්බන්ධයෙන් වූ විට සමාජිකයන්ගෙන්ද අයකරගත හැකිය.

## XIV වෙනි පරිච්ඡේදය

### *සමුපකාර බැංකු හා මූල්‍ය කටයුතු නියාමනය*

63 (1) මධ්‍යම පළාතේ ලියාපදිංචි සමුපකාර සමිතිවල බැංකු සහ මූල්‍ය කටයුතු නියාමනය කිරීම සඳහා මෙහි මින්මතු නියාමන මණ්ඩලයක් යනුවෙන් හැඳින්වෙන මණ්ඩලයක් මධ්‍යම පළාතේ සමුපකාර විෂය භාර අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබිය යුතුය. එම නියාමන මණ්ඩලය පත්කරන තෙක් රෙජිස්ට්‍රාර්වරයා විසින් සමුපකාර බැංකු නියාමනය සඳහා නිකුත් කරනු ලබන නියෝග, උපදෙස් හා මගපෙන්වීම් අනුව කටයුතු කිරීම සමිතිවල වගකීම වේ. මූල්‍ය කටයුතු නියාමන මණ්ඩලය.

(2) (අ) (1) වැනි උපවගන්තිය යටතේ පත්කරනු ලබන නියාමන මණ්ඩලය සාමාජිකයින් හත්දෙනෙකුගෙන් සමන්විත වියයුතු අතර එය පහත පරිදි වේ.

(i) සමුපකාර සංවර්ධන කොමසාරිස් හා රෙජිස්ට්‍රාර්වරයා නිල බලයෙන්ම මෙම මණ්ඩලයේ සභාපති විය යුතුය.

(ii) වරලත් ගණකාධිකාරීවරයෙක්,

(iii) බැංකු කටයුතු පිළිබඳ සුදුසුකම්ලත් වෘත්තීය විශේෂඥයෙක්,

(iv) සමුපකාර දෙපාර්තමේන්තුවේ සහකාර හෝ උප කොමසාරිස්වරයෙක්,

(v) මධ්‍යම පළාතේ බැංකු සහ මූල්‍ය සේවා සපයන විවිධ සේවා සමුපකාර සමිති, මධ්‍ය පරිමාණ සමුපකාර සමිති හා කුඩා පරිමාණ සමුපකාර සමිති නියෝජනය කරමින් නියෝජිතයන් තිදෙනෙක්.

(ආ) (i) මෙම නියාමන මණ්ඩලයේ රැස්වීමක ගණ පූරණය මුළු සාමාජික සංඛ්‍යාවෙන් දෙකෙන් එකකට වැඩි විය යුතුය.

(ii) සාමාජිකයෙකුගේ මිය යාම, ඉල්ලා අස්වීම වැනි හේතු මත ධුරයක් හිස්වුවහොත් ඉතිරි කාල සීමාව සඳහා විෂයභාර අමාත්‍යවරයා විසින් නව සාමාජිකයන් පත්කල යුතුය.

(iii) විෂයභාර අමාත්‍යවරයා, ලිඛිත හේතු දැක්වීමකින් අනතුරුව අවශ්‍ය ඕනෑම අවස්ථාවකදී පත් කරන ලද මණ්ඩලයේ සාමාජිකයන් ඉවත් කළ හැකිය.

(3) නියාමන මණ්ඩලයේ කාර්යභාරය පහත සඳහන් පරිදි විය යුතුය.

(අ) මධ්‍යම පළාතේ සමුපකාර සමිතිවල බැංකු සහ මූල්‍ය සේවාවන් පිළිබඳව යහපාලනයක් හා මූල්‍ය පාලනයක් ඇති කිරීම.

(ආ) මූල්‍ය ශක්තිය තහවුරු කිරීම හා වර්ධනය කිරීම.

(ඇ) තැන්පත්වල සුරක්ෂිතභාවය ආරක්ෂා කිරීම.

(ඈ) සමුපකාර බැංකුවල මානව සහ භෞතික සම්පත් සංවර්ධනය.

(ඉ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කලින් කල නිකුත් කරනු ලබන නියෝග සහ මාර්ගෝපදේශයන් සුදුසු පරිදි මධ්‍යම පළාතේ සමුපකාර ව්‍යාපාරයට අදාල කර ගැනීම ;

සහ

ඉහත කරුණු සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සම්පාදනය කිරීම, ඊට අදාල මාර්ගෝපදේශ, රීති හා නියෝග ආදිය පැනවීමෙහිලා විෂයභාර අමාත්‍යවරයාට උපදෙස් ලබා දීම හා අධීක්ෂණය, ඇගයීම හා නියාමනය සහ එකී කරුණු සම්බන්ධයෙන් සමුපකාර කොමසාරිස් හා රෙජිස්ට්‍රාර්වරයා වෙත තොරතුරු සහ උපදෙස් ලබාදීම වේ.

(4) සමිති වෙතින් මාසිකව හෝ වාර්ෂිකව දායක මුදල් වශයෙන් අයකිරීමට නියාමන මණ්ඩලය හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් නියමකරනු ලබන අරමුදල් මඟින් රෙජිස්ට්‍රාර්වරයා විසින් පළාත් බැංකු නියාමන අරමුදලක් පවත්වාගත යුතුය. විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කරනු ලබන වාර්ෂික ඇස්තමේන්තුව පරිදි එකී අරමුදලේ වියදම් දැරීමට රෙජිස්ට්‍රාර්වරයාට බලය ඇත.

(5) මෙම වගන්තියෙන් පත්කරනු ලබන නියාමන මණ්ඩලය සඳහා විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නිශ්චය කරනු ලබන දීමනාවක් ගෙවනු ලැබිය හැකි අතර, එම දීමනා සඳහා වැය කරනු ලබන වියදම් පළාත් බැංකු නියාමන අරමුදලට වැය බරක් විය යුතුය.

## XV වෙනි පරිච්ඡේදය

### *විවිධ කරුණු*

ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් වූ නියමයන්ගෙන් යම් සමිතියක් නිදහස් කිරීමට අමාත්‍යවරයා සතු විශේෂ බලය.

64 මේ ප්‍රඥප්තියෙහි කුමක් සඳහන්ව ඇත ද එය නොතකා මධ්‍යම පළාතේ පළාත් සභාවේ සමුපකාර විෂය භාර අමාත්‍යවරයා විසින් එක් එක් අවස්ථාවෙහි විශේෂ ආඥාවකින් හා ඔහු විසින් නියම කළ හැකි යම් කොන්දේසිවලට යටත්ව, ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් මේ ප්‍රඥප්තියේ වූ නියමයන්ගෙන් යම් නියමයකින් යම් සමිතියක් නිදහස් කළ හැකිය.

මේ ප්‍රඥප්තියේ විධි විධාන වලින් සමිති නිදහස් කිරීමට අමාත්‍යවරයා සතු විශේෂ බලය.

65 මධ්‍යම පළාතේ පළාත් සභාවේ සමුපකාර විෂය භාර අමාත්‍යවරයා විසින් එක් එක් අවස්ථාවෙහි විශේෂ ආඥාවකින් හා ඔහු විසින් නියම කළ හැකි යම් කොන්දේසිවලට යටත්ව මේ ප්‍රඥප්තියේ වූ නියමයන්ගෙන් යම් නියමයකින්,
යම් සමිති පංතියක් ;
යම් සමිතියක්, නිදහස් කළ හැකිය.

සමිතියකට ලැබිය යුතු මුදල් ආපසු ගෙවීමට හෝ අන් දේපළක් ආපසු භාරදීමට රෙජිස්ට්‍රාර් විසින් නියම කළ හැකි බව නැතහොත් අධිභාර කළ හැකි බව

66 (1) ලියාපදිංචි කළ සමිතියක් සම්බන්ධයෙන් 44 වෙනි වගන්තිය යටතේ විගණනයකදී හෝ 46 වැනි වගන්තිය යටතේ විභාගයක දී හෝ පොත් පරීක්ෂා කර බැලීමේ දී හෝ 47 වන වගන්තිය යටතේ සමිතියක මුදල්, පොත්පත්, දේපල, ගිණුම්, ලේඛන පරීක්ෂා කිරීම හා එහි කටයුතු විමර්ශණය කිරීම හෝ ගණන් බේරා වසා දැමීමේදී ඒ සමිතිය සංවිධානය කිරීමෙහිලා හෝ එහි කළමනාකාරීත්වයෙහි ලා සහභාගී වූ මේ ප්‍රඥප්තියෙහි හෝ වෙනත් පනතක විධිවිධානවලට හෝ ඒ යටතේ සාදන රීතිවලට හෝ නියෝගවලට නැතහොත් සමිතියේ අතුරු ව්‍යවස්ථාවලට හෝ කාරක රීතිවලට හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් අනුමත කරන ලද මුදල් කාර්ය පරිපාටියට හෝ රෙජිස්ට්‍රාර්වරයා හෝ සමුපකාර සේවක කොමිෂන් සභාව

විසින් නිකුත් කරන ලද චක්‍රලේඛනයක හෝ යම් පොදු විධිවිධාන වලට පටහැනිව සමිතියේ අරමුදල් ප්‍රයෝජනයට ගත් යම් තැනැත්තකුගෙන් හෝ තැනැත්තන් කණ්ඩායමකින් හෝ ඒ සමිතියේ හිටපු හෝ දැනට සිටින යම් නිලධරයකුගෙන් හෝ සේවකයකුගෙන් ඒ සමිතියට යම් මුදලක් හෝ අන් දේපළක් ලැබිය යුතු බව පෙනෙන අවස්ථාවක අවස්ථාවෝචිත පරිදි රෙජිස්ට්‍රාර් විසින්, තමාගේ ඕනෑකම පිට හෝ සමිතියේ මහ සභාවේ, කාරක සභාවේ හෝ ඇවරකරුගේ හෝ ඉල්ලීම පිට ඒ තැනැත්තාගේ හෝ තැනැත්තන් කණ්ඩායමේ හෝ නිලධරයන්ගේ හෝ සේවකයන්ගේ ක්‍රියා කලාපය සම්බන්ධයෙන් පරීක්ෂා කර,

(අ) ඒ මුදල හෝ එහි කොටසක් රෙජිස්ට්‍රාර් විසින් සුදුසු යයි අදහස් කරනු ලබන පොළියත් සමඟ ආපසු ගෙවන ලෙස;

(ආ) ඒ අන් දේපල හෝ එහි කොටසක් ආපසු භාර දෙන ලෙස හෝ ;

(ඇ) සමිතියේ වත්කම්වලට රෙජිස්ට්‍රාර් විසින් සුදුසු යැයි අදහස් කරනු ලබන යම් දායක මුදලක් වන්දි වශයෙන් ගෙවන ලෙස ඔහුට හෝ ඒ කණ්ඩායමට නියම කරමින් නියෝගයක් කළ හැකිය. එවැනි යම් තැනැත්තකුට හෝ තැනැත්තන් කණ්ඩායමකට විරුද්ධව එබඳු යම් නියෝගයක් කිරීමට පෙර රෙජිස්ට්‍රාර් විසින්, ඒ නියෝගය නොකළ යුත්තේ මන්දැයි කරුණු කියා සිටීමට හා හේතු දැක්වීමට ඒ තැනැත්තාට හෝ තැනැත්තන් කණ්ඩායමට අවස්ථාවක් දිය යුතුය.

(2) ලියාපදිංචි කළ සමිතියකට යම් මුදලක් ආපසු ගෙවීම සඳහා හෝ එහි වත්කම්වලට යම් දායක මුදලක් වන්දි වශයෙන් ගෙවීම සඳහා (1) වන උප වගන්තිය යටතේ කරන ලද නියෝගයන් අනුව ක්‍රියා කර නොමැති අවස්ථාවක එම නියෝගයෙහි සඳහන් මුදල සහ ඊට අදාළ ගාස්තු හෝ පොළියක් ඇතොත් ඒවා ද ඇතුලත් සහතිකයක් මගින් එහි සඳහන් වටිනාකම අයකර ගැනීම සඳහා එම සමිතියේ ලියාපදිංචි කළ ව්‍යාපාර ස්ථානය පිහිටි හෝ නියෝග කරන ලද්දේ යම් තැනැත්තෙකුට හෝ තැනැත්තන් කණ්ඩායමකට හෝ යම් නිලධරයෙකුට හෝ සේවකයෙකුට විරුද්ධව ද ඒ තැනැත්තා හෝ තනැත්තන් කණ්ඩායම හෝ නිලධරයා හෝ සේවකයා පදිංචිව සිටින හෝ ව්‍යාපාරය කරගෙන යන ස්ථානය පිහිටි කොට්ඨාසය තුළ අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත්වරයා වෙත ඉල්ලුම් කරනු ලැබිය හැකිය. එසේ ඉල්ලීමක් කරනු ලැබූ කල්හි මහේස්ත්‍රාත්වරයා විසින් ඒ සහතිකයෙහි සඳහන් මුදල බන්ධනාගාර ගත කිරීමෙන් දඬුවම් කළ නොහැකි,

දඩයකින් පමණක් දඬුවම් කළ හැකි වරදක් සඳහා ඒ තැනැත්තා හෝ තැනැත්තන් කණ්ඩායම හෝ නිලධරයා හෝ සේවකයා සම්බන්ධයෙන් මහේස්ත්‍රාත්වරයාගේ දණ්ඩන නියමයකින් නියම කරන ලද දඩයක් වුවාක් මෙන් අයකරගනු ලැබිය හැකි අතර, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 291 වන වගන්තියෙහි (එම වගන්තියේ (1) වන උප වගන්තියේ (අ) සහ (ඇ) ඡේද හැර) විධි විධාන ඉනික්බිතිව අදාළ විය යුතුය. තවද ඒ දණ්ඩනය නියම කරන අවස්ථාවේදී ඒ වගන්තියේ විධි විධාන අනුව මහේස්ත්‍රාත්වරයා විසින් කළ හැකිව තිබූ යම් විධානයක් ද ඔහු විසින් කළ හැකිය. රෙජිස්ට්‍රාර් විසින් කරනු ලැබූ යම් නියෝගයක නිරවද්‍යතාවය මේ වගන්තිය යටතේ කිසිම නීති කෘත්‍යකදී සලකා බැලීමට, පරීක්ෂා කිරීමට හෝ තීරණය කිරීමට මහේස්ත්‍රාත්වරයාට මේ වගන්තියේ කිසිවකින් බලය ලැබීම හෝ නියම වීම සිදු නොවිය යුතුය.

(3) ඉහත (2) වැනි උප වගන්තියෙහි සඳහන් පරිදි අයකරගත් යම් මුදලක් මහේස්ත්‍රාත්වරයා විසින් අවස්ථාවෝචිත පරිදි මධ්‍යම පළාතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ රෙජිස්ට්‍රාර්වරයා වෙත යැවිය යුතු අතර, රෙජිස්ට්‍රාර්වරයා විසින් එම මුදල් සුදුසු පරිදි අදාළ සමුපකාර සමිතියේ අරමුදල වෙත යැවිය යුතුය.

(4) අන් කිසි ලිඛිත නීතියක් යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් (1) වැනි උප වගන්තියෙහි සඳහන් යම් තැනැත්තකුට හෝ තැනැත්තන් කණ්ඩායමකට හෝ නිලධරයෙකුට හෝ සේවකයකුට විරුද්ධව නඩුවක් පැවරීම හෝ පවත්වාගෙන යාම මේ වගන්තියේ පෙරාතුව වූ විධි විධාන හෝ ඒ යටතේ යම් නියෝගයක් කිරීම හේතු කොට ගෙන, වැළැක්වෙන ලෙස හෝ ඒ කෙරෙහි වෙනයම් අකාරයකින් බලපාන ලෙස සලකනු ලැබීම හෝ තේරුම් ගැනීම නොකළ යුතුය.

සාමාජිකයන් නම් කිරීම

67 (1) ලියාපදිංචි කළ සමිතියක කටයුතු කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීම සහ සහතික කිරීමේ කාර්යය සඳහා හෝ, පළාත් සභාව හෝ යම් රාජ්‍ය බැංකුවක් හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ විසින් එම ලියාපදිංචි කළ සමිතිය සම්බන්ධයෙන් කරනු ලබන යම් ආයෝජන හෝ ඊට මුදලින් හෝ බඩු වලින් දෙනු ලබන අත්තිකාරම් හෝ ආරක්ෂා කිරීමේ කාර්යය සඳහා, අවශ්‍ය යයි හෝ අවස්ථාවෝචිත යයි රෙජිස්ට්‍රාර්වරයා විසින් අදහස් කරනු ලබන අවස්ථාවක මේ ප්‍රඥප්තියේ හෝ වෙනත් යම් නීතියක හෝ ඒ ලියාපදිංචි කළ සමිතියේ අතුරු ව්‍යවස්ථාවල ඊට පටහැනිව කුමක් සඳහන් වුවද ඒ කාර්යය සඳහා අවශ්‍ය යයි හෝ අවස්ථාවෝචිත යයි ඔහු අදහස් කරන තැනැත්තන් සංඛ්‍යාවක් ඒ ලියාපදිංචි කළ සමිතියේ කාරක සභාවේ සාමාජිකයන් හැටියට හෝ කාරක සභාවක් නොමැති කල්හි පාලක මණ්ඩල සාමාජිකයන් වශයෙන් ඔහු විසින් නම් කළ හැකිය.

(2) (1) වන උප වගන්තිය යටතේ නම් කළ කාරක සභා සාමාජිකයන්ගේ සංඛ්‍යාව එම සමිතියේ අතුරු ව්‍යවස්ථානුකූලව කාරක සභාවේ සිටිය යුතු සාමාජිකයන් ගේ මුළු සංඛ්‍යාවෙන් අර්ධයකට අඩු විය යුතුය.

(3) (1) වන උප වගන්තිය යටතේ පාලක මණ්ඩල සාමාජිකයන් නම් කිරීමේ දී පාලක මණ්ඩල සාමාජිකයන් පස් දෙනෙකුට නොවැඩි තැනැත්තන් සංඛ්‍යාවක් පත්කළ හැකි අතර ඉන් දෙදෙනෙකුවත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විය යුතුය. සමිතියේ ලියාපදිංචි අතුරු ව්‍යවස්ථාවේ කුමක් සඳහන් වුවද මෙම වගන්තිය යටතේ පත්කරනු ලබන පාලක මණ්ඩලයක සණ පූර්ණය පත්කළ පාලක මණ්ඩලයේ සාමාජික සංඛ්‍යාවෙන් භාගයකට නොඅඩු විය යුතුය.

වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීම.

68 (4) ලියාපදිංචි සමුපකාර සමිතියක සභාපතිවරයා විසින් සහ කාරක සභාවේ සෑම සාමාජිකයෙක්ම විසින්, වාර්ෂිකව සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයා වෙත නියමිත ආකෘතියෙහි වූ වත්කම් හා බැරකම් ප්‍රකාශයන් ඒ ප්‍රකාශය කරන්නේ යම් වර්ෂයක් වෙනුවෙන්ද, ඒ වර්ෂයේ මාර්තු මස තිස්එක්වන දිනට පැවති පරිදි

(අ) ඔහුගේ සියළු වත්කම් හා බැරකම් පිළිබඳව;

(ආ) ඔහුගේ කාලත්‍රයාගේ සියළු වත්කම් හා බැරකම් පිළිබඳව;

(ඇ) ඔහුගේ එක් එක් දරුවාගේ සියළු වත්කම් හා බැරකම් පිළිබඳව;

කළ යුතුය.

(2) (1) වන වගන්තියේ සඳහන් ප්‍රකාශය, ලියාපදිංචි සමිතියක සභාපතිවරයා හෝ කාරක සභාවේ සෑම සාමාජිකයෙකු විසින්, සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයා වෙත අවස්ථාවෝචිත පරිදි ඒ සභාපතිවරයා හෝ කාරක සභාවේ සාමාජිකයා තෝරා පත්කර ගනු ලැබූ හෝ පත්කරනු ලැබූ දින සිට මාස තුනක් ඇතුළත ද ඔහු සභාපති ධූරය හෝ කාරක සභා සාමාජික ධූරය දැරීම නතර වුවහොත් මිස, ඔහු ප්‍රථම ප්‍රකාශය කළ වර්ෂයෙන් පසුව එළඹෙන එක් එක් අනුක්‍රමික වර්ෂයේ ජූලි මස පළමු වන දිනට පෙර ද කළ යුතුය.

(3) (2) වන උප වගන්තියේ නිශ්චිතව සඳහන් කාලවකවානු තුළ වත්කම් සහ බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කිරීම පැහැරහරිනු ලබන ලියාපදිංචි සමිතියක සභාපතිවරයා හෝ කාරක සභාවේ සෑම සාමාජිකයෙකුම එකී පැහැරහැරීම මත එම කරුණින්ම ඔහු ගේ හෝ ඇය ගේ සභාපති ධූරය හෝ කාරක සභික ධූරය අහෝසි වන්නේය.

ව්‍යාපෘති අරමුදල් ඇතිකිරීම සහ ක්‍රියාත්මක කිරීමට අදාළ විධිවිධාන

69 මධ්‍යම පළාතේ ලියාපදිංචි සමුපකාර සමිතිවල ආර්ථික, සමාජයීය හා භෞතික සංවර්ධනය සඳහා,

(i) විවිධ ව්‍යාපෘති සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සහ විවිධ ව්‍යාපෘති පවත්වාගෙන යාම සඳහා සමිති මෙහෙයවීම

(ii) විවිධ අරමුදල් ඇතිකොට පවත්වාගෙන යාම

(iii) රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන සමග සම්බන්ධීකරණය සිදුකොට අවශ්‍ය පහසුකම් ඇති කිරීම සහ සැපයීම

මධ්‍යම පළාතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ රෙජිස්ට්‍රාර්වරයා හෝ ඔහු විසින් ඒ සඳහා බලය පවරනු ලබන දිස්ත්‍රික් සහකාර සමුපකාර සංවර්ධන කොමසාරිස් විසින් සිදුකරනු ලැබීම නීත්‍යානුකූල විය යුතුය.

විශ්වාසය කඩ කිරීම සම්බන්ධයෙන් නිලධරයන් ආදීන්ගේ වගකීම.

70 ලියාපදිංචි කළ සමිතියක ගණන්, 44 වැනි වගන්තියේ විධිවිධාන සළස්වා ඇති පරිදි විගණනය කරනු ලැබීමෙන් පසුව හෝ 46 වැනි වගන්තිය යටතේ වූ විභාගයකින් හෝ, ලියාපදිංචි කළ සමිතියක පොත් පරීක්ෂා කර බැලීමෙන් පසුව හෝ 47 වන වගන්තිය යටතේ ලියාපදිංචි සමිතියක මුදල්, පොත්පත්, දේපළ, ගිණුම් හෝ වෙනත් ඕනෑම ලේඛනයක් පරීක්ෂා කිරීමෙන් හෝ විමර්ශනය කිරීමෙන් පසුව සමිතියේ නිලධරයකු හෝ සාමාජිකයකු හෝ සේවකයකු වශයෙන් වූ තම තත්වයෙන් යම් මුදලක් යම් බඩු හෝ දේපළ භාරව සිටින හෝ යම් අවස්ථාවක භාරව සිටි නැතහොත් ඒ මුදල්, බඩු හෝ දේපළ පිළිබඳ ආධිපත්‍යය ඇතිව සිටින හෝ යම් අවස්ථාවක ඇතිව සිටි හෝ තැනැත්තකු විසින් ඒ නිලධරයා, සාමාජිකයා හෝ සේවකයා වශයෙන් තමා ළඟ තබාගෙන සිටින හෝ තමාගෙන් අයවිය යුතු බවට තමා විසින් තබන ලද හෝ අත්සන් කරන ලද ගණන් පොත්වල හෝ ප්‍රකාශවල පෙන්නුම් කෙරෙන යම් මුදලක් හෝ එහි ශේෂයක් ගෙවන ලෙස හෝ ඉදිරිපත් කරන ලෙස හෝ එවැනි යම් බඩුවල හෝ දේපළවල වටිනාකම ගෙවන ලෙස හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ තැනැත්තාට නියම කිරීම නීත්‍යානුකූල විය යුතුය.

තවද එසේ නියම කරනු ලැබීමෙන් පසු ඒ තැනැත්තා විසින් ඒ මුදල හෝ එහි ශේෂය හෝ වහාම ගෙවීම හෝ ඉදිරිපත් කිරීම හෝ එම බඩුවල හෝ දේපළවල වටිනාකම ගෙවීම හෝ යථා පරිදි ඒ සඳහා ගණන් ඉදිරිපත් කිරීම පැහැර හැරියහොත් ඔහු සාපරාධී විශ්වාසය කඩ කිරීමේ වරදට වරදකරු වන අතර මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට අවුරුදු 10 ක් නොඉක්මවන කාල සීමාවකට දෙආකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමට යටත් විය යුතුවා මෙන්ම දඩයකට ද ඒ දඬුවම මහේස්ත්‍රාත්වරයෙකුගේ සාමාන්‍ය අධිකරණ බලය ඉක්ම වුවද ඔහු යටත් විය යුතුය.

යම් තොරතුරක් යනාදිය ඉදිරිපත් කරන ලෙස රෙජිස්ට්‍රාර් විසින් බංකුවට නියම කළ හැකි බව

71 (අ) අන්කිසි ලිඛිත නීතියක කුමක් සඳහන්ව ඇත ද එය නොතකා රෙජිස්ට්‍රාර් විසින් අවශ්‍යයයි ඔහු අදහස් කරන අවස්ථාවක

(ආ) යම් ලියාපදිංචි කළ සමිතියක් විසින් බැංකුව සමග කරනු ලබන ගණුදෙනු සම්බන්ධයෙන් යම් තොරතුරක් සපයන ලෙස ;

(ඇ) බැංකුව සමග පවතින ඒ සමිතියේ ගිණුම් පෙන්නුම් කරන පිටපතක් බැංකුව විසින් තබා ඇති ලෙජරයෙන් ඉදිරිපත් කරන ලෙස ; හෝ

(ඈ) සමිතියේ බැරට ගෙවන ලද හෝ සමිතිය විසින් පිටසන් කරන ලද යම් චෙක්පත් ඉදිරිපත් කරන ලෙස හෝ සමිතියක අතුරු ව්‍යවස්ථානුකූලව නිලධරයන් තෝරාපත්වීමේ ක්‍රියාවලිය නිසි ලෙස සිදු නොවූ බවට හෝ සිදු නොවන බවට මේ ප්‍රඥප්තියේ 46 වන වගන්තිය යටතේ සිදුකරනු ලබන විභාගයකින් හෝ පොත් පිළිබඳ පරීක්ෂණයකින් පසුව හෝ 47 වන වගන්තිය යටතේ සිදුකළ මුදල්, පොත්පත්, දේපළ, ගිණුම් හෝ වෙනත් ඕනෑම පරීක්ෂණයකින් හෝ විමර්ශනයකින් පසුව සමිතියේ අරමුදල් පිළිබඳව අවදානම් තත්ත්වයක් ඇති බවට රෙජිස්ට්‍රාර්වරයා විසින් අදහස් කරන අවස්ථාවක ඒ සමිතියේ නමින් පවත්වාගෙන යනු ලබන බැංකු ගිණුම් තාවකාලිකව අත්හිටුවන ලෙස යම් බැංකුවකට නියම කළ හැකිය.

## XVI වෙනි පරිච්ඡේදය

### *ඉවත් කිරීම හා අන්තර්කාලීන විධිවිධාන*

ඉවත් කරන ලද ප්‍රඥප්තිය යටතේ රෙගුලාසි හා පවතින සමිති

72 (1) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීමේ දී මේ දක්වා ක්‍රියාත්මක වූ ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත සහ මධ්‍යම පළාතේ 1993 අංක 04 දරන සමුපකාර සමිති (සංශෝධන) ප්‍රඥප්තියෙන් සංශෝධිත මධ්‍යම පළාතේ 1990 අංක 10 දරන මධ්‍යම පළාත් සමුපකාර සමිති ප්‍රඥප්තිය හෝ එම පනත හෝ ප්‍රඥප්තිය මගින් අවලංගු කරන ලද යම් ප්‍රඥප්තියක් යටතේ ලියාපදිංචි කරනු ලැබූ හෝ ලියාපදිංචි කරනු ලැබූ ලෙස සැළකෙන සෑම සමිතියක්ම මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ සමිතියේ අතුරු ව්‍යවස්ථා වෙනස් කරනු ලබන හෝ පරිච්ඡින්න කරනු ලබන තෙක් මේ ප්‍රඥප්තියේ ප්‍රකාශිත විධිවිධාන සමග ගැලපෙන පමණට අඛණ්ඩව බලපැවැත්විය යුතුය.

(2) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීමේදී මේ දක්වා ක්‍රියාත්මක වූ ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත සහ මධ්‍යම පළාතේ 1993 අංක 04 දරන සමුපකාර සමිති (සංශෝධන) ප්‍රඥප්තියෙන් සංශෝධිත මධ්‍යම පළාතේ 1990 අංක 10 දරන මධ්‍යම පළාත් සමුපකාර සමිති ප්‍රඥප්තිය හෝ එම පනත හෝ ප්‍රඥප්තිය මගින් අවලංගු කරන ලද යම් ප්‍රඥප්තියක් යටතේ සාදනු ලැබූ මේ ප්‍රඥප්තිය ආරම්භ වන අවස්ථාවේ බල පවත්නා සියලු රීති ඒවා මේ ප්‍රඥප්තියේ විධිවිධාන සමග ගැලපෙන පමණට මේ ප්‍රඥප්තිය යටතේ පනවනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ රීති වෙනුවට 61 වගන්තිය යටතේ අලුත් රීති සාදනු ලබන තෙක් ඒවා අඛණ්ඩව බලපැවැත්විය යුතුය.

(3) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීමේදී මේ දක්වා ක්‍රියාත්මක වූ ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත සහ මධ්‍යම පළාතේ 1993 අංක 04 දරන සමුපකාර සමිති (සංශෝධන) ප්‍රඥප්තියෙන් සංශෝධිත මධ්‍යම පළාතේ 1990 අංක 10 දරණ මධ්‍යම පළාත් සමුපකාර සමිති ප්‍රඥප්තිය හෝ එම පනත හෝ ප්‍රඥප්තිය මගින් අවලංගු කරන ලද යම් ප්‍රඥප්තියක් යටතේ කරන ලද හෝ කරනු ලැබූ ලෙස සැළකෙන සියළු පත් කිරීම්, කරනු ලැබූ හෝ කරනු ලැබූ ලෙස සැළකෙන සියළුම නියෝග, නිකුත් කරනු ලැබූ හෝ නිකුත් කරනු ලැබූ ලෙස සැළකෙන සියළුම නිවේදන හා දැන්වීම්, පවරනු ලැබූ හෝ පවරනු ලැබූ ලෙස සැළකෙන සියළුම සිවිල් නඩු හා වෙනත් නීති කෘත්‍ය හා පැන නැඟ ඇති සියළුම ආරවුල් මේ ප්‍රඥප්තිය යටතේ පිළිවෙලින් කරනු ලැබූ ලෙස, පවරනු ලැබූ ලෙස හා පැන නැඟ ඇති ලෙස සලකනු ලැබිය යුතුය.

මුදල් නීති පනත යටතේ රක්ෂිත තැන්පතුවලට ආදාල වත්කම්, බැරකම් පියවීම සඳහා විනා ප්‍රයෝජනයට නොගත යුතු බව.

73 යම් වර්ගයක බැංකු ව්‍යාපාරයක් පවත්වාගෙන යන යම් ලියාපදිංචි කළ සමිතියක් විසින් එහි තැන්පත් මුදල් නීති පනතේ V වැනි පරිච්ඡේදයේ II වැනි කොටස යටතේ රක්‍ෂණය කොට ඇති අවස්ථාවක ඒ කොටස යටතේ රක්ෂිත තැන්පතුවලට අදාල වත්කම්, මේ පනතේ අන් කිසි විධිවිධානයක කුමක් සඳහන්ව ඇත ද එය නොතකා ඒ තැන්පතුවලට අදාළ බැරකම් පියවීම නොවන වෙනයම් කාර්යයන් සඳහා ප්‍රයෝජනයට නොගත යුතුය.

නඩු පැවරීම් මෙහෙයවීම් කවුරුන් විසින් කළ යුතු ද.

74 ලියාපදිංචි කරන ලද සමිතියකට අදාල යම් කරුණක් සම්බන්ධයෙන් විමර්ශන පැවැත්වීම, විභාග කිරීම හා 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ XVII වැනි පරිච්ඡේදය යටතට වැටෙන නඩු පැවරීම් මෙහෙයවීම රෙජිස්ට්‍රාර්වරයා විසින් හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් බලය පැවරූ රජයේ නිලධාරියෙකු විසින් කිරීම නීත්‍යානුකූල වන්නේය.

ප්‍රඥප්තිය අනුව ක්‍රියා නොකිරීම සඳහා දණ්ඩනය.

75 (1) මේ ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා රෙජිස්ට්‍රාර් විසින් ඔහු විසින් ඒ වෙනුවෙන් යථා පරිදි බලය පවරනු ලැබූ අන් තැනැත්තෙකු විසින් හෝ බැංකු හා මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් හෝ නියම කරන ලද යම් ක්‍රියාවක් කිරීම හෝ යම් තොරතුරක් සැපයීම ඕනෑකමින්ම පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන සෑම ලියාපදිංචි කළ සමිතියක් හෝ එහි සිටි හෝ සිටින නිලධරයෙකු හෝ සේවකයෙකු හෝ සාමාජිකයෙකු සහ මේ ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ නිකුත් කරන ලද යම් කැඳවීමේ නියෝගයකට නියමයකට හෝ නීත්‍යානුකූල ලිඛිත නියෝගයකට ඕනෑකමින්ම හෝ යම් සාධාරණ හේතුවක් නොමැතිව අකීකරු වන හෝ

මේ ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ යම් තොරතුරක් සපයන ලෙස නියම කිරීමට බලය පවරනු ලැබූ තැනැත්තෙකු විසින් එසේ සැපයීමට නත්‍යානුකූලව නියම කරන ලද යම් තොරතුරක් සැපයීම පැහැර හරින සෑම තැනැත්තෙකුම සහ ඕනෑකමින් අසත්‍ය වාර්තාවක් ඉදිරිපත් කරන හෝ අසත්‍ය තොරතුරු සපයන සෑම ලියාපදිංචි කළ සමිතියක් හෝ එහි යම් නිලධරයෙකු හෝ සේවකයෙකු හෝ සාමාජිකයෙකු මේ ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු විය යුතුය.

(2) (1) වැනි උපවගන්තියේ සඳහන් වරදක් කරන සෑම තැනැත්තෙකුම මහෙස්ත්‍රාත්වරයෙකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට අවුරුදු දෙකක් නොඉක්මවන කාලසීමාවක් සඳහා බන්ධනාගාර ගත කිරීමකට හෝ රුපියල් විසිපන් දහස (රු.25,000/-) ක් නොයික්මවන දඩයකට හෝ බන්ධනාගාරගත කිරීම හා දඩය යන දෙකටම හෝ ඒ දඬුවම මහේස්ත්‍රාත්වරයෙකුගේ සාමාන්‍ය අධිකරණ බලය ඉක්මවුවද ඔහු යටත් විය යුතුය.

(3) ලියාපදිංචි කළ සමිතියක් විසින් මේ පනත යටතේ වූ වරදක් කරනු ලැබූ අවස්ථාවක කරන ලද වරද යම් යුතුකමක් කඩකිරීම වේද ඒ යුතුකම ඉටු කිරීමට අතුරු ව්‍යවස්ථාවලින් හෝ රීතිවලින් බැඳී සිටින එම සමිතියේ සෑම නිලධරයෙකුම හෝ එබඳු නිලධරයෙක් නොසිටී නම් කාරක සභාවේ සෑම සාමාජිකයෙකුම ඒ සාමාජිකයා ඒ වරද කිරීම ගැන නොදැන සිටි බව හෝ එය වැළැක්වීමට ප්‍රයත්න දැරූ බව ඔප්පු කරනු ලැබුවහොත් මිස ඔහු විසින් ඒ වරද කරන ලද්දේ නම් ඔහු යටත් විය යුතු වන දණ්ඩනයටම යටත් විය යුතුය.

76 මේ ප්‍රඥප්තිය යටතේ ස්වකීය කාර්යයන් ඉටු කිරීමේදී හෝ කර්තව්‍ය කිරීමේදී සද්භාවයෙන් කරන ලද හෝ කරන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර්වරයාට, නියෝජ්‍ය, ජ්‍යෙෂ්ඨ සහකාර, සහකාර කොමසාරිස්වරයන්ට මේ ප්‍රඥප්තියේ හා මෙම ප්‍රඥප්තියේ විධිවිධාන මගින් පනවනු ලැබූ රීති මගින් හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් යථා පරිදි බලය දෙන ලද හෝ පත් කරන ලද වෙනත් තැනැත්තකුට විරුද්ධව කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතුය.

රෙජිස්ට්‍රාර්වරයාගේ සහ ඔහු විසින් බලය පවරන තැනැත්තන්ගේ ක්‍රියා සම්බන්ධයෙන් ආරක්ෂාව.

77 (1) ''එක්සත් සහකාර '' යන වචන හෝ ''සමුපකාර'' යන වචනය හෝ දෙමළ භාෂාවෙන් ''අයික්කිය'' (ஐக்கிய) යන වචනය හෝ ''කූට්ටුරවු'' (கூட்டுறவு) යන වචනය හෝ ඉංග්‍රීසි භාෂාවෙන් ''කෝපරේටිව්'' (Co-operative) යන වචනය කොටසක් වන යම් නාමයක් හෝ අභිධානයක් යටතේ වෙළඳම් කිරීම හෝ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම ලියාපදිංචි කළ සමිතියක් නොවන කිසිම තැනැත්තෙකු විසින් මධ්‍යම පළාතේ පළාත් සභාවේ සමුපකාර විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය නොමැතිව නොකළ යුතුය.

''සමුපකාර'' යන වචනය පාවිච්චිය සීමා කිරීම.

එසේ වුවද 1921 සැප්තැම්බර් මස විසිදෙවැනි දිනට පෙර යම් තැනැත්තෙකු විසින් වෙළඳමක් කරගෙන යන ලද්දේ හෝ ව්‍යාපාරයක් පවත්වාගෙන යන ලද්දේ යම් නාමයක් හෝ අභිධානයක් යටතේ ද ඒ තැනැත්තා විසින් හෝ ඔහුගේ සම්බන්ධතාවයෙහි අනුප්‍රාප්තිකයා විසින් ඒ නාමය හෝ අභිධානය පාවිච්චි කිරීම සම්බන්ධයෙන් ඒ වගන්තියේ කිසිවක් අදාළ නොවිය යුතුය.

(2) මේ වගන්තියේ විධිවිධාන කඩ කරන කවර තැනැත්තෙකු වුවද මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් විසිපන්දහස (රු.25,000/-) ක් දක්වා විය හැකි දඩයකට හා වරද අඛන්ඩව පවත්වාගෙන යනු ලබන අවස්ථාවක් වූ විට ඒ වරදට වරදකරු කරනු ලැබීමෙන් පසු තවදුරටත් ඒ වරද කරගෙන යනු ලබන එක් එක් දිනය සඳහා රුපියල් දහස (රු.1,000/-) ක අතිරේක දඩයකටද යටත් විය යුතුය.

. 78 සමාගම් ආඥාපනතේ හා වෘත්තීය සමිති ආඥාපනතේ විධිවිධාන හා ඒ ආඥාපනත් සංශෝධනය කරන යම් ප්‍රඥප්තිවල විධිවිධාන මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබූ සමිතිවලට අදාළ නොවිය යුතුය.

සමාගම් ආඥාපනත හා වෘත්තීය සමිති ආඥාපනත අදාළ නොවිය යුතු බව.

1990 අංක 10 දරන මධ්‍යම පළාත් සමුපකාර සමිති ප්‍රඥප්තිය අවලංගු කිරීම.

79 මෙම ප්‍රඥප්තිය මධ්‍යම පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබී බලාත්මක වන දින සිට 1990 අංක 10 දරන මධ්‍යම පළාත් සභාවේ සමුපකාර සමිති ප්‍රඥප්තිය සහ 1993 අංක 04 දරන මධ්‍යම පළාත් සභාවේ සමුපකාර සමිති සංශෝධන ප්‍රඥප්තිය අවලංගු වූවා සේ සැලකිය යුතුය.

80 මේ ප්‍රඥප්තියේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

අර්ථ නිරූපනය

81 පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ ප්‍රඥප්තියෙහි "අතුරු ව්‍යවස්ථා" යන්නෙන් තත් කාලයෙහි බල පවත්නා ලියාපදිංචි කළ අතුරු ව්‍යවස්ථා අදහස් වන අතර එම අතුරු ව්‍යවස්ථාවල ලියාපදිංචි කළ සංශෝධන ද ඇතුළත් වේ.

"කාරක සභාව" යන්නෙන් ලියාපදිංචි කළ සමිතියක කටයුතු පිළිබඳ කළමනාකාරිත්වය භාර ගනු ලැබූ ඒ සමිතියේ පාලක මණ්ඩලය අදහස් වන අතර ලියාපදිංචි කළ සමිතියක අධ්‍යක්ෂ මණ්ඩලය හා 48 සහ 67 වන වගන්ති යටතේ රෙජිස්ට්‍රාර් විසින් පත් කරන ලද තැනැත්තෝද ඊට ඇතුළත් වෙති.

"නිලධරයා" යන්නට සමිතියක හෝ එහි යම් ශාඛාවක සභාපතිවරයා, උප සභාපතිවරයා, ලේකම්වරයා, භාණ්ඩාගාරික හෝ කළමනාකාරවරයා හෝ සමිතියක කාරක සභාවක සාමාජිකයෙකු හෝ සමිතියේ කටයුතු සම්බන්ධයෙන් විධාන දීමට යථා පරිදි බලය දෙනු ලැබූ වෙනත් තැනැත්තෙකු ඇතුළත් වේ.

බැංකුව යන්නෙන්;

(අ) මහජනයාගෙන් ඉල්ලුම් තැන්පත් මුදල් භාරගැනීමේ හෝ ඉල්ලුම් තැන්පත් මුදල් ඇතිකිරීමේ ව්‍යාපාරය ශ්‍රී ලංකාව තුළ කරගෙන යන නීතිගත කරනු ලැබූ හෝ නීතිගත කරනු නොලැබූ යම් පුද්ගලයෙක් හෝ පුද්ගල මණ්ඩලයක් ;

(ආ) ආණ්ඩුව වෙනුවෙන් ක්‍රියා කරන්නා වූ හා ණය දීම, අත්තිකාරම් දීම හෝ ආයෝජනය කිරීම කරන්නා වූ හෝ මහජනයාගෙන් මුදල් තැන්පත් භාරගන්නා වූ (යම් ලිඛිත නීතියක් මගින් හෝ යම් අකාරයකින් පිහිටුවනු ලැබූ) යම් නියෝජිත ආයතනයක් හෝ ආයතනයක් ;

(ඇ) ලංකාවේ සංවර්ධන මුදල් සංස්ථා පනත යටතේ පිහිටුවන ලද ලංකාවේ සංවර්ධන මුදල් සංස්ථාව ; හා

(ඈ) සමුපකාර සංවර්ධන විෂය භාර කැබිනට් අමාත්‍යවරයා විමසා මුදල් විෂය භාර කැබිනට් අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පල කරනු ලැබූ ආඥාවක් මගින් මේ පනතේ කාර්යයන් සඳහා බැංකුවක් ලෙස ප්‍රකාශිත අන්කිසි පුද්ගලයෙක් හෝ පුද්ගල මණ්ඩලයක් අදහස් වේ.

"මූලික සමිතිය" යන්නෙන් 3 වගන්තියේ (ආ) ඡේදයේ සඳහන් යම් අරමුණක් ඇතිව හෝ යම් කාර්යයක් සඳහා පිහිටුවන යම් සමිතියක් නොවන ලියාපදිංචි කළ සමිතියක් අදහස් වේ.

"රීති" යන්නෙන් මේ ප්‍රඥප්තිය යටතේ පනවනු ලැබූ හෝ පනවනු ලැබූ ලෙස සලකන රීති අදහස් වේ.

"රජයේ අරමුදල්" යන්නෙන් ආණ්ඩුව විසින් දෙනු ලබන ණය, අත්තිකාරම් සහ ප්‍රදාන අදහස් වන අතර, ප්‍රඥප්තියේ 42 වන, 57 වන, 59 වන සහ 63 වන වගන්තිවල සඳහන් අරමුදල්වලින් දෙනු ලබන ණය ප්‍රදානයක් හෝ අත්තිකාරමක් ඊට ඇතුළත් වේ. මෙම සියලු ගනුදෙනු රජයේ විගණකාධිපතිවරයා ගේ අරමුදල් යටතේ සිදුකරනු ලබන විගණනයට යටත් විය යුතුය.

"රෙජිස්ට්‍රාර්" යන්නෙන් මේ ප්‍රඥප්තිය යටතේ මධ්‍යම පළාතේ පළාත් සභාවේ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයකුගේ යුතුකම් ඉටු කිරීම සඳහා පත් කරන ලද තැනැත්තෙක් අදහස් වේ.

"කොමසාරිස් "යන්නෙන් මෙම ප්‍රඥප්තිය යටතේ මධ්‍යම පළාත් සභාවේ සමුපකාර සමිති කොමසාරිස්වරයෙකුගේ යුතුකම් ඉටු කිරීම සඳහා පත් කරන ලද තැනැත්තෙක් අදහස් වේ.

"ලියාපදිංචි කල සමිතිය" යන්නෙන් මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබූ හෝ ලියාපදිංචි කරනු ලැබූ ලෙස සැළකෙන සමිතියක් අදහස් වේ.

"සාමාජිකයා" යන්නට මෙම ප්‍රඥප්තියේ 3 (ආ) උපවගන්තියේ විධිවිධානවලට යටත්ව සමිතියක් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කිරීමට සහභාගීවන්නාවූ හෝ, ලියාපදිංචි කරනු ලැබීමෙන් පසු රීති හා අතුරු ව්‍යවස්ථා අනුව සාමාජිකත්වයට ඇතුළත් කරගන්නා ලද්දා වූ, වෙනත් කිසියම් නීතියක් යටතේ ලියාපදිංචි කිරීමෙන් නෛතික පුද්ගලභාවයක් නොලැබූ තැනැත්තෙක් අදහස් වේ.

"මහසභා නියෝජිතයන්" යන්නෙන් අදහස් වන්නේ ලියාපදිංචි සමුපකාර සමිතියක අතුරු ව්‍යවස්ථාවලින් හඳුන්වනු ලබන නියෝජිතයන් වේ.

"අමාත්‍යවරයා" යන්නෙන් මේ පනත යටතේ මධ්‍යම පළාතේ සමුපකාර සංවර්ධන විෂය භාර ඇමතිවරයාගේ යුතුකම් ඉටු කිරීම සඳහා පත් කරන ලද තැනැත්තෙක් අදහස් කෙරේ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.